වසර 2500 පසු
මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

## සත්‍ය ධර්මය අවදි විය

(එකොළොස්වෙනි වෙළුම)

# අභිඥා ඥානයට හසුවන

## පරම සත්‍ය - 03

- -

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටාගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

## අභිඥා ඥානයට හසුවන පරම සත්‍ය - 03

**බුද්ධෝත්පාද ධර්ම දේශනා ශ්‍රවණයට**

Buddothpado Youtube Channel

1. Buddothpado - https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse - https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado  Unity - https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English - https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
   https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
   https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
   https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
   https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
   https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana -
    https://youtube.com/@BuddothpadoTVdammaDesana

**අන්තර්ජාල ශ්‍රවණයට** - website
www.buddhothpada.com / www.buddothpado.lk

---

**බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2023 අගෝස්තු**

---

**ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්**
E-mail : buddothpado@gmail.com
Tel. : +94 703 518 747

---

පරිගණක මුද්‍රණ සැකසුම හා මුද්‍රණය
**Vishan Print House & Book Shop**
197, වක්වැල්ල පාර, ගාල්ල.
දුරකථන : 091 224 7940

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාකෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිත ද මායාවක් වන තැන සිතේ මායාවෙන් මිදුන තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ථ බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුල සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ, මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් **ඉදප්පච්චතාවයයි.** එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්වභාවයයි. දෙයක් නැති තැන **චේතෝවිමුක්තියයි.** එනම්

අනිමිත්ත ශූන්‍යත, අප්ප්‍රනීත **චේතොවිමුක්තියයි.** ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවයටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

**''නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ''**

පහන නිවී ගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

**විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං**
**එත්ථ ආපෝච පඨව ච - තේජෝ වායෝ න ගාධති**
**එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති**
**විඤ්ඤස්ස නිරෝධෙන - ඒත්තෙ තං උපරුජ්ජන්ති**

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**- බුද්ධෝත්පාද ආර්යන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්, නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධුරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධුරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍ය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**- අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

# පුණ්‍යානුමෝදනාව

මේ උතුම් ධර්ම දානයට

දායක වූ සියලු දනන් හට,

මෙතුළින් ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය,

බුද්ධෝත්පාදයෙන් විවර වූ උතුම්

ශ්‍රී සද්ධර්මය කන්වැකීමටත්, අවබෝධ වීමටත්

සංසාර දුකින් මිදී

නිවන් සැනසීම ලබන්නටත් හේතු වේවා !

# පිදුම

කාලයේ වැලි තලාවෙන් සැඟව ගිය
ඒ උතුම් ශ්‍රී සද්ධර්මය
අතැඹුලක් කොට,
අවිද්‍යා ලොවම දෙදරවමින්
සත්‍යයේ දෝංකාරය තුළ
ආත්මය හැර දමා
සසර පුරුද්දට ආ ගමනේ අවසන
මරණයක් නැති ලෝකයට
මොහොතට අවදියෙන්
සිතෙන් මිදෙමින්
නිස්සරණ මග ඇවිද යන්නට
මං විවර කළ
බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේට
උපහාරයක් ම වේවා !



# පටුන


| | | |
|---|---|---|
| 06. | නාම රූප පරිච්ඡේද ඥාණය චිත්ත විසුද්ධිය | 1 |
| 07. | සිතිවිලි සත්‍යයක් නොවේ සංඛාර උපේක්ෂා ඥාණය | 17 |
| 08. | සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ච කරතත්ථය සංඛාර උපේක්ඛා ගුණය | 34 |
| 09. | පෙර නොඇසූ විරු දහම | 50 |
| 10. | තංඛාවිතරණ විශුද්ධිය | 69 |

# ★ 6 වෙනි පරිච්ඡේදය ★

# නාමරූප පරිච්ඡේද ඥාණය
# චිත්ත විසුද්ධිය

දැන් කරන්ට් එකක් වුණත් නෙගටිව් පොසිටිව් නෙගටිව් පොසිටිව් එතන ධන සෘණ (+ -) යනව නේ දිගට. එතකොට මැද්දේ ශූන්‍යතාවයක් තියෙනව නේ. emptiness එකකුත් තියෙනව. හිස්තැනක් තියෙනව. මොකද ධන සෘණ කියන්නෙ නොගැලපෙන 2ක්. නොගැලපෙන 2ක් තිබුණොත් මැද්දෙ තියෙනව අනිවාර්යයෙන්ම නොගැලපෙන දෙක ස්පාක් වන තැන. emptiness ඒක තමයි ශක්ති ස්වභාවය. ඒක තමයි විඤ්ඤාණය කියන්නෙ. සිත කියන්නෙ දැනගන්න එක. ඒකම තමයි චිත්ත නියාමය. දැන් අපි මෙතන බයිසිකල් ඩයිනමෝව උපමාව තමයි ගත්තෙ. බයිසිකල් ඩයිනමෝවෙ චුම්භකයක් තියෙනව. ඒක අපි අර පොඩි කාලෙ දැක්ක බයිසිකලේ. දැන් බයිසිකලේ ඒක නෑ නේ. එතකොට ඉයිනමෝව කැරකෙනව රෝද දෙක තද කලහම. එතකොට චුම්භකය කැරකෙනව ධන සෘණ කියල අංශ 2 නොගැලපෙන අංශ 2ක් කැරකෙනව. එතකොට ඒ නොගැලපෙන අංශ 2 තුළ ඒ කැරකීම තුල නේද මේ වේගයක් තුල නේද මේ විද්‍යුතය උපදින්නේ. හොඳට බලන්න. ධනයි සෘණයි නොගැලපෙන අංශු 2ක් එකට කැරකෙන කොට ඒ නොගැලපෙන ස්වභාව දෙක තුල ස්පාක් එකක් නේද අපි දකින්නේ. මේ කරන්ට් එක කියල. ඒ කියන්නෙ දැන් චුම්භකය කැරකෙන කොට ඔතන රතු නිල් වයර් 2ක් ගෙනියනව නේ. ගෙනහල්ල ඕක ලයිට් එකට දැම්මහම ලයිට් එක පත්තු වෙනව නේ. එතකොට කරන්ට්

එක කියල එන්නෙ නෙගටිව් පොසිටිව් වයර් 2කින් නේ. එතකොට වයර් 2 ධන සෘණ නේ යන්නෙ. එතකොට නොගැලපෙන දෙකක් ස්පාක් වුණහම නේද මේ ලයිට් එක පත්තු වෙන්නෙ. දැන් ඔබට තේරෙන්නෙ නැද්ද චුම්භකය නොගැලපෙන අංශු දෙක කැරකුනහම ශක්තිය උපදිනව කියල. ඕක ඇත්තට ම කිව්වොත් පෘථිවියෙන් සිද්ධ වෙනව. ඒ කියන්නෙ මේ චුම්භක ශක්තිය කියන එක පෘථිවියේ මේ ගලක් උඩ දැම්මහම බිම වැටෙන්නෙ මේ පෘථිවියේ අංශ 2 දෙපැත්තෙ කැරකීම තුළමයි එකක් ඉපදිච්ච එකක්. කොහෙවත් තියෙන එකක් නෙමෙයි. මේ කැරකීම තුළම මේ අංශ 2ක් ධන සෘණ කියල හැදිච්ච එකක්. වේගයක් තුළයි මෙය සිද්ධ වෙන්නෙ. ඒ වේගයක් තුළ තමයි ඒ අංශු 2 හැදිල තියෙන්නෙ. නෝත් සවුත් (North South) ධන සෘණ කියල ඒකම තමයි මුළු පෘථිවියම චුම්භකයක්. මුලු පෘථිවියම කැරකෙන කොට ධන සෘණ 2 කැරකෙන කොට ගුරුත්වාකර්ශනයට මේක කොටු වෙලා. මේක ඇතුලෙ බෝලයක් වගේ පෘථිවිය ඇතුලෙ අර ඕසෝන් ස්ථරය කියල හැදිල තියෙන්නෙ. ඇතුලෙ තියෙන ඒව ඒක ඇතුලෙම හිර වෙලා තියෙනව. කැරකීම තුළයි මේක සිද්ධ වෙන්නෙ. මේක වේගයක් තුලය සිද්ධ වෙන්නෙ. වේගය තමයි ඕජා කියන්නෙ. මේකම තමයි සිත හැදෙන්න සංසිද්ධිය ස්වභාවිකව හැමතැනම තියෙනව. දැන් කරන්ට් එක ඇති වෙල තියෙන්නෙත් එහෙමයි. කරන්ට් එක විතරක් නෙමෙයි චුම්භක ශක්තිය විදුලි ශක්තිය ඒ විතරක් නෙමෙයි. දැන් ඔය දැන් කතා කරන හැම ශක්තියක් ම ස්වභාවයකම අංශු 2ක් ස්පාක් මැද්දෙ තියෙනව ශූන්‍යතාවය. ඒ ශූන්‍යතාවය තමයි පරමාණුව කියන එකෙත් තියෙන්නෙ. න්‍යෂ්ටිය ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන නේ ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන 2 පිපිරුවොත් දැන් කැඩුවොත් මොකද වෙන්නෙ. ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන මේ 2 මැද ශූන්‍යතාවයටය. එලියට සෘණ ශූන්‍යතාවය තමයි ශක්තිය කියන්නෙ. ඒක තමයි පරමාණු බෝම්බය

හැදෙන්නෙ. ඒකෙ විශාල ශක්තියක් උපදින්නෙ කොහොමද. මේකෙ තියෙනව ලොකු කතාවක්. දැන් මේකමයි චිත්ත ශක්තිය කියන්නෙ. දැන් අපි ශරීරය තුල අපි සාමාන්‍යයෙන් අපේ ශරීරයෙන් යම්කිසි කරන්ට් එකක් තියෙනව නේ. ඒක සිතුවිලිත් එක්කයි තියෙන්නෙ. සිතුවිලිත් එක්ක ශක්තියක් උපදිනව. දැන් මේක සිතුවිලි කියල ආත්මීය දෙයකින් දකින්න එපා. සවිඤ්ඤානක මනසකින් දකින්න එපා. අවිඤ්ඤාණක මනසටය අහුවෙන්නෙ. ඒ කියන්නෙ මේක ආත්මීය කතාවක් නෙමෙයි. ආත්මීය කතාව දෘෂ්ඨියක් ඒක ඇතුලෙ හැදිච්ච එකක්. ඒ කියන්නෙ මෙතන බාහිර තියෙනව කියන එකයි. අපේ තියෙන දෘෂ්ඨීය. බාහිර තියෙනව. තියෙනව කියනකොටම අපට උපදිනව මේ පැත්තෙන් ඒක තියෙනව කියන්නෙ නැති එකක්. නැති එකක් තමයි අපි හැම තිස්සෙම තියෙනව කියන්නෙ. තියෙනව කියල එකක් නෑ. ඔන්න ඔතනයි මේකෙ රහස තියෙන්නෙ. ශක්තිය උපදින්නෙ තියෙනව කියපු ගමන්. කවදාවත් තියෙනව කියල එකක් මේ ලෝකෙ නැහැ. ඒකයි සියල්ල අනිත්‍යය කියන්නෙ. ඒ කියන්නෙ මේ සිතත් ඔතනමයි හට ගන්නෙ. සිතේ කතාවමය තියෙන්නෙ. ඒ කියන්නෙ මේ චිත්ත ශක්තියක් උපදින්නෙ. ඒක ස්වභාවික සංසිද්ධියක්. ඒ තියෙනව කියන එක කවුරු හරි අතහැරියොත් ඒ ආත්මීය දෘෂ්ටිය බිඳ වැටෙනව. එතකොට ස්පාක් එක නවතිනව. එතකොට මේක නැවත සකස් වන ශක්තිය නැති වෙනව. ඔබ දැන් කණ්ණාඩික් කියල හිතන්න. ඇහැ කණ්ණාඩියක්. දැන් කණ්ණාඩියට වැටෙනව දැන් මේ එලියෙ තියෙන ඒව සේරම ඔබේ ඇසත් කණ්ණාඩියක්. දැන් ඔබ මේ පැත්ත කරකවන කොට මේ සේරම වැටෙනව. දැන් කණ්ණාඩිය ඇතුලෙ කවුරුත් ඉන්නවද දැන් කණ්ණාඩිය ඇතුලෙ මුකුත් තියෙනවද දැන් ඔබේ ඇහැ ඇතුලෙ ඔබ හිතන්නෙ මුකුත් තියෙනවද නෑ. මෙච්චරය සිද්ධ වෙන්නෙ. මේ වැටෙන එකට ස්පාක් එකක් තුල ශක්තියක් උපදිල තියෙනව. ඒක තියෙනව කියන

ශක්තිය. ඒක ශක්ති ස්වභාවයක්. ඒක කරන්ට් එකක්. ඒක තමයි විඤ්ඤාණ ශක්තිය කියන්නෙ. ඒක උපදින එකක්. හටගන්න ධර්මයෝ. ඒක හැමදාම පෙන්වන්නෙ සකස් වන එකක් සංඛත අසංඛතයක් නෙවෙයි. සංඛතයක් සකස් වන එකක්. එතන එතන සකස් වෙනවනැති වෙනව. ඒක තියෙන එකක් නෙමෙයි. දැන් මෙතන ස්පාක් වෙනව. ස්පාක් එක තමයි. දැන් මෙතන අපි මෙච්චර කතා කරන්න හේතුව. මෙච්චර රූප කලාප ගැන වුණත් මෙච්චර කතා කරන්න හේතුවක් තියෙනව. මොකද මෙතන හැම තැනම තියෙන්නෙ එකම ස්වභාවයක්. මේ අංශුවල අංශු කියල ගත්තොත්. අංශු නෙවෙයි තියෙන්නෙ. ශක්තියක් තියෙන්නෙ. දැන් පෘථිවිය සම්පූර්ණයෙන් ම අලුවෙලා ගියා කියමු. නැති වෙලා ගියා කියමු. ශක්තිය නේ තියෙන්නෙ. අවකාශෙ අභ්‍යවකාසෙ තියෙන එකම ශක්ති ස්වභාවය නේ. ඕක ඝණ වෙලා නේ පෘථිවියක් හැදිල තියෙන්නෙ. පඨකයක් හැදෙන්නෙ එහෙම නේ. පඨවියක් හැදෙන්න ඕකම තමයි. පෘථිවියක් කියල දෙයක්වත් ගන කියල දෙයක්වත් මොකක්වත් නෑ. ඔක්කොම නම් අපි හදාගත්ත ඒව. එහෙම ඒව නෑ. සේරම පඨවි පඨවිමයි. ඝණ නම් ඝණ ද්‍රව නම් ද්‍රව වායු නම් වායු මේකෙ තියෙන්න. ''සම්භූතං'' සත්‍ය වන එකක්. එකම ශක්ති ස්වභාවයක්. ශක්ති ස්වභාවය ඝණ වෙලා තියෙන්නෙ. තියෙන දෙයක් නෑ. ශක්තියක් විතරයි. ඒක දකින්න අමාරුයි. මේක අපි දැන් දකින්න පුලුවන් එකක් නෙමෙයි. මේ ඇත්ත යථාර්ථය දකිනව කියන එක ඇවිල්ල සත්‍ය දකිනව කියන එක ඇවිල්ල හිතන්න දැන් බුදුන් වහන්සේ වුණත් මේ සත්‍ය අවබෝධ කරගෙන මේ මිනිසුන්ට තේරෙයි ද කියල හිතන්නෙ ඇයි. මේක තේරෙන්නෙ නෑ කාටවත්. මේක හිතකට හිතන්න බෑ. හිතන් නැති බව හිතකට කොහොමද හිතන්නෙ. හිතක් නෑ. හිතක් කියල දෙයක් නෑ. ඒ නැති බව කොහොමද හිතන්නෙ. දැන් ඒක අවබෝධ වුණාට පස්සෙ මරණය ඒව මේව ඒවත් සිතුවිලි විතරයි නේ. එහෙම ඒව නෑ.

මේ ''ස්පාක්'' එක දකින්න ඕන. මේ ස්පාක් වීම ගොඩක් වෙලා ස්පාක් වෙලා. ස්පාක් වෙලා. ඔන්න ඕක තමයි චිත්තය කියන්නෙ. ඒ එක එක හැඩතල ස්පාක්වීමකින් තමයි අපි මේ විඳවන්නෙ. ඒ හැම එකක් ම ස්පාක් වෙන්නෙ. මෙතන තියෙනව කියන ස්වභාවය අපේ ස්පාක් එක බාහිර තියෙනව කියල හිතනව. මෙතන ඇත්තට ම චිත්ත ස්වභාවය අවබෝධ වෙනව. මෙහෙම කිය කිය යනකොට. ඒ කියන්නෙ ''ස්පාක්'' එක මේ ගහ කියන එකත් එහෙම එකක් නෙමෙයි. ශබ්දයක් තියෙන්නෙ මෙතන. දැන් පුංචි දරුවට මුකුත් නෑ කිව්ව. ප්‍රභවය. එහෙම දේවල් නැහැ කිව්ව. පුංචි දරුව ඉපදෙනකොට ''ප්‍රභාෂ්වරං චිත්තං'' කිව්ව ''ප්‍රභාෂ්වරං චිත්තං'' වල කිසිම නමක් නැහැ. ඉර තියෙනවද හඳ තියෙනවද පොඩි ළමය මුකුත් දන්නෙ නෑ. කහ පාට රතුපාට ඔය කතන්දර මොකක්වත් එතන නෑ. ඉපදෙන කොට ඔය කාගෙවත් ගාව නෑ. පුංචි දරුවගෙ සිතක මුල් අවස්ථාව emptiness. ඒ කියන්නෙ ප්‍රභාෂ්වරය. මුකුත් නෑ. හැබැයි ශබ්ද එකතු වෙනව. ඊට පස්සෙ. සමහර විට හැඩතල ශබ්ද එකතු වීම තමයි මෙතන සිද්ධ වෙන්නෙ. දැන් අර අම්මගෙ හැඩතලය එතකොට මා මා මා ගාල අන්තිමට ඒක බාහිරින් එන ශබ්දයට මෙහෙන් ප්‍රතිකම්පනයක් තමයි මේ ස්වරාලයෙන් පිට වෙන කොට සිද්ධ වෙන්නෙ. අහසෙ විදුලි කොටන කොට මෙහේ ජනෙල් හෙල්ලෙන්නෙ කොහොමද. මෙතන ප්‍රතිකම්පනයක් නේ සිද්ධ වෙන්නෙ. මෙන්න මේ අහසෙ විදුලි කොටනකොට මේ ජනෙල් හෙල්ලෙන එකම තමයි බාහිරින් අම්මගෙ හැඩතලය එතකොට මා, මා, මා කියල මේ ස්වරාලයෙන් මා කියන එක කියවෙන කොට ඔය 2 ඒ ශබ්ද මේ ශබ්දය වෙනව. ඒ ශබ්දය මේ ශබ්දය වෙනව. බාහිර තියෙන ශබ්දය මේ ශබ්දය. ඇත්තට ම පොඩි එක්කෙනාට වෙන්නෙ ප්‍රති කම්පනයක්, ප්‍රතිකම්පනය තමයි සිත කියන්නෙ. මේ ඔක්කොම මිලියන ට්‍රිලියන් ගණනක ප්‍රතිකම්පන. ශබ්ද අපි සිත කියන්නෙ. සිත කියල දෙයක් නෑ.

බාහිර ඒ හැම ශබ්දයක්ම මේ හැඩතල ශබ්ද ගැට ගැහිල තියෙන්නෙ. එහෙම ගැට ගැහිල තමයි අපට කියන්න වෙන්නෙ. එතන එතන ඒ ශබ්දයට මේ එතන එතන තියෙන ස්කන්ධ තමයි ශබ්ද. ශබ්දය ඔක්කොම එකට තියෙන්නෙ. මෙතන ස්කන්ධ ටික හැඩතල එතකොට ශබ්දෙන් එනව එතකොට. ශබ්ද ආවොත් ඒ ස්කන්ධ ටික එනව. ශබ්දය ස්කන්ධය එකට එනව. මේව එහෙම තමයි කියන්න වෙන්නෙ. පුංචි පුංචි අඩුපාඩු තියෙයි. ඔබට සකස් කර ගන්න පුලුවන්. නමුත් මේ සිත කියල දෙයක් නෑ. මේක ස්පන්දනයක් කීවෙ ඒකයි. ස්පන්දනය කියන වචනය පාලි භාෂාවෙ අපි දැකල නෑ. ඒක පාවිච්චි කරනව. නමුත් අපට මේ වගේ ස්වභාවයක් ස්පාක් එකක් ස්පන්දනයක් වගේ එකක් මේ නූතන භාෂිතය තුල පෙන්වන්න පුලුවන්. මෙහෙම දෙයක් සිද්ධ වෙනව කියල. ඒක මේ රූප කලාප පැත්තෙන් ගත්තහම මේකෙ හොඳට පේනව. ශුද්ධාෂ්ටකය කියල කියන කොට හොඳට පේනව. එකම ස්වභාවයය තියෙන්නෙ කියල පෙන්වන්නෙ ශුද්ධාෂ්ටකය එකම ස්වභාවයයි හැම තැනම. ශබ්දය කියල ආලෝකය කියල වර්ණය කියල ගන්ධය කියල වෙන් කරන්න ඒව නෑ. එකම ශුද්ධාෂ්ටකයක්. එකම ශක්ති ස්වභාවයක් අපට වෙන් කරන්න ගත්තට එහෙම එකක් නෑ. ශුද්ධාෂ්ටකය හොඳට බැලුවම ඒක පේනව. රූප කලාප කියල ගත්තම හොඳට පේනව. ඔක්කොම එකමය. පුංචි පුංචි ස්වභාවයේ වෙනස්කම් ටිකක් තමයි එකතු වෙවි එන්නෙ. ඒ ස්වභාවවල එකතු වීමක් තමයි අන්තිමට මෙතන දී දැන් සංඛාර කියල එකක් බාහිර නෑ. සංඛාර කියන්නා මේ භෞතිකව ඒව එකක්වත් නෑ. මේ සේරම චිත්ත ස්වභාවයන්. සංඛාර කියල එකක් බාහිර නෑ. චේතනාව ඇතුලෙ සංඛාර කියනව. ඊටත් වැඩිය ගැඹුරු පැත්තකින් අපි මේ අභිඥාවෙන් පෙන්වනව කියල කාරණා දෙන්නෙ. ඒ සත්‍යමය දෙන්නෙ. පරම සත්‍යමය දෙන්නෙ. ඒක ආත්මීය පැත්තකින් නෙවෙය දෙන්නෙ. ආත්මීය සිතකට දකින්න බෑ

කිව්වෙ ඒකයි. මේක සවිඤ්ඤාණක මනසකට දකින්න බෑ කිව්වෙ ඒකයි. මේක දකින්න අවිඤ්ඤානක මනසකින් දකින විදියට. දැන් සිතක් කියල දෙයක් නෑ කියල ආත්මයක් කියල දෙයක් නෑ කියල දැන් ඔබ ධර්මය තුළ වචන ඔබ අහනව. ''රූපං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ'' එතකොට රූපය කියල දෙයක් නැහැ කියල එතකොට ඔබ ඒ වගේම ඔබ අහනව ''නේතං මම නෙසෝ නමස්මිං නමේසෝ අත්‍ථා'' ''මම මගේ, මගේ ආත්මය'' කියල දෙයක් නෑ කියල. එතකොට ''නේතං මම නේසෝ හමස්මි නතමේසෝ අත්‍ථා'' කියන තැන එතකොට මම කියල දෙයක් නෑ. මගේ කියල දෙයක් නෑ. මගේ ආත්මය කියල දෙයක් නෑ. එතකොට මේ හැම තැනම එකම කතාව තමයි මේ ඔබට ඔය ඇහෙන්නෙ. ඒකයි ''රූපං'' මෙතන හැමතිස්සෙම කියවෙන්නෙ එකම දෙයක් තමයි. මෙතන එහෙම දෙයක් නෑ. මේ රූපය පවා පජානාති කියන්නෙ සත්‍ය ධර්මය දකින්න ඕන. දකින්නෙ රූපයක් තියෙන බව නොවේ. ඒකයි විනෙය්‍ය ලෝකේ කියල කියන්නෙ. ලෝකයක් තියෙන බව නොවෙයි. ඒකයි ''විනෙය්‍ය ලෝකේ අභිඤ්ඤා දෝමනස්සංනං'' කිව්වෙ ලෝකය නැති බවය දකින්නෙ. ලෝකයක් නෑ, දැන් ලෝකයක් අපේ සිතේ නේ මැවෙන්නෙ. දැන් ඉර තියෙන්නෙ අපේ හිතේ නේ. හඳ තියෙන්නෙ අපේ හිතේ නේ. සේරම අපි හිතින් නේ දන්නෙ දැන් ඇස් පේන්නෙ නැති කෙනාට පාට කතාවක් නෑනේ. අන්ධයාට එහෙම පාට කතාවක් නෑනේ. එතකොට ඇසටය එහෙම වර්ණ ලෝකයක් නැහැනේ. එතකොට බිහිරි එක්කෙනාටත් එහෙම ශබ්ද ලෝකයක් නැහැනේ. එහෙම ශබ්ද කතාවක් නෑනේ. එතකොට මේ වගේ සේරම අපේ සිතුවිලි තියෙන්නෙ. සිතකය ලෝකය මැවෙන්නෙ. දැන් මේ ලෝකෙ ජනගහණය ඉන්නව කියමු කෝටි 800 ක්. ඒ 800 ම තමන්ගෙ සිත්වල ලෝක මැවෙනව. එක් එක්කෙනාගෙ සිත් වල ලෝක මැවෙනව. එළියෙ තියෙන එකක් නෑ. එළියෙ තියෙන්නෙ

එකම ස්වභාවයක්. ඒ ස්වභාවය එතනමයි. අපි තමයි මේ වෙන් කරල දකින්න. මේ වෙන් කරල දැකීම තුළ වෙන් කරල මෙහෙම කටයුතු කරනව. මේක අතිගාම්භිරය. අති ගැඹුරුය. මේක ස් කියන්නෙ සතර මහා භූතවල ගහක්ද පොල් ගහක් ද අඹ ගහක්ද ඔය නම් ඇවිල්ල අපි ගේ දාල තියෙන්නෙ. එලියෙ තියෙන්නෙ සතර මහා භූත විතරයි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, අලියෙක් ආවොත් ඔක්කොම පාගගෙන යනව. එහෙම දේවල් නෑ. ඔක්කොම මැටි නම් ඔක්කොම මැටි. මේක කලේද මුට්ටිය ද ඇතිලිය ද ඒව කතා නෑ. මේක ගෙයක් ද අරක තාප්පයක් ද ඔය කතා නෑ. ඔක්කොම ගල් වැලි සිමෙන්ති වගේ තමයි. ඔක්කොම ඇවිල්ල එකම ස්වභාවයක් කියල දකින විට ඝන, ද්‍රව, වායු වලටත් වැඩිය ශක්ති ස්වභාවයෙන් පේනව. ඝන, ද්‍රව, වායු කියල දේකුත් නෑ. ඒවාගේ ශක්ති ස්වභාවයෙන් ම දකිනව. එතකොට ඒ විදියට ම සිත හැදෙන හැටි තමයි නාමය පැත්තට දකින කොට මේ තරම් ගැඹුරට යන්නෙ නැහැ. අපි ගොඩක් ගැඹුරට ගිහින් පෙන්නුවෙ. ඒ තරම් ගැඹුරට යන්නෙ නැතුව මේක දකින්න පුලුවන්. ඇත්තටම මේ සිතින් හදාගෙන බලන එකක් තියෙන්නෙ. ඒක තමයි පෙන්වන්නෙ ධර්මය තුල ධර්ම කාරණා පෙන්වන කොට අපි, පේනව නෙමෙයි හිතනව. ඉතින් ඔතනම තමයි ඇත්තට ම මේ බාහිරින් මිදෙනව බාහිර තියෙන ලෝකයක් නෙවෙයි. අපේ සිත ඇතුලෙ දෙයක් හදාගෙන සලායතන ලෝකෝ සලායතන ලෝකයක් හදාගෙන ඉන්නෙ. ඉතින් ඒක හැදෙන හැටි තමයි ඔය දිගට ම පැහැදිලි කරගෙන ආවෙ. ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ සැබැවින්ම දකිනව බාහිර දේ ඇත්තක් නෙවෙයි කියල. ඒ වගේම දකිනව සිතත් සත්‍ය නොවෙයි කියල. මේ හදාගන්න පොත එන අරමුණ සිතට එන අරමුණ නේ සිත කියන්නෙ. අරමුණ එතකොටම බාහිර නෙමෙයි කියල දකිනව. අරමුණටම එන එන අරමුණේ සත්‍ය දකිනව කියන්නෙ එන එන අරමුණට දකිනව මේ තමන්ගෙ

සිතමයි කියල. බාහිර නෙමෙයි කියල දකිනව. සත්‍ය දකිනව. සත්‍ය දකිනව කියන්නෙ දැන් එන හැඩතලය බාහිර පොත, අපි දැන් එතකොටම කියනව නේ පොතක් මේ මේසයක් ඔහොමනේ අපි කියන්නෙ. මේසයක් පොතක් අරමුණ එතකොටම අපිට පේනකොට ම අපි නම කියනව නේ. නමුත් සත්‍ය දකින එක්කෙනාට දකිනව බාහිර එහෙම නෙමෙයි මේ පොත් තියන්නෙ අපි නේ. අපි හිතන දෙයක් තියෙනව. පේනව නෙමෙයි. හිතනව. හැම එකම සිතනව සිතුවිලි චිත්ත රූපයක්. හැම එකම චිත්ත. චිත්ත රූපයක් කියන්නෙ හැම එකක්ම හිතනව. දැන් ඔබට ඒක අත්දැකීමක් බවට පත් වෙනව ප්‍රායෝගිකව ඔබටම ඔබ තුලින් ම දැක්කොත් ඔබ යමක් දිහා බලන කොට බලන දේ තමයි දන්නෙ. එතන තියෙන අනිත් දේ ඔබට පේන් නෑ. ඔබ දැන් ගහක් දිහා බලන් හිටියොත් උඩ බැලුවොත් යට පේන්නෙ නෑ. ඔබ එතන ඉන්න කුරුල්ලෙක් දිහා බැලුවොත් එතන ඉන්න අනිත් සත්තු පේන්නෙ නෑ. එතකොට ඔබ හිතන දේ තමයි පේන්නෙ. හිතන දේ තමයි පේනව කියන්නෙ. ඔබ හිතනව. පේනව නෙවෙයි. හිතනව. ඒ කියන්නෙ නාමයක් හැම තිස්සෙම හිතන්නෙ. ශබ්දයක් කියන්නේ ඕජා රූපයක්. ඕජා රූපයයි ඍතු රූපයයි ගැටගැහිලා තියෙන්නෙ. ඒව රූප කලාප වලින් පෙන්වන කොට ශුද්ධාෂ්ටකයෙන් පෙන්වන කොට හොඳට පේනව. ඍතු රූපයි ඕජා රූපයි ඔක්කොම මෙතන භාව රූප සේරම මෙතන පේන කෙනාට පේනව. රූප දකින්න ගත්තට පස්සෙ රූපය ''පජානාති'' කියන්නෙ ඔක්කොම දකිනව මේ සේරම සමථයානිකය තමයි ඒ විදියට දකින්නෙ ශුෂ්කයානිකයාට කෙලින්ම පේනව මේ සිතත් එහෙම දෙයක් නෑ කියල. බාහිරත් එහෙම දෙයක් නෑ. අපි මේ සේරම ස්පන්දයක් තියෙන්නෙ. ඒ කියන්නෙ අපි කියන්නෙ ''ස්පාක්'' එකක් එතනම ''ස්පාක්'' වෙලා නැති වෙනව. නමුත් මේ වේගයක් තුල තමයි දැන් මෙහෙම කිව්වොත් බඹරයක් කැරකෙනව. බඹරය කැරකෙනකොට මේ

බඹරය වේගයෙන් ම කැරකෙනව නේ. දැන් වැල්ලෙ බඹරයක් කැරකෙනව කියන්නෙ කවුරුවත් කරකවනව නෙමෙයිනේ. පොඩ්ඩක් කැරකුවම ඒකෙන් ම වේගයක් අරගෙන කැරකෙනව. අන්න එහෙම දෙයක් මෙතන සිද්ධ වෙනව. ඒ කියන්නෙ දැන් මෙතන ස්පාක් එක, දැන් මේ ස්පාක් එක එතනින් ඉවර වෙනව නම් හරි නේ. නමුත් මෙතන සිද්ධ වෙනව වෙනින් ම ස්වභාවයක කතාවක්. ඒ කියන්නෙ මෙතන ඔබ දැන් ඉරිසියාව වෛරය ද්වේශය දැන් මේව එන්නෙ කොහොමද. අන්න එතන බලන කොට මෙතන තව කතාවක් තියෙනව. ඒ කියන්නෙ මෙතන දැන් බාහිර ඇත්තක් නොවෙයි. ඇත්ත දකින කෙනා දකිනව නේ බාහිර ඇත්තක් නෙවෙයි. සිතක් ඇත්තක් නෙවෙයි. මිදුණ තැනත් ශුන්‍යයි. නමුත් දැන් එහෙම නෙමෙයි නේ. දැන් සාමාන්‍ය කෙනෙක් බාහිර ඇත්ත වෙලා. තමනුත් ඇත්ත වෙලා මේ මම ඉන්නව. මේ බාහිර දෙයක් තියෙනව. අනේ ඒක කැඩුණ. අපරාදෙ අනේ එයා මැරුණ මට දුකයි. දැන් මෙයාට තියෙනව කම්පනයක් මෙයා දුක් විඳින්නෙ අඬන්නෙ මේව ඇත් වෙල. මෙයා දුක් විඳිනව. දැන් මෙයාට මෙතන වෙනින් ම ස්වභාවයක් ඉස්මතු වෙනව. ඒ ස්වභාවය තමයි ඇත්තට ම නැවත සකස් වෙන්න හේතු වෙන්නෙ. ඒකයි මෙයාට මරණයක් තියෙනව. එයා හිතනව මම මැරෙනව. මේ ලෝකෙ තියෙනව. ලෝකෙ තියෙද්දි මම යනව. ලෝකෙ තියෙද්දි මට යන්න බෑ දුකයි. එයාට තියෙනව සසරක්. එයා සංසාරයක් යනව. මේ සිත ඉපිද නිරුද්ධ වෙන කොට ඊගාවට සිත උපදින ශක්තිය හැදිල ඉවරයි. එතන ශක්ති ස්වභාවයක් උපදිනවා. ඒක ශක්ති ස්වභාවය උපදින ස්වභාවය හැදිල ඉවරය. ඒ තුල එයාගෙ ශරීරය පොළවට පස් වුණත් නැවත සකස් වෙනව කොහේ හරි. අර ශක්ති ස්වභාවය, ඇත්තට ම කිව්වොත් මේකෙ මෙන්න මෙහෙම දෙයක් තියෙනව. ශුද්ධාෂ්ටකය ගැන කියන කොට කියනව නේ මේ සේරම ශුද්ධාෂ්ටකයක් නේ ඔක්කොම ශුද්ධාෂ්ටක

නේ එකම ශක්ති ස්වභාවයක් නේ. එහෙනම් ඔබ ශරීරය පොළවට සිතට දැන් වැඩ කරන්න බෑ නෙ ඒ කියන්නෙ අවසාන හුස්ම බිංදුව ගියාත් කියමු. හුස්ම බිංදුව ගියත් එක්කම ශක්ති ස්වභාවය සකස් වෙනව. නැවත ඒ කියන්නෙ මේ සිත සකස් වෙනව නේ. තව සිතක් ඊගාවට සකස් වෙනව නේ. ඊගාවට නව සිතක් සකස් වෙනව නේ. දැන් මේ සකස් වන සකස් වන සිතේ වේගයක් තුළ දැන් බලන්නකෝ වේගයක් තුල මේ කතාව කියනව නම් දැන් මේක ගිණි වලල්ලක කතාවක්. ගිනි වලල්ලක් ගිනි බෝලයක් කරකවන කොට ගිනි වලල්ලක් පේනව නේ. රෑට ඔය පෙරහරවල් වල ගිනි බෝලයක් කරකවනව නේ ගිනි බෝලයක් කරකවන කොට ඔබට ගිනි වලල්ලක් පේනව නේ. එහෙම වලල්ලක් කියල එකක් කොහේවත් නෑනේ. ඒ වුණාට නමුත් එහෙම එකක් හැදෙනව නේ. අන්න ඒ වගේ එකක් සිද්ධ වෙනව. ඒක තමයි ඔබගේ සසර ගමන. ඔබ ආයෙ උපදිනවා. එහෙම එකක් කොහොවත් නෑ. එහෙම තියෙන තැනක් පෙන්වන්න බෑ. නමුත් ශක්ති ස්වභාවයක් උපදිනව. ඒක ඔබ විසින්මය සකස් කරන්නෙ. ඒක සකස් වෙන්නෙ අර තියෙනව කියල ගත්ත චිත්ත ශක්තිය. ඒ තියෙනව කියල ගන්න හැඟීම. එහෙම කියමුකො අපි. ඒ ගත්ත හැඟීම තමයි උපාදානය කියන්නෙ. අල්ල ගන්නව කියන්නෙ ඒක තමයි අවශේෂ නිරවශේෂ විරාග නිරෝධයක් තමයි නිවන කියන්නෙ. අල්ලගන්න දෙයක් සිද්ධ වෙන්නෙ නෑ. දරුවො ඉන්නව ගෙවල් තියෙනව. මම ඉන්නව මේ මගෙ දේවල් හොරකම් කරනව මේව ඔක්කොම සිතුවිලි චිත්ත ශක්තියක් උපදිනව. අන්න ඒ චිත්ත ශක්තිය තමන්ගෙ සිත නැවත නැවත සකස් වෙන්න හේතු වෙනව. ඒක තමයි ''පුරාණ මිදං හික්ඛවේ කම්මං වදාමි'' මේ පුනර්භවය සකස් කරන කතාව. ඒ කියන්නෙ හැම සිතක්ම ඊගාව සිත සකස් වෙන්න හේතු සකස් වෙනව. හේතු සකස් වෙනව මිසක් ඒ සිතයි මේ සිතයි අතර සම්බන්ධයක් නෑ. යටින් සම්බන්ධයක් නෑ. දැන් ගිනි

බෝලේ කරකවන කොට, ඒ ගිනි බෝලෙ වලල්ලක් වගේ පෙන්නුවට ගිනි බෝලෙ සම්බන්ධයක් නෑනේ. වලල්ලෙයි සම්බන්ධයක් නෑනේ. ගිනි බෝල 2ක් කියල එකකුත් නෑනේ. මේ වගේ මේ සිත ඇති වෙනව නැති වෙනව. නමුත් අර වලල්ලක් ඒ අස්සෙ කැරකෙනව. ඒක තමයි ඔබගේ සංසාර චක්‍රය. ඒකත් ඔබ නැවත සකස් වෙන්න හේතු වෙනව. උපදින්න හේතු වෙනව. ඔය ශක්ති ස්වභාවය දැන් මේ මුලු විශ්වයම ශක්ති ස්වභාවය දැන් මේ මුලු විශ්වයම ශක්ති ස්වභාවයක් තියෙන්නෙ. ඒ ශක්ති ස්වභාවය තුල මේ සකස් වීම සිද්ධ වෙනව. ඒක නිසා ඔබ පණුවෙක් වෙලත් උපදිනව. ඔබ සතෙක් වෙලත් උපදිනව. ඒ විතරක් නෙවෙයි මේක ඉතාම දැන් කතා කරන්නෙ නැති මාතෘකාවක් තියෙනව. ඒ කතාව ඒව කියන්න ගියොත් ඔබ තව අවුල් වෙනව විශාල කතා ගොඩක් තියෙනව. ඔබට වෙන දේ. ඔබට සිද්ධ වෙනව ඒක ඔබ දුකකමයි ඉන්නෙ. ඔබට සැනසීමක් කොහෙවත් අපට පේන්නෙ නෑ. මේ සසර කතාව දුක මතමය රඳා පවතින්නෙ. ''සුඛ දුක්ඛං දුක දුක්ඛං'' කිව්වෙ ඒකයි. 2 ම දුකක්මය. මේ වෙලාවෙ සැපක් කියල දැනෙන එක නැති වෙන කොට දුකක් බවට පරිවර්තනය වෙනව. ඒවගේම දුකක් කියල දැනෙන එක නැති වෙන කොට සැපක් බවට පරිවර්තනය වෙනව. ආයෙ ඕක දෝලනය වෙනව මිසක් ඕකෙන් ගැලවීමක් වෙන්න නෑ. මේක ලොකු කතාවක්. දැන් මෙතන ඔබට දැනෙන ගින්න තමයි ඒ ගින්න ඒ තේජෝ ධාතුව තමයි දුක කියන්නෙ. ඒක ඔබ පිච්චෙනව. ඒ පිච්චෙන තේජෝ ධාතුව දැන් සතෙක් ගත්ත කියමුකො. සතාටත් ස්කන්ධයක් තියෙනව වේදනා සංඥා සංකාර එකම ස්වභාවයක් තමයි මෙතනත් තියෙන්නෙ. එකම චිත්ත ස්වභාවයක් තමයි තියෙන්නෙ. දැන් පණුවෙක් වුණා කියමුකො. පණුවට සැප වෙන්නෙ අසූචි ගොඩක් නේ. ඒ පණුවට සැපයිනේ අසූචි. ඒ ස්කන්ධයට සැප ඒක. ස්කන්ධය කොතන ද ඒකට සැප ඒක. නමුත් ඒක තුළ තියෙන අර

දැවීම තමයිමේ ඔබ විඳින දුක පණුවන් දුක් විඳිනව. පණුව දුක් විඳින්නෙ අසූචි නැති වුණොත්. පණුවට අසූචි සැප වුණාට ඔබට අසූචි දුකයි. ඔබ දුක් විඳින්නෙ වෙනින් විදියකට. ඔය දුකේ ඇතුල ගින්නක් තියෙනව නේ. ඒ දාහය දැවීම එකමයි. සත්ව ස්වභාවය වෙනස් වුණාට දැවීම එකමයි. මේක ඇවිල්ල පුදුම විදියට පැහැදිලි කරන්න පුළුවන්. විශාල පර්යායක්. මේ ගොඩක් මේව කතා කරන්න ගියොත් අසාමාන්‍යයි. ඒ කියන්නෙ අසීමිත ප්‍රමාණයක් මේ එකින් එක එකින් එක පෙන්වන්න පුලුවන්. මේව කොහොමද වෙන්නෙ. මේව කොහොමද වෙන්නෙ මේ හැම එකම කතා කරන්න පුලුවන්. සත්‍ය අවබෝධ වුණහම ඒ කෙනා අභිඥ්ඥා ඥාණ අවධි වුණහම ඒ කෙනාට මුලු දන්න හැම කෙනාටම හැම දේකම සත්‍ය දකිනව. මොකක්ද වෙන්නෙ කියල හැම දේකම යථාර්ථය ජේන්න ගන්නව. යථා භූත ඥාණය අවධි වෙනව කියන්නෙ ඒකයි. ''අලෝකෝ උදපාදි චිත්තං උදපාදි චක්ඛුං උදපාදි'' ලෝකය බොරුවක් බව දකින තැනය සත්‍ය දකින්නෙ. ඒ තාක් කිසි කෙනෙක් සත්‍ය දකින්නෙ නෑ. ලෝකය ඇත්ත කරගෙන ඉන්න එකමයි මායාව දෘෂ්ටිය රැවටීම ඒක තුළම එයා හිර වෙනව. ඒක තුළ නැවත සකස් වෙනව. ශක්තිය තියෙන්නෙ එතන සකස් වෙන ඒ ගන්න ලෝකය තියෙනව කියල ගන්න චිත්ත ශක්තියම තමයි සකස් වෙන්න හේතු වෙන්නෙ. එතනින්මයි බිඳින්න තියෙන්නෙ. අවිද්‍යාව කියන්නෙ එතනින්මයි අවිද්‍යාව බිඳින්න තියෙන්නෙ. එතන බිඳගන්න තමයි මේ ශුන්‍යතාවය දකින්නෙ. දැන් බාහිර දෙයක් ඇත්ත නෙවෙයි. සිතට අරමුණ නේ එන්නෙ. එන එන අරමුණ සත්‍යයක් වෙන්නෙ නැහැ නේ එයාට. එතකොට බාහිර ඇත්තක් වෙන්නෙ නැහැනේ. එතකොට සිතට අරමුණක් එනකොට ඒක බාහිරට ගැට ගැහෙන්නෙ නෑ නේ. එතකොට බාහිරින් මිදෙනව නේ. සිතිනුත් මිදෙනව. එන අරමුණට මොකද වෙන්නෙ. දැන් ඔබට දෙයක් ජේනව නේ. ජේන දේ. අන්න ශුන්‍යතාවයෙන් යුක්ත වෙනව. ජේන දේ

හරයක් නැති වෙනව. අන්න විරාගයට එනව. නිරෝධයට එනව. නිබ්බිදාවට එනව ''නිබ්බිදන්ති විරාගන්ති විරාගන්ති නිරෝධන්ති නිරෝධන්ති පටිනිස්සග්ගානුපස්සී'' කියන්නෙ මෙන්න මේ නිවන් මග තියෙන්නෙ ඔතනයි. නැවත සකස් වෙන්නෙ නෑ. ආසවක්ඛයා ඥාණය තමයි අවසානයේ සකස් වෙන්නෙ. මේ සත්‍ය දකින කෙනාටයි සකස් වෙන්න. ඉතින් මේ චිත්ත විශුද්ධිය තියෙන කෙනාටයි දිට්ඨි විශුද්ධියට එන්නෙ. දිට්ඨි විශුද්ධිය තමයි මේ සේරම පේන්න ගන්නෙ. ඒ කෙනාට තමයි ''කංඛාවිතරණ'' විශුද්ධිය සියල්ලම සැකයක් නැතිව ම හැදෙන්නෙ. ඒ ''කංඛාවිතරණ'' විශුද්ධියක් එක්ක තමයි මග්ගාමග්ග ඥාණ දස්සන විශුද්ධියට එන්නෙ. මේ දේ ඇත්ත පේන්නෙ. මග්ගාමග්ග ඥාණ දස්සන විශුද්ධිය තමයි පටිපදා ඥාණ දස්සන විශුද්ධියට එතන එතන ඇති වන නැති වන සිත පේන්න ගන්නව. පටිපදා ඥාණ දස්සන විශුද්ධියට එන කෙනා තමයි නාම රූප පරිච්ඡේද ඥාණයට අවතීර්ණ වෙන්නෙ. නාමරූප පරිච්ඡේද ඥාණය කියන්නෙ නාමයයි. රූපයයි බාහිර ඇත්තක් නොවන බව සිතත් ඇත්තක් නොවන බව දකින තැන. නාම රූප පරිච්ඡේද ඥාණය අවධි වුණ කෙනාට තමයි සම්මර්ශන ඥාණ අවධි වෙන්නෙ. සම්මර්ශන ඥාණ අවධි වෙන කෙනාට තමයි උදයවන ඥාණ මේ ඇති වන නැති වන ස්වභාවය ලෝකය පේන්න ගන්නෙ. හැම ක්ෂණයම එයාට ඇති වන නැතිවන ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇති වන නැති වන ස්වභාවය පේන්න ගන්න කෙනාට මරණ කතාවක් මුකුත් නෑ. සදාතනික සුවයකට පත් වෙනව. එයාට මරණයක් නෑ, මරණය සිතුවිල්ලක් කියල දකිනව. ඒක බොරුවක් කියල දකිනව. එයා හැම මොහොතෙම ක්ෂණය ක්ෂණය ක්ෂණය ක්ෂණය ඇති වෙනව නැතිවෙනව. එතනයි ජීවත් වෙන්නෙ. එතනයි එයාගෙ කතාව තියෙන්නෙ. එතනත් ජීවිතයක් නෑ. එතනත් දෙයක් කියල දෙයක් නෑ. පනවන්න දෙයක් නෑ. මහා ශූන්‍යතාවය තුළ මහා ස්වභාවයක යම් කිසි කුරුල්ලෙකුගේ ස්වභාවය වගේ පාවෙන ස්වභාවයකට පත්

වෙනව. ශාන්ත සුවයක් දැනෙනව. මේ දෙයක් නැති තැන ගින්නක් නෑ කියන තැනට එනව. ගින්න පත්තු වෙන්නෙ නැති ශාන්ත සුවයක් තියෙනව. ''ඒතං සාන්තං ඒතං පණීතං යදිදං සබ්බ සංකාර සමථො'' කියන්නෙ සියලු සිතුවිලි එන එන සිතුවිලි සමථය වෙල එයාට සත්‍ය තැනයි ඒක සිද්ධ වෙන්නෙ. අන්න භංග ඥාණ සියල්ල බිඳ වැටෙන එක දකිනව. භයතු පට්ඨාන ඥාණ ඒ තුළ මේ සියල්ලෙන්ම පලක් නැති බව ආදීනව දකිනව. නිබ්බිදා ඥාණය එයා ඒ සිතුවිලි වලට කල කිරෙනව ඇත්ත කරගෙන දඟලන්නෙ නෑ. එයා නිබ්බිදා ඥාණය තියෙන කෙනා ''මුඤ්චිතු කමමතා ඥාණය'' මිදිල යන්න උත්සාහ කරනව. සත්‍ය දැකල මිදෙන්න උත්සාහ කරනව. අන්න ඒ කෙනාට පටිසංකා ඥාණ සකස් වෙනව. එයාට විචිකිච්ඡාව මුකුත් නෑ. සංකාර උපේක්ෂා ඥාණයට එනව. උපදින උපදින සෑම සිතක්ම කණික සමාධිය උපදිනව. ඛණික සමාධිය කියල කියන්නෙ එතන එතන එතන එතන උපදින උපදින සෑම සිතක්ම ශුන්‍යයි කියල දකිනව. සංඛාර උපේක්ෂාවෙන් දකිනව. සියලු සිතුවිලි උපේක්ෂාවට පත් වෙනව. අනුලෝම ඥාණ උපදින්නෙ අන්න මාර්ග ඥාණ උපදිනව. ගෝතකුඥාණ එතනයි තියෙන්නෙ. එතනය මාර්ග සිත් උපදින්නෙ. සෝවාන් සකෘදාගාමී අනාගාමී අරහත්වයට පත්වන සියලු රහ නැති වන අරහත්වයට පත් වන තැන අන්න කතං කරණියං සියල්ල අවසානයි. අන්න පච්චවෙක්ඛණ ඥාණ උපදින තැන එතනයි. පල ඥාණ බවට දකින්න පුලුවන් මේ නිවැරදි නිවන් මග හඳුනාගන්න. පැහැදිලි කරනව නම් ගැඹුරින් ගැඹුරට ඒ සියුම් කාරණා අභිඥ්ඤාවෙන් ම ඔබට පැහැදිලි කළ හැකියි. නමුත් එය ඔබට වැටහෙන්නෙ නැති නම් අප වෙහෙසට පත් වෙනව පමණයි. යමෙකුට එය අවශ්‍ය නම් සැකයක් තියෙනව නම් සත්‍ය අවබෝධ කරගන්න අවශ්‍යතාවයක් තියෙනව නම් කෙනා කෙනාට එය පහදා දෙනව විනා දිගින් දිගට ම අපි මෙහෙම පැහැදිලි කලත් ඔබට එය නොතේරෙනව නම් එහි

අර්තයක් නැති වෙනව, ඉතින් නිවන් මග යන කෙනෙක්ට. හැබැයි අපි දන්නව මේ කාරණා ඉතාම වැදගත් වෙනව. ආත්ම දෘෂ්ඨියක් නැතුව කොහොමද අත්‍රානු දිට්ඨීං ආත්ම දෘෂ්ටිය බිඳ වැටුණෙ. අන්න ''මච්චු රාජ නපස්සති'' මාරයා ජය ගන්නෙ කොහොමද අන්න එතනට යන්න ඕන. අන්න එයා ශාන්ත සුවයට පත් වෙනව. එයාට මරණ බියක් කවදාවත් නෑ. කාලයක් නෑ. සිත උපදින්නෙ පෙර සංඥා නව සංඥා නිසා නම් මේක තවත් දීගට දිගට කතා කරන්න ගියොත් අකාලික දහමක් වේ. කිසිවක්ම නෑ මොහොතට අවධිය කියන තැනට තමයි තියෙන්නෙ. ධර්මය තුළ නම් සමහර අය එක එක තැන්වල හිර වෙලා ඉන්නව. අන්තිමට තියෙන තැන සිතට එන සිත ඇත්තට ම මිදි මිදි යන තැන ඇත්තට ම එතන දකින්නත් මුලින් එයාට යථාභූත ඥාණය තියෙන්න ඕන. එයා මේ නාම රූප පරිච්ඡේදය දකින්නෙ නැතුව මේ කවුරු හරි කෙනෙක් උපදෙස් දෙනව නම් කාටහරි මේ එන එන සිත සිතුවිලි වලට රිංගන්නෙ නැතුව මිදි මිදි එතන ඉන්න කියල බාහිර ඇත්ත වෙලා ම් එයා සසර දුකට වැටෙනවනේ. ඉතින් හරි පරිස්සමින් ඕන උපදෙස් දෙන්න. අප දන්නව සමහර භික්ෂුන් වහන්සේලා එක එක තැන්වල හිර වෙලා ඉන්නෙ. ඉතින් හිර වෙච්ච තැන ඉඳන් තමයි දෘෂ්ටිය තුළ ඉන්නෙ. එක අතකින් මුකුත් නොදන්න කෙනාට වඩා යම්කිසි දියුණුවක් තියෙනව. නමුත් පරිස්සම් වෙන්න ඕන. ඉතාම පරිස්සමින් මේ කටයුත්ත කරන්න ඕන. එම මර්ගයේ යන්න ඕන. හැම තැනම අත්හැර අත්හැර යනව නම් මෙය වඩාත් හොඳ වෙන්නෙ. අපි වුණත් ඇත්තට ම මේ මොනව වුණත් මේ කතා කරන එක වචනයක්වත් අපට අදාළ නෑ. අපට අදාළ අපි දකින ධර්මතාවයක් තියෙනව. ඒ යථාර්ථය තුළ අපි දකිනව ඒ දර්ශනය.

# ★ 7 වෙනි පරිච්ඡේදය ★

## නාමරූප පරිච්ඡේද ඥාණය
## සිතිවිලි සත්‍යයක් නොවේ
## සංඛාර උපේක්ෂා ඥාණය

නාමරූප පරිච්ඡේද ඥාණය, **පච්ජේ පරිග්ගහ ඥාණය, රූපයේ පරිජානාති. ඉති රූපං ඉති රූපං සමුදය, ඉති රූපං අත්ථගමෝ,** රූපයේ හටගැනීම, රූපයේ නැති වීම, රූපයේ අවබෝධ කිරීම, මෙතනදි දීර්සව ඔබ දැන් අසාගෙන ආවා දීර්සව ඔබට පැහැදිලි කර පුංචිම තැනේ ඉඳලා යෝගාවචරයෙක් සති නිමිත්තෙන් ආරම්භ කරලා සමථයානික යෝගාවචරයෙක් භාවනාවට යොමු වෙලා සමාධිමත් හිත හදාගෙන සමාධිමත් සිත හදාගෙන, විතක්ක විචාර සංසිද්ධිවල ඒ චිත්ත ඒකාග්‍රතාවයට ඇතිවන තැන, නැත්නම් සති නිමිත්තම සමාධියක් කරල ඒකාග්‍රතාවයට එනම් විතක්ක විචාර සංසිඳවල ප්‍රීති සුඛ ඒකාග්‍රතාවය කියන ඒ ධ්‍යාන මට්ටමට, ඒ උපචාර සමාධියට, අර්පණා සමාධියෙන් උපචාර සමාධියට, ඉතිං මේ සමාධිමත් සිත සතර වන ධ්‍යාන මට්ටමේ සිත විසිරෙන්නේ නැතිව ගැඹුරෙන් ගැඹුරට යන මහා ඥාන අවදිවන ඒ ස්වභාවයට මේ සත්‍ය දකින්න හැකියාව තියෙනවා. සියල්ලම සෑම අරමුණකම සත්‍ය දැකීමේ හැකියාව, යථාභූත ඥානය අවදිවෙනවා. මේ ඥාන කියන්නේ සිතිවිලි නෙමෙයි, සිතිවිලි කියන්නේ ඔබ දන්නවා දැන් පැහැදිලි කරපු ආකාරයට මේ දේශනා මාලාව තුළ ඔබට අසන්න ලැබුණා නාමයත් රූපයත් එකතුවීමමයි සිතිවිල්ලක් කියන්නේ. අපි මේ කථා කරන හැම වචනයක් ම අන්තයක් තියෙනවා. මේ භාෂාව හැදිල තියෙන්නේ, තියෙනවා කියන පදනම මතයි. ඇත නැත

කියන අන්ත දෙකේම ගැබ්වෙලා තියෙනවා ඒ තියෙනවා කියන ඒ ඇත නැත කියන කම තුල ඇත කිව්වත් තියෙනවා, නැත කිව්වත් තියෙනවා, මේ සත්‍ය භාහිර සත්‍යයක් වෙලා සිතත් සත්‍යයක් වෙලා තියෙනවා කියන අදහස මේ භාෂාවේ තියෙනවා. ගැබ්වෙලා තියෙනවා අන්ත දෙක. ඒ ඇත නැත කියන අන්ත දෙක නිසයි භාෂාවක් හැදිල තියෙන්නේ. ඒක ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ කියලා මෙහෙම කථා කලත් මේ භාෂාව අසරණයි. මේ සත්‍ය දකින තැනේදි භාෂාවම මායාවක් කියන හැම වචනයක් ම සත්‍යයක් වෙන්නේ නෑ. ඒකෙන් සත්‍ය දකින්න හැකියාවක් නෑ. නමුත් ඒ භාෂාව තමයි අපිට මෙතනදි භාවිතා කරන්න සිද්ධ වෙන්නේ. අපි අසරණයි. ඇත්තට ම මොකද අපිට වෙන විකල්පයක් නෑ. මේ මනසිකාරයම, මනසිකාරය අවබෝධ කිරීමක් තමයි. මනසිකාරය තුළින් ම මනසිකාරය අවබෝධ කිරීම සිද්ධ වෙනවා. මේ සිත, සිතක් නැති බව අවබෝධ කරනවා. ඒක අතිශයින් ගාම්භීරයි. ගැඹුරුයි. නමුත් ඒක ඔබ මේ දන්නව කියන මෙන්න මේ ඔබට තියෙනව සාමාන්‍ය දැනුමක් ඉරක් තියෙනවා. ඔබට ඉරක් තියෙනවා, ඔබට සඳක් තියෙනවා, ලෝකයක් තියෙනවා, ඔබට පෘථිවියක් තියෙනවා, ඔබට කාලයක් තියෙනවා, ඔබට උපතක් තියෙනවා, ඔබට මරණයක් තියෙනවා, මේ තියෙනවා තියෙනවා කියන හැම තැනම ඒ ඔබ හදා ගත්ත දෙයක් තියෙන්නේ. ඇත්තම කතාව එතනමයි මායාව. ඒකමයි බොරුව, ඒක අවබෝධ කරන්නේ කොහොමද ඔබ මේ කියන හැම වචනයක්ම තියෙනවා කියන එකයි කියන්නේ. මේ කියන හැම භාෂාවේ තියෙන එක මනසිකාරය ඒක. ඒකයි නාමරූප පච්චයා විඤ්ඤාණන් කියන්නේ. ඒක තමයි මහා නිධානය. මේ සිත හැදෙන කථාවේ මහා නිධානය, මහා නිධාන සූත්‍රයේ තියෙන්නේ නාමරූප පච්චයා විඤ්ඤානන් තමයි මහා නිධානය. ඔතනින් තමයි සිත හැදෙන්නේ. හැබැයි මේ කතාවට හේතුවෙලා තියෙන්නේ අවිද්‍යාව. මේක තමයි අවිද්‍යාව. ඒ කියන්නේ

මේක නොදන්න කම, ඔබ මේක දැනගත්තොත් ඔබට මේක සකස් වෙන්නේ නෑ, ගැටගැහෙන්නේ නෑ නාමයි රූපයයි. එහෙම උනොත් සිත හැදෙන්නේ නෑ. අර අවිද්‍යාවයි, අවිද්‍යාව කියන්නේ මේ ඔක්කොම ඇවිල්ලා මනසිකාර, මේ ඔක්කොම සංඛාර. සංකාර කියන්නේ කෙහෙවත් තියෙන දේවල් නෙමෙයි. අපි සකස් කරගත්ත මනසිකාර තමයි සංඛාරා සංඛාර කොහෙවත් තියෙන ඒව නෙමෙයි. සංඛාර සකස් කර ගත්ත ඒවා. සංඛාරං සංඛාරත්තාය කියන්නේ මේ සංඛාර සකස් වෙනවා විපරිනාම වෙනවා, අභිසංඛාරනය වෙනවා. ඔබ කථා කරනවනේ වචී සංඛාර, කාය සංඛාර, මනෝ සංඛාර කියන ඔය පරියාය තුන ඒ හැම එකකින් ම පෙන්නන්නේ එකම දේ. ඔබ මේවට හිර වෙන්න එපා. වචී සංඛාර කියන්නේ මේක, කාය සංඛාර කියන්නේ මේක, මනෝ සංඛාර කියන්නේ මේක කියල ඕවට අන්තගාමී වෙන්න එපා. අන්තෙට යන්න එපා, හිරවෙන්න එපා, ඕවත් සංඛාර. මේක අවබෝධ කරගෙන ලියපු පර්යාය, පර්යායට කොටුවෙන්න එපා. පර්යාය භාවිතා කරනවා පමණයි. පර්යාය නෙමෙයි පරම සත්‍ය කියන්නේ. පර්යාය මේ ඔබ පොතක දකින ඔබ යම් සමීකරණයක් ගනන් හදන හැටි ඉගෙන ගන්නවා. ඒ ඉගන ගන්නවා වුනාට ගාන හදනකොට ගානේ උත්තරේ වෙනයි. ඒ සිස්ටම් එක ඉගන ගන්න එක වෙනයි. වචී සංඛාර, කාය සංඛාර, මනෝ සංඛාර සේරම සංඛාර **''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි''** චේතනා, සිතිවිලි, සංඛාර, සියල්ල සංඛාරා මේක තවත් හොඳට ලිහන්න ඕනි. එතකොට ඔබට වැටහෙනවා මේ සේරම සංඛාරා කියලා. දැන් ධම්මදින්නා, විශාකාව දෙන ඒ චුල්ල වේදල්ල සූත්‍රයේ ඔබට දකින්න ලැබෙනවා, මේ සංඛාර ගැන ගොඩක් පැහැදිලි කිරීම්. එහිදී ඔය වචී සංඛාර වලට යටින් තියෙන්නේ විතක්ක විචාර, කාය සංඛාරයට යටින් තියෙන්නේ ආස්වාස ප්‍රාස්වාස, මනෝ සංඛාරයට යටින් තියෙන්නේ වේදනා සංඥා කියල. ඔබට පර්යාය තුල

හමුවෙනව සූත්‍ර තුල ඔය චූල්ල වේදල්ල සූත්‍රයේ ඔබට දැක්කම පේනව. ඒ කථාව ඉතාම ගැඹුරු කථාවක් එතන තියෙන්නේ. විතක්ක විචාර කියන්නේ ඔබ ශබ්දයක් පිට කරන්නේ භාෂාව කියන්නේ ශබ්දයට යටින් තියෙනවා. විතක්කයක්, විචාරයක්, ඒ විතක්ක විචාරයම තමයි ඔබ ''සතිය'' වඩන කොටත් තියෙන්නේ සතිය වඩද්දී තියෙන්නෙත් විතක්ක විචාරමයි. ඒ විස්තර ඒ යටින් එන්නේ කුමක්ද කියන එක. කුමක්ද මේ වචනයක් පිට කරන්න කලින් තියෙන්නේ චිත්තයක්. චිත්තයක් තමයි එතකොට මෙතන මේ තියෙන්නේ මේ වචනයමයි. එතකොට වචනයට යටින් තියෙන්නේ විතක්ක විචාරයක්. ඒ කියන්නේ විතක්ක විචාරයක් තියෙන්නේ මනෝමයයි. **''මනෝ පුබ්බං ගමා''** එන්නේ, විතක්කයක් විචාරයක් නැතිව මේ මනස මූලික කරගන්නෙ නැතිව වචනයක් පිට වෙන්නේ නෑ. ඒකෙන් තේරෙනවා මේ විතක්ක විචාරය මූලයට යනව කියල තේරෙනවා ලොකු කථාවක්. ඒ වගේම කාය සංඛාරා කියන්නේ ආස්වාස ප්‍රාස්වාස මූලිකයි කියලනේ. එතකොට ආස්වාස ප්‍රාස්වාස මූලිකයි කියන්නේ මෙතන මේ හැම ඔබ කෙනෙකුට ගහන්න ගියත් අතක් උස්සන්න ගියත් ඒක හොඳ හුස්මක් අරගෙන නෙමෙයිද කියලා බලන්න අත උස්සන්නේ. එතකොට මේක පුද්ගලයෙක් කරන එකක් නෙමෙයි. මේක මේ හොඳ හුස්මක් ගන්න එක ඔය හිතල කරන්නේ නෑ. ඒ හුස්ම ගත්තෙ නැත්නම් අර වේගෙන් අර අත යන්නේ නෑ. එතකොට මේක කාය සංඛාරා කියන්නේ ඒකයි. කාය සංඛාරයක් ඒක ඒ කියන්නේ ඒක system එකක්. මේ ස්වභාවික සංසිද්ධියකි. මේ වචනයේ ශබ්දය එලියට එන එක ස්වභාවික සංසිද්ධියක් ඒක සංඛාරයක්, ඒක මේ ආත්මීය දෘෂ්ඨියකින් ගන්න බෑ. අනාත්මයි, ආත්ම නෑ, මේ විතක්කයක් කියන එක එන්නේ කොහෙන්ද, එන්නේ මූලයක් එක්ක. මේ එන මූලය බැලුවම තේරෙන්නේ භාෂාවක් එන්නේ ඔබ පුංචි දරුව ප්‍රභාස්වර සිත එතකොට

පළවෙනියට එන වචනය කියන කොට භාහිරයෙන් එන ශබ්දයේ, අපි කිවුවා අහසේ විදුලි කොටන කොට මේ ජනෙල් හෙල්ලෙන්නේ. එතකොට ප්‍රතිකම්පනයක්නේ එන්නේ. එතකොට ඒ ශබ්දයේ මේ ශබ්දයේ සම්බන්ධයක් නෑනේ. ඒ ශබ්දය වෙනයි. මේ ශබ්දය වෙනයි. ඒක විදුලි කොටන ශබ්දය, මේක ජනෙල් හෙල්ලෙන ශබ්දය. නමුත් මේ ශබ්ද දෙකක් වගේ නෙමෙයිනේ, මේ කථාව එකම කථාව. එකම ශක්ති ස්වභාවයක අපි දකින අපිට පේන්නේ මේ ශක්ති ස්වභාවය නෙමෙයි. අපිට පේන්නේ මෙන්න මේ භාහිර හැඩතලය. භාහිර හැඩතලය තමයි මේ ශබ්දය. ශබ්දය වෙන්න පුළුවන්, ඒක වර්ණය වෙන්න පුළුවන්, ඒක ගන්ධය වෙන්න පුළුවන්. මේක අපේ තියෙන ප්‍රසාදයට තමයි මේක දර්ශක කරන්නේ, ශබ්දය දර්ශකයක් පමණයි. වර්ණය දර්ශකයක් පමණයි. රස දර්ශනයක් පමණයි. නමුත් මෙතන ඔක්කොම එකම ශක්ති ස්වභාවයක් තියෙන්නේ. එහෙම ගන්ධ, වර්ණ කියල මේවා වෙන් කරන්නේ අපි ඒක දර්ශන හදා ගන්නේ අපිට ඇස් දෙකක් නැත්නම් වර්ණ දර්ශකය එන්නේ නෑ. අපිට කන් දෙකක් නැත්නම් අපිට ඒ දර්ශකය එන්නේ නෑ. අපි සම්මුතිය තුළ කථා කරමු. එතකොට මේ හැම එකක්ම එතකොට මේක හැදෙන එකක්. මේක අපි අන්තයකට යන්න බෑ. අතන තියෙනවා කියල. භාහිර කිව්වත් වැරදි මෙහෙ කිව්වත් වැරදි. මේක **''හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජන්ති''** මේක සකස් වෙනවා. මෙය ඇති කල්හි මෙය වේ. දේදුන්නක තියෙන්නේ ආලෝකයක්, නැතිව දේදුන්නක් පායන්නේ නෑනේ. දේදුන්නක් පායන්න හිරු එළිය තියෙන්න ඕනි. ජල වාෂ්ප තියෙන්න ඕනි. එතකොට ඉර එළියක් තියෙනවානම් වැහිබර කාලගුණයක් එහෙම නැත්නම් ජල වාෂ්ප සහිත වාතයක් තියෙනවනම් එතනට මේ හිරු එළියේ රශ්මිය වැදිල අර ජල අංශුවල ප්‍රතිභිම්භයක්නෙ අපි දකින්නේ. පරාවර්තනයක්නෙ. ඒක අපි කියනවා දේදුන්නක් කියල. නමුත් අපිට පේනව වර්ණ හතක්.

මේ මොකක්ද මේ වෙලා තියෙන්නේ එහෙම දේදුන්නක් කොහෙවත් තියෙනවද? අපිට අල්ලන්න පුළුවන්ද? මායාවක් නෙමේද? මේක මැජික් එකක් නෙමෙයිද? මේක මැජික් එකක්. මෙන්න මේ වගේ සිතක්. සිතත් මැජික් එකක්. ඒක මායාවක්. ඒක ලොකු මායාවක්, ඒක අපිට අද ඒ මායාව අපි ඒ මායාවට බැහැල ඒ මායාව අපි ඇත්ත කරගෙන තියෙන්නේ. අද අපිට මේ මායාව පුදුම විදියට ඇත්ත වෙලා තියෙනවා. ඒ මායාවෙන් අපිට ගැලවෙන්න බැරිව තියෙනවා. සිත කියන හැමදේම අපි වහලෙක් වගේ අපේම සිතේ අපි වහලෙක් වෙලා. හිතන දේ හරි කියල අපි අපිම මේක ලොකු කථාවක් නේද? ලොකු ගැඹුරු කථාවක් නේද මේක. ඇත්ත ලිහන්න පුළුවන් නම් ලිහන්න පුළුවන්, සරලවත් ලිහන්න පුළුවන් අර අපේ තියෙන දැනුම තමයි මේ අපිව ගැඹුරු කරල තියෙන්නේ. දැන් පුංචි දරුවට දැනුම නෑ. අවුරුදු හතේ දරුවට දැනුම නෑ, ඒ දරුවට හරි සරලව ලෝකය බොරුවක් කියන එක තේරුම් කරන්න පුළුවන්. දැනුමක් නෑ, නමුත් ඔබ ඔය දැනුමෙන් ගලවන්න ඕනි. ඔබ එකතු කරගත්ත මහා ඥානය, ඔබ එකතු කර ගත්ත මහා දැනුම, ඥානය කියන්න බෑනේ. මහා දැනුම, ඒ දැනුම තමයි ඔබව හදල තියෙන්නේ. ඇත්තම කිව්වොත් සේරම ඔබ එකතු කර ගත්ත දෙයක්. ඒ කියන්නේ මේක මේ system එකක් තියෙනවා. මේ system එක හොඳට අවබෝධ කර ගන්න ඕන. මේක ඇත්ත දකින්න ඕනි. ඇත්ත දැක්කොත් ඔය මායාව ගැලවිලා යනවා. අවිද්‍යාවට ඉඩ නැතිව යනවා. මේ අවිද්‍යාවට තමයි, නැතිනම් රැවටීමනේ අවිද්‍යාව කියන්නේ. මේ රැවටීමනේ මායාව කියන්නේ. දැන් අපි ගත්තොත් පොඩි දරුව බාහිර හැඩතලය එනකොට, ශබ්දය මෙහෙන් එනකොට, අම්මගෙ හැඩතලය එද්දී, අම්ම, අම්ම, අම්ම, කියන කොට මේ මා... මා... කියල ස්වරාලයෙන් එන්නෙ ප්‍රතිකම්පනයක් කියල කවුද දකින්නේ. මේ ප්‍රතිකම්පනයක් කියල කාටවත් දකින්න පුළුවන්. මේ දකින ඒක ලේසි නෑ.

මේ මෙතන ස්වරාලයෙන් එන්නෙ ප්‍රතිකම්පනය. ඒ ස්වරාලයෙන් එන ප්‍රතිකම්පනය එන හැටි, එතනින් එන ඒ ශබ්දයට මෙහෙන් ප්‍රතිකම්පනය වෙන හැටි ඒ හැඩතලයට ඊට පස්සෙ මේක තවත් සිද්ධියක්. ඒක එක සිද්ධියක් ඒක ඔක්කොම එකට ''සම්භූත'' වෙනවා. තවත් පැත්තකින් බැලුවහම මේ හැඩතලයත් එක්කම මේ ශබ්දයත් එනවා. එතකොට මේවා එකතු වෙනවා. එතකොට මේක අභිසංඛරනයක්, මේක විශාල පටිච්චසමුප්පාදයක් තමයි. මේක විශාල පටිච්ච සමුප්පනයක් ඇතුලේ තියෙන්නේ. මේක ඇත්තටම ''අන්තෝජටා බහිජටා'' තමයි. මේක ඇත්තට ම මේක සංඛාරයක් තමයි. සංඛාරයක් කියන්නේ මේව එකතු වීමක් තමයි. සංඛාරයක් කියන්නේ සංඛාරය හැම විදියෙම මේ හැමදෙයට ම ඔබ තේරුම් ගන්න කොට ඔබට තේරෙයි සියල්ලම සංඛාර තමයි. වචී සංඛාර, කාය සංඛාර, මනෝ සංඛාර හැර මේකෙ වෙන දෙයක් ඉතුරු වෙන්නෙ නෑ. ඒ කියන්නේ ඔක්කොම සංඛාර කියන එක තමයි. ඔබට සිත, කය, වචනය හැර වෙන මොනවත් තියෙනවද? නෑ. එහෙනම් ඒ ඔක්කොම තමයි. සේරොම සංඛාර කියන එක තමයි ඔය නොකිය කියන්නේ. ඔබ හිතන්න ගියොත් ඒ හිතන එකත් වේදනා සංඥා යටින් තියෙනව කියලනෙ කියන්නේ. එතකොට ඔබ දන්නව කාය සංඛාර කියන්නේ ආශ්වාස ප්‍රාශ්වාස වර ගත්තට ආයෙ මනෝ සංඛාර කියල කියන්නේ ගන්නවා වේදනා සංඥා කියලා. එතකොට ඔබ පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආහින්ජාභිසංඛාර කරන්නේ අභිසංඛාර-නයක් නේ. අභිසංඛාරනය කියන්නේ **''සංඛාර සංඛාරනත්තාය සංඛතං අභිසංඛරොති''** මේක ලොකු කථාවක්. මේක **''රූපං රූපත්ථාය සංඛතං අභිසංඛරෝති, වේදනං වේදනත්තාය සංඛතං අභිසංඛරෝති, සංඛාරං සංඛරත්තාය සංඛතං අභිසංඛරෝති, සංඥා සංඥාත්තාය සංඛතං අභිසංඛරෝති, විඤ්ඤානං විඤ්ඤානත්තාය සංඛතං අභිසංඛරෝති''** ධර්මය තුළ

පෙන්නන මේ සංඛාර කථාව ඔබ හිතන තරම් බොළඳව දකින්න එපා. තව ගැඹුරට යන්න. සියල්ල සංඛාර, සබ්බේ සංඛාරා. සබ්බේ සංඛාරා කියන්නේ ලොකු මායාවක්, මේ කථාවම තියෙන්නේ ඔතන සියල්ල සබ්බේ සංඛාරා සබ්බේ සංඛාරා කියන්නේ මේ කථාවම ලොකු කථාවක්. සබ්බ සංඛාර සංඛතං කියන්නෙම නිවනම. ඒකයි මේක මොන ආකාරයට ගත්තත් සබ්බ සංඛාර සමතයක් කියන්නෙම නිවන. මුළු බේස් එකම අවිද්‍යා පච්චයා සංඛාරා තමයි. මේ සිතකියන කථාව හැදෙන, අවසානයේ දී එන එක එක සංඛාරා ඵලයට හේතු වෙනවා. ඒ කියන්නේ මේ පටිච්ච සමුප්පාදය නිකම් පොතක කටපාඩම් කරල එහෙම එකක් නෙමෙයි. පොතක තියෙන එකක් කියනව එහෙම නෙමෙයි. මේකෙ ඇතුළ දකින්න ඕනි. ගැඹුරෙන් ගැඹුරට යන්න ඕනි. මේ හැම තැනම තියෙන්නේ පටිච්ච සමුප්පාදය. පටිච්ච සමුප්පාද ධර්මය නිසයි මේ ආත්ම කථාවක් හැදිල තියෙන්නේ. පටිච්චසමුප්පාද ධර්මය නිසයි සිත කියන කථාවක් හැදිල තියෙන්නේ. පටිච්ච සමුප්පාද ධර්මය නිසයි. ඔබ මේ ජීවත්වෙනව, ඉන්නව, ආත්ම දෘෂ්ටිය කියන ඔය සියල්ලම තියෙන්නෙ. පටිච්ච සමුප්දායෙන් හැදිච්ච ඒවා. පටිච්ච සමුප්පාදය අවබෝධ කරනව කියන්නේ ඒක බිඳ වැටුන කියන්නේ සවිඤ්ඤාණ කථාව බිඳ වැටිල අවිඤ්ඤාණ පැත්තට එනව. ඇත්තම කිව්වොත් ආත්මීය කථාව බිඳ වැටෙනවා. ආත්මීය කථාව තියෙන්නේ පටිච්ච සමුප්පාදයත් එක්කමයි. පටිච්චසමුප්පාදය අවබෝධ කරනව කියන්නේ ආත්මීය කථාව බිඳ වැටෙනවා. බිඳ වැටිල මේක ශුන්‍යයතචේතෝ විමුක්තියකට එනවා. නිමිත්තක් දෙයක් නැතිවෙන තැනයි අනිමිත්ත සමාධිය එන්නේ. අනිමිත්ත සමාධියක් තියෙන තැනයි අප්‍රණිත ප්‍රණිත ආත්මීය දෙයක් නැති වෙන්නේ. එතනයි ශුන්‍යතාවය තියෙන්නේ. ශුණ්‍යතා චේතෝ විමුක්තිය තමයි චිත්ත විමුක්තිය. මේ චිත්ත කියන්නෙත් ඔය තුනටම තමයි. චිත්ත කියන්නේ නිමිත්තක්

ගත්ත ද එතනයි. නිමිත්තත් එක්කයි චිත්තයත් තියන්නේ. එහෙනම් නිමිත්තක් තියෙනවා කියල ගැනීමයි චිත්තය කියල, සිත කියල කියන්නේ. එහෙනම් නිමිත්ත නැතිවෙන තැන චිත්තය නැතිවෙයි. එහෙනම් මේ චේතෝ විමුක්තිය කියන්නේ චිත්ත විමුක්තිය කියන්නේ අනිමිත්ත අප්‍රණිත කියන එකම තමයි. ඒ දෙකම නැතිවෙන තැනයි ශුණ්‍යතාවය තියෙන්නේ. ශුණ්‍යත චේතෝ විමුක්තියක් චිත්ත විමුක්තියක් ඔබට දකින්න ලැබෙයි. ඉතිං මේ චිත්ත විමුක්තියක් කරා යන ගමනක් එහෙම එකක් නෙමෙයි. මේ තියෙන්නේ ඊට වැඩිය ගැඹුරු කථාවක්. මේ තියෙන්නේ පරම සත්‍ය. මේ ලෝකේ සත්‍ය. මේ විමුක්ති මාර්ගය. ලෝකයේ සත්‍ය දකින එකයි තියෙන්නේ. සත්‍ය දැන් එතකොට මොකද්ද
අනිත් පැත්තෙ තියෙන්නේ, අසත්‍ය. දැන් සාමාන්‍යයෙන් මේක අවබෝධ නැති කෙනා සත්‍ය දන්නේ නෑ. දැන් එතන සරල භාෂාවෙන් මේක විසඳ ගන්න පුළුවනි. ඇත්ත දන්නෙ නෑ කියන්නේ, සත්‍ය දන්නේ නෑ කියන්නේ ලෝකෙ මොකද වෙන්නේ කියල දන්නේ නෑ කියන්නේ, ඇයි ඔය අඬන්නේ, ඇයි ඔබ වැලැපෙන්නේ, ඇයි ඔබට මරණයක් තියෙන්නේ ඇත්ත නොදන්න නිසයි. මරණයක් නැති බව දකින්න නෙමෙයි. සත්‍ය දකින තැන මරණයක් හමු වෙන්නේ නෑ. ඇත්ත දැක්කම මෙතන මැරෙන්න කෙනෙක් නෑ. කෙනෙක් ඉන්නව කියන එකම මායාවක්, බොරුවක්, දෘෂ්ඨියක් වෙනවා. මේ ස්වභාවය අවබෝධ කර ගත්තොත්, මේ ස්වභාවයේ සත්‍ය දකින තැන ඇත්තයි දකින්නේ. දැන් ඇත්ත නෙමෙයි කියන්නේ ඔබට දැන් පේන දේ ඇත්ත නෙමෙයි. මේ පේන දේ සත්‍ය නෙමෙයි. දැන් මේක ඔබ ටිකෙන් ටික හරි අවබෝධ කරන්න ඕනි නේද? මේ මනුෂ්‍ය භවයක් මේ මනුෂ්‍ය ප්‍රාණියෙක් විදියට මේ ශරීර කූඩුවකට මේ චිත්ත ස්වභාවය, මේ ඔබගේ ඔබ නොදන්න කථාවක් තියෙනව. මේකෙ තව ගැඹුරු පැත්තක් තියෙනවා. අපි මේක එකින් එක මාතෘකා අරගමු. ඉස්සරහට පැහැදිලි කර ගන්න

උත්සාහ ගමු. මේව නොදන්න අයට, මේවා ගැඹුරින් ගැඹුරට ගියෙ නැති අයට මේ අවිද්‍යාවෙන් දකින්න හැකියාවක් නොමැති අයට, මේ ඥාණ අවදි කර ගන්න බැරි වුන අයට මෙය පේන්නේ නෑ, දකින්න හැකියාවක් නෑ. දකින්න නම් මේ ඥාණ අවදි කර ගන්න ඕනි. මේ ඥාණයෙන් දකින්න ඕනි. ඥාණයෙන් ගැඹුරින් ගැඹුරට, මේ ඥාණ කියන්නේ මොකුත් නෙමෙයි, ඥාණ සකස් වෙන්නේ, සිතිවිල්ල නෙමෙයි ඥාණ කියන්නේ. සිතිවිලි කියන්නේ රැවටීම. රැවටීම මේ සිත රැවටීමයි සිතිවිල්ල. ඔබ කියනව මට රතු පාට පේනවා. මේ සිතිවිල්ලකි. ඔබ කියනව පොතක් පේනවා. අපි සාමාන්‍යයෙන් කතාකරමු උදාහරණයක් ලෙස පොත කියන්නෙම සිතිවිල්ලක්නෙ. සිතිවිල්ල කියන එක පොත කියන එක ඇත්තක් නෙමෙයිනෙ. ඒ පොත කියන එකත් බාහිර නැහැනේ. හතර මහ භූත අපිට පේන්නේ නැනේ. හතර මහා භූත අපිට දැනෙන්නේ නැනේ. අපිට පේන්නේ අපි හදා ගත්තු නාමයක්නේ. අපි කියනවා මේ 5000 කොළයක් තියෙනවා. පන්දාහෙ කොළයක් තියෙන්නේ හිතකනේ. මේ ලංකාවෙ නැතිව පිටරට සුද්දෙක් ආවා කියල, ලංකාව ගැන අවබෝධයක් නැති කෙනෙක්, එයා මේ භාෂාව දන්නේ නැනේ, එතකොට එයා දන්නේ නැනේ ඔය කියන එකක්වත්. අන්න ඒ වගේ මේ දැන ගත්ත දත්ත එකනේ, මේ චිත්ත ශක්තියක්නේ මේ තියෙන්නේ. ඒ අවබෝධය එක්ක ඇති වෙන්නේ චිත්ත ශක්ති ස්වභාවයක්නෙ. ඒ ස්වභාවය සත්‍යක් මත පදනම් වෙලා නැනේ. එතන ඇත්තක් නැහැනෙ. එතන තියෙන්නේ මායාවක්නේ. මායාවක් කියන්නේ, දැන් අපි කිව්වොත් මෙතන දුමක් තියෙනවා. ඒ දුම මායාවක්නේ. අපි හිතමු එක එක විදියෙ වලාකුළු, පොඩි පොඩි වලාකුළු එකතු වෙලා අහසේ එක එක රටා මැවෙනව. මේ වගේ එක එක රටා, හාවෙක්, අලියෙක් වගේ. වලාකුළු දිහා බලන අපට පේනවා සත්තු ටිකක්. සත්තු අහසේ ඉන්නවද? නෑ. නමුත් අපි කියනවා අන්න අර වලාකුළ

හරියට අලියෙක් වගේ. අර වලාකුල හරියට හාවෙක් වගේ. ඔය විදියට නේද මේ තරු රටා ගැන කියන්නේ ජෝතිෂය කරන අය ඔය රටා වලට නම් දාන්නේ ඔය විදියටනේ. දැන් මේවා කොහෙවත් නැනේ. මේ මායාවක්නේ. මේකනේ සංඛාරා කියන්නේ. සංඛාරා කියන්නේ ඔය මායාව. සංඛාර කියන්නේ මේ මායාවෙන් හැදෙන හැම එකම සංඛාරා. මායාව කියන එක නොදන්න කමමයි සංඛාරා කියන්නේ. වචනයක් කියන එක වචී සංඛාරා. වැඩක් කරන එක කාය සංඛාරයක්. මේක ඔබ මොනව හරි හිතන්න ගියොත් මනෝ සංඛාරයක්. මොකද දෙයක් කරගෙනයි මේ සේරම තියෙන්නේ. **තදංග පච්ච පස්සයා** කියල කියන්න හේතුව ඔබ මොකක් හරි දෙයක් කියනව. ඔබ කියනව අර හින්දු ආගමේ කියනවනේ මේ සේරම ශිව ශක්තියෙන් එන්නෙ කියල. ඉතිං ඕකත් සංඛාරයක්. ඇයි ශක්තිය කියන්නේ නැනේ ශිව ශක්තිය කියල. ශිව ශක්තිය කියන්නේ මිනිස්සු හදා ගත්ත නමක්නෙ. හින්දු කියන්නේ මේ හින්දු භාෂාව කතාකරන අයගේ උච්චාරණයක්. දැන් විදේශිය රටක අපි සුදු ජාතිකයෙකුගේ භාෂාවේ ඔය වචන නැනේ. ඒ ඉංග්‍රීසි භාෂාවේ තියෙන වචන වෙනයිනේ. චීන භාෂාවේ දැන් ඔය වචන නැහැනේ. ඒ භාෂාව වෙනයිනේ. එතකොට ඕක වෙන නම් වලින් කියන්නත් පුළුවන්නේ. එතකොට ඕක ශිව කියන්නම බැහැනෙ. ඉතිං ඕක ඔක්කොම භාෂාව. ශිව ශක්තිය කියල එකක් නැහැනේ. එහෙම එකක් නෑ. ඒක දා ගත්ත එකක්. ඒක හදා ගත්ත නාමයකි. ඒකයි සංඛාරා කියන්නේ. සංඛාරා කියන්නේ හදා ගත්ත එකක්. ඇත්තටම තදංග පච්ච පස්සයා කියන්නේ ලොකු කථාවක්. ඒ කියන්නේ මනසටනේ මේ හැම එකක්ම ස්පර්ශ වෙන්නෙ. එස්සනේ එන්නෙ. එතකොට ස්පර්ශයෙන් එන සියල්ලම සංඛාර ස්පර්ශ කොටස් කලාම, දැන් අපි ගත්තම ස්පර්ශයෙන් එන සියල්ලම සංඛාර. දැන් මෙතන මේ කථා හැම එකකම තියෙන්නේ බොහොම සරල තැනකට කෙටි කරල කියන්න පුළුවන්

සලායතන. ආයතන වලින් තමයි අපිට මේ හැම දෙයක් ම හදන්නෙ. ඒකයි සලායතන ලෝකෝ ලෝකෝ කියල කියන්නෙ. ඇස, කන, දිව, නාසය, කය මන කියන මෙන්න මේ ආයතන හයෙන් තමයි අපිට මේ හැම ලෝකෙම හැදෙන්නෙ. ලෝකෙ කියන්නේ මේ ඔක්කොටමනෙ. සේරොම හැදිල තියෙන්නේ, මේ සේරොම අපි හදා ගත්ත දෙයක්. අපි හදා ගත්ත දෙයක් තමයි සංඛාරයක් කියන්නෙ. භාහිර එහෙම ඒවා නෑ. පරම සත්‍ය දකින කෙනාට සංඛාර අවබෝධ වෙනව. සංඛාර අවබෝධ වුන කෙනාට පරම සත්‍ය අවබෝධ වෙනව. මේක ඉතාම මනාකොට බොහොම පිරිසිදුවට, බොහොම නිරවුල්ව කෙනෙකුට මේ ධර්මය අවබෝධ වුනාම ඔහු ඒක ධර්මයේම සත්‍යතාවයට පත් වුනාම, ප්‍රත්‍යක්‍ෂතාවයට පත් වුනාම, දර්ශන සමාප්පත්තියට පත් වුනාම බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන ඒ සත්‍ය ධර්මය, ඒ බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන ධර්මතාවය ඒක පරමාර්ථ සත්‍ය. අන්න ඒ සත්‍ය අවබෝධ කරන්නයි තියෙන්නේ. ඒ සත්‍ය අවබෝධ කරන්න පුංචි තැන ඉදල ඔබ කටයුතු කරන්න ඕනි. ඒකට හේතුවක් තියෙනවා. ඒක තමයි මේ සත්‍ය නොදන්න තාක් ඔබ මේ කථාව සම්මුතිය තුළ කියනවනම් මායාව තුළ කියනවනම් ඔබට අපි තව ඉස්සරහට වෙනස්ම පැතිකඩයන් ඔස්සේ වෙනත්ම මානෙකට පෙන්නනන්නම් ඒ කථාව. නැවත, නැවත, නැවත, නැවත මේ ශක්ති ස්වභාව සකස් වෙනව. ඒ ශක්ති ස්වභාව වලට අපි ආත්මීය, මේක මිනිස්සුන්ට පැහැදිලි කරන්න වෙනත් ක්‍රමයක් නැති නිසා කථා විදියට කියනව. ඒ කියන්නේ මේවා අපි රූප කථා, ශබ්ද කථා වලට හදාගෙන තමයි තව කෙනෙකුට මේ පණිවිඩය දෙන්නෙ. බුදුන් වහන්සේ පවා ඒක ඒ විදියට තමයි මැසේජ් එක පණිවිඩය දෙන්නෙ, කතා කරන්නෙ මිනිස්සුන්ට කියන්න වෙන ක්‍රමයක් නෑ. නමුත් ඒක එහෙම මිනිස්සු හිතන විදිහෙ, මිනිස්සු මෙහෙම කථා කරනවනෙ. ගැඹුරු මාතෘකා ගොඩක් තියෙනව. සමාජෙට ගැටගැහෙනව

ගොඩක් කියන්න ගියොත්. ගොඩක් දේ තියෙනව එහෙම කියන්න. ඔබට මේ සංඛාර ගැනෙන කථා කරේ. සංඛාර කියන මාතෘකාව ඇවිල්ලා විශාල මාතෘකාවක්. ඒක කියනවනම් පොඩ්ඩක් හරි, ඔබ දැන් බලන්න ඔබ ගාව ඉන්නවා පූසෙක් වාඩිවෙලා. ඔබ ගාව ඉන්නවා ගෙදර ඉන්න බල්ලා වාඩිවෙලා. එතකොට ගෙදර ඉන්න බල්ලත් ඉන්නව, පූසත් ඉන්නව ඔබ ළඟ. දැන් බලන්න ඔබ කියනව ඔබ ඉන්නෙ මනුෂ්‍ය ලෝකෙ කියල. බල්ලා ඉන්නෙ තිරිසන් ලෝකෙ. එතකොට තිරිසන් ලෝකෙයි මනුෂ්‍ය ලෝකෙයි තියෙන්නේ දැන් මෙතනම ද? හොඳට බලන්න කොතන ද තියෙන්නේ කියල. දැන් මෙතන බල්ල ඉන්නව ඔබත් එක්ක තිරිසන් ලෝකෙ. එතකොට ඔබ කියනව මම ඉන්නෙ මනුෂ්‍ය ලෝකෙ කියල. එතකොට බල්ල ඉන්නෙ තිරිසන් ලෝකෙ. එතකොට මේක ඔබේ ම සංඛාරයක්. මම ඉන්නෙ මනුෂ්‍ය ලෝකෙ කියන එකත් සංඛාරයක්. බල්ල ඉන්නෙ තිරිසන් ලෝකෙ කියන එකත් සංඛාරයක්. මේ මිනිස්සු හදාගත්ත සංඛාර. දැන් මේක ඇවිල්ල උච්ජේද ශාස්තෘත්වයට යන එකක් නෙමෙයි. ඒ කියන්නේ මේ මනුෂ්‍ය ලෝකයක් නෑ, දිව්‍ය ලෝකයක් නෑ, හැමදේම තියෙන්නේ මෙතනයි කියල කියන කථාවක් නෙමෙයි. ඒක බොළඳ කථාවක්නෙ. සාමාන්‍ය පෘථග්ජනයා මායාව තුළ ඉන්නව කියන, මායාවට හසුවෙලා රැවටිලා ඉන්නව කියල අපි කියන්නෙ නෑ. මේවා එතනට ගලපන්න එපා. අපි කියන හැම වචනයක්ම පෘථග්ජන භූමියේ සම්මුතිය තුළ තියෙන දෙයක් නෙමෙයි. ඒ සම්මුතිය අපි සත්‍ය පැත්ත පෙන්නල දෙන එකක් කරන්නෙ. සම්මුතිය ඇතුලෙ ඉන්න වෙනත් අයට මේක වෙන විදියට පේනව. කෙනෙකුට කියන්න පුළුවන්, එහෙනම් මේ තිරිසන් ලෝකෙත් මෙතනමයි තියෙන්නෙ. මනුෂ්‍ය ලෝකෙත් මෙතනමයි තියෙන්නෙ. සාමාන්‍ය ධර්මාවබෝධයක් නැති ධර්මය ගැන කිසිම අවබෝධයක් නැති කෙනෙක් කියන්න පුළුවන්නෙ දිව්‍ය ලෝකෙත් මෙතනයි තියෙන්නෙ, මනුෂ්‍ය

ලෝකෙත් මෙතනයි තියෙන්නෙ, අහසත් මෙතනයි තියෙන්නෙ, නිරයත් මෙතනයි තියෙන්නෙ. ඉතිං ඔය විදියට හිඟන්නෙක් පෙන්නල මෙතන තියෙන්නෙ මෙහෙම එකක් කියල. ඕක ඇවිල්ලා පෘථග්ජන භූමියේ මිථ්‍යාදෘෂ්ඨිය තුළ කියන කථාවක්. ඒක නෙමෙයි මේ අපි කියන්නේ. අපි කියන්නේ මීට ඊට වඩා මහා පරම සත්‍ය ගැඹුරු කථාවක්. මේක සංඛාරයක් කියන එක. මේ සියල්ල සංඛාර කියන්නේ මේ සියල්ල මනසක සකස් වෙන එකක්. මනසක සකස්වෙන එක නෑ කියනව නෙමෙයි. මේක අතිශයින් ගැඹුරුයි. අර රූප කලාප වලට මහා ගැඹුරින් අපි පැහැදිලි කලා වගේ. ලොකු දෙයක්, ලොකු පර්යායක් ඔබට පැහැදිලි කරන්න පුළුවන්. මේ සංඛාරා කථාව ඉතාම ගැඹුරුයි. මේ කථාව ඉතාම ගැඹුරුයි කියන්නේ ඔබ හිතනවනේ දිව්‍ය ලෝකයක් තියෙනවා කියල, අන්න එතන සංඛාරයක්නේ ඒක. ඒක භාහිරින් ඔබට හොයන්න බෑ. ඒක චිත්ත සංඛාරයක්. සංඛාරය තියෙනව කියන්නේ ඔබ එතන ඉන්නව කියන එකයි. මේක අතිශයින් ගැඹුරුයි. ඒ කියන්නේ එතකොට දිව්‍ය ලෝකයක් නෑ නෙමෙයි. මිනිස්සු හිතන දිව්‍ය ලෝකෙ නෑ. දැන් අපේ බෞද්ධ සමාජයටයි අනෙක් ආගම් වල තියෙන ඒ දෘෂ්ටිගත එකක්නෙ තියෙන්නෙ. ඒක ඇවිල්ලා දෘෂ්ටියක් නෙ. මෙතන බෞද්ධයා දෘෂ්ඨියකට යන්න හේතුවක් නැහැනෙ. නමුත් බෞද්ධයාට තියෙනවා. අතන දැන් ඇවිල්ලා දිව්‍ය ලෝකය මැව්වා කියන එකත් දෘෂ්ඨියක්නෙ. ඒකත් දෘෂ්ඨියකට යන්නෙ. දැන් මෙතන බෞද්ධයාට එහෙම එකක් නැහැනෙ. එතකොට බෞද්ධයාට තියෙන්නේ හේතු ඵල දහමක්නෙ. හේතුව නිසානෙ සකස් වෙන්නෙ. ඉතිං මේකත් ඒ වගේ හේතුඵල දහමක් තියෙන්නේ. මෙතන මේ සිත ඇතුලෙ සකස් වෙන හැම චිත්තයක්ම ශක්තියක්. දැන් රූප කලාප වල අපි එතන පෙන්නුවනෙ මහාභූත වල කෙලවරට කෙලවරට ගිහිං මහාභූතත් නෑ. ඒවා ඝනව දකින්න එපා, භෞතිකව දකින්න එපා, ශක්ති ස්වභාවයකට ම ගියානේ.

මහාභූතත් අභිබවා ශක්ති වලට ගියානේ. ඒකම තමයි මේ සංඛාරාවලට වෙන්නෙ. චිත්ත ස්වභාවය ඇතුලෙ ඔබ සිතන සංඛාරය කියන්නේ ශක්ති ස්වභාවයක්. ඒක එහෙම තමා අපට දැන් කියන්න වෙන්නෙ. අපිට දැන් මේවා ඔබ හිතන තැන අපි නෑ. අපි නිතරම සත්‍ය දකිනවා. සත්‍ය දකින කෙනාට දෘෂ්ඨියක් නෑ, ඔබ මේක කොහෙන් හරි කොහෙට හරි හිර කරොත් ඔබ ඉන්නව දෘෂ්ඨියක. ඔබට සත්‍ය අවබෝධ වෙනකම් මේවා එකක්වත් ගැලපෙන්නේ නෑ. විචිකිච්ඡාව සැකය තුලයි ඔබ ඉන්නේ. නමුත් මේ සියල්ල අවබෝධ වුණු කෙනෙකුට තමයි සියල්ලම ගැලවිලා කියන වචනය ඔබේ තියෙන ඒ ප්‍රමාණයටනෙ ඔබ ග්‍රහණය කර ගන්නේ. ඔබේ තියෙන අවබෝධ ප්‍රමාණයටනෙ ඔබ ග්‍රහණය කරන්නේ. ඔබට අවබෝධ වෙලා නැත්නම් ඒක ග්‍රහණය කරන්නේ දෘෂ්ඨියක් ඇතුළට වෙන්න පුළුවන්. බොහොම පරිස්මින් මේවා දකින්න. ඒ කියන්නේ ඔබ විස්වාස කලත් නොකලත් මේ අප ඉදිරිපත් කරන කාරණා මහා ඥානයකින් පරම සත්‍ය අවබෝධය තුළින් දේශනා කරන්නේ. ඒ සත්‍ය පොතක නෑ. ඒක පොතකින් ඔබට යම්කිසි සාරාංශයක් උකහා ගන්න පුළුවන් පොත තුළින්. නමුත් යථාර්ථය දකිනව කියන එක කවදාවත් පොතකට කරන්න බෑ. ඒක ඔබේම අභ්‍යන්තරයෙන් ඔබ දකින්න ඕන. ධර්මය භාහිර ඕපපාතික නෙමෙයි, ඔබේ අභ්‍යන්තරයට ධර්මය බවට පත් වෙන්න ඕනි. ඔබ කියල කෙනෙක් ඔබට නැහැ. ධර්මය බවට පත් වෙන්න ඕනි. ඒ තුළ ඔබට ඒ සත්‍ය ඔබට අවබෝධ වනතාක්, ප්‍රත්‍යාක්‍ෂවනතාක් ඔබට තියෙන්නේ සැකයක්. විස්වාසයක්. හැබැයි ඒක ප්‍රත්‍යක්‍ෂ වෙනව. ඒ කියන්නේ මේක ලුණු උපමාව වගේ තමයි. උපමාවෙන් තමයි කියන්න වෙන්නෙ භාෂාවේ තියෙන දෝෂ නිසා. ලුණු ඔබ කැවට පස්සෙදි ඔබ දන්නේ මේ ලුණු කියල. හැබැයි ඒක කාටහරි කියන්න ගියොත් ඔබට මොකද වෙන්නේ. අන්න ඒකයි ප්‍රත්‍යක්‍ෂතාවය. ඒ උපමාව බොහොම වැදගත් බුදුන් වහන්සේම දුන්

උපමාවක් මේ ධර්මය තුල. ඒක ඔබට ප්‍රත්‍යක්ෂතාවය අන්න ඒ හා සමානයි. ඒ කියන්නේ ඒක තව කෙනෙකුට කියන්න වෙන්නේ වචනයෙන් නමුත් ඒක වචනයෙන් කොහොමද පැහැදිලි කරන්නේ. නමුත් ඒක ඔබේ ප්‍රත්‍යක්ෂතාවය, ඒක ඔබේ අවබෝධය. ඒ තරම් මේක අති ගාම්භිරයි. අපි කියන්නේ නෑ අපි කියන එකම පිළිගන්න කියල. එහෙම කථාවක් නෑ. ඒකත් ඔබේම මානසිකත්වය. අපට එහෙම බාල බොළඳ අදහස් නැහැ. අපට තියෙන්නේ මේ ඔබ විසින් සත්‍ය ගවේෂණය කරනව නම් විමර්ශනය කරනව නම් මේ ඔබ සත්‍ය විමර්ශනය කරන ගමනට ඔබට යම්කිසි දෙයක් හිතන්න මේකෙ තියෙනව. මේ සත්‍ය ඔබට දැනුන ද, එහෙනම් මේක ඔබට ප්‍රීකුවින්ස් එකක්. ප්‍රීකුවින්ස් එකක් කීවම ඒකත් ලොකු මාතෘකාවක් දැන් මේ හැම මාතෘකාවක්ම ඉතාම ගැඹුරට අපි යනව. ඒක නිසා තමයි අපට හැම එකක්ම බාගෙට කියල ඉවර කරන්න හැකියාවක් නෑ. නමුත් අපි හැම එකෙන්ම කොටසයි කියන්නේ. මොකද මේකට යන කාලය ගැන අපට කියන්න බෑ. කාලය ගැන අපිට වැටහීමක් නෑ. ඒ කියන්නේ මේ ධර්මයට කාලයක් නෑ. එහෙම බැලුවමත් මේ ධර්මය කොයි පැත්තෙන් මේ භාෂාවෙන් කථාකලත් මේ භාෂාව නිල් (Nil) වෙනව. භාෂාවේ හැමතැනම දෝෂ ටික එළියට එනව. මේ ධර්මය කථා කරන්න ගියාම මේක අති සුන්දර මාතෘකාවක්. මේක පරමසත්‍ය අති සුන්දරයි. ඒක අහන්න අහන්න ප්‍රඥාවන්තයට මහා (විවරිතෝ විප්ටිතෝ) විවර කරන්න විවර කරන්න තව තව විවර වෙනව කියල. විජිටිතෝ විවරිතෝ කියල තියෙනවනේ. ඒ කියන්නෙ තව තව මේ ධර්මයමෙයි මේ කාරණා තියෙන්නේ. බුදුන් වහන්සේ දේශනා කරන සූත්‍ර වල තියෙන වචන තමයි අපි මේ කියන්නේ. අපි සම්පූර්ණම මේ ධර්මය අවබෝධ කර ගන්න අපිට පාදක වුනා බුදුන් වහන්සේ ඉදිරිපත් කරල තියෙන ඒ හැම දෙයක්ම අපි නිරීක්ෂණය කරන කොට අපි සාමර්ශනය කරන කොට අපි

තුලින් අපි මේවා හොඳින් යථාර්තයක් බවට අපිට මේක පත්වුණා. ඇත්තටම ඒක පත්වෙනව, සන්දිට්ඨිකයි. සන්දිට්ඨිකයි කියන්නේ තමන්ටම ප්‍රත්‍යක්ෂ වෙනවා. මේ කියන්නේ මේක අතිශය ප්‍රීකුවින්සි එකක් වගෙයි. දැන් අපි කිව්වොත් ඔබ විසින් යම්කිසි නාලිකාවක් අල්ලනව කියල හිතන්න. මේක ඉතාම වැදගත් මේ කියන උපමාව. මේක හැම පැත්තට ම ගැලපෙනව. එකක් මේක ඔබ යම්කිසි නාලිකාවක් අල්ලනව කියල හිතන්න. ඔබ දන්නව පරණ රේඩියෝ වල මීටරය කරකවල තමයි අල්ලන්නේ අර හර්ඩ්ස් 20 හර්ඩ්ස් (Zh) 105 වගේ මීටරය කරකවල අල්ලනව. එතකොට 125 zh, 104 zh අහවල් නාලිකාව, මෙහෙම කියල තරංග ඒකකයක් ගැන කියනව. එතකොට තරංගය තමයි අපි මෙහෙම ප්‍රීකුවින්සි කරල අල්ලන්නේ. ප්‍රීක්වින්ස් කරනව කියන්නේ අල්ලනවනේ මේ නාලිකාව එතකොට ඒ නාලිකාව අහුවෙනව. දැන් මේ විදියටනේ ටී.වී. එකේ උනත් අපි නාලිකා අල්ලන්නේ. පරණ ටී.වී. වල මේක හොඳට පේනව. මොකද ඒකෙ චැනල් අල්ලන විදියට. එතකොට ඒක ප්‍රීක්වින්ස් කරනවනේ. ඒ කියන්නේ ඒ නාලිකාව අපි ටියුන් කරනවනේ. අන්න ඒ වචනය හරි. ටියුන් කරනවනේ. මේ නූතන වචන අපි භාවිතා කරන්නේ උපමාවක් විදයට. දැන් අපි මේ ටියුන් කරන කොට අපි ඒ නාලිකාවම හරියට ප්‍රීක්වින්ස් කරනවනේ. ටියුන් කරනවනේ. මෙන්න මේක මේ කථාවේ පරම සත්‍ය තුළ ඇත්තටම ඔබ ටියුන් කරනව. ඔබ මේ ප්‍රීකුවින්ස් එකක් අල්ලනව. ඔබ නිවන් දකිනව කියන්නේ ප්‍රීකුවින්ස් එකක් අල්ලනව හා සමානයි. මේ උපමාවක් ගන්නේ. ඔබ මේ කියන වචන වල අවබෝධය යොමු කරන කොට මේව ඔබ තුළ ජීවමාන වෙනව. ඇතුලාන්තය ඔබම එන එන අරමුණු හැමදේම ඔබ ගලපලා බලනවා. ඔබ තුල ධර්මය ජීවමාන වෙන්න ගන්නව. සම්බෝධිය වැඩෙනව කියන්නේ ඒකටයි. සම්බෝධිය වැඩෙනව කියන්නේ ඔබ තුළ බෝධි අංග වැඩෙනව. ධර්මයෙන් ම ඔබ ධර්මය බවට

පත්වෙනව. එතකොට මේ පුද්ගල කථාව, මායාව, බොරුව ඔබට අවබෝධ කරන්නම වෙනව. ඒක නාමරූප හැදෙන හැටි හොඳට දකින කොටයි ඒක වෙන්නේ. එතකොට ඒක අවබෝධ කර ගත්තොත් තමයි ඔබට මේ කථාව හොඳට ලිහා ගන්න හැකියාව ලැබෙන්නේ. හැබැයි මේකෙන් වෙන්නේ යමෙක් මේක අවබෝධ කර ගන්නවනේ, බුදු කෙනෙක් ලෝකයට පහළ වෙනකම් කාටවත් මේ සත්‍ය අවබෝධ වෙලා තිබුණේ නැහැනේ. දැන් ගෞතම බුදුන් වහන්සේ, තථාගතයන් වහන්සේ මේ ලෝකෙට මේ ධර්මය අවබෝධ කර ගන්නකොට සිද්ධාර්ථ තාපසතුමා සම්මා සම්බුද්ධත්වයට පත්වෙනව කියන්නේ මේ පරම සත්‍ය අවබෝධ කර ගන්න එකනේ. සිද්ධාර්ථ තාපසතුමා ගයා ශීර්ෂයේ බෝධි මූලයේ අලුයම, තුන්යම, මැදියම ගිහිල්ලනේ මේ සත්‍ය අවබෝධ කර ගත්තේ.

# ★ 8 වෙනි පරිච්ඡේදය ★

## සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ච කරනඥාය සංඛාර උපේක්ඛා ගුණය

ඒව අල්ලන විදිය ඒක ෆ්‍රික්වන්ස් කරනව නේ ඒ නාලිකාව අපි ටියුන් කරනව නේ අන්න ඒ වචනය හරි. ටියුන් කරනව නොවේ. ඒ කියන්නෙ නූතන වචන භාවිතා කරනව කියන්නේ නූතන උපමාවකි. දැන් මේ ටියුන් කරනව කියන්නෙ නාලිකාවක් හරියට ෆ්‍රික්වන්ස් කරනව නේ. මේ කතාවෙ පරම සත්‍ය තුල ඇත්තට ම ඔබ ටියුන් කරනව. ඔබ ෆ්‍රික්වන්සි එකක් අල්ලනව ඔබ නිවන් දකිනව කියන්නෙත්

ෆ්‍රික්වන්ස් එකක් අල්ලනව හා සමානයි. ඒ උපමාවක් ගත්තෙ. උපමාවකින් පෙන්වන්නෙ ඔබ මේ කියන වචන ගැන අවබෝධය යොමු කරන කොට මේව ඔබ තුල ජීවමාන වෙනව. ඇතුලාන්තයට එන අරමුණු හැමදේම ගලපල බලනව. ජීවමාන වන පැත්තට ගලපල බලනව. සම්බෝධිය වැඩෙනව කියන්නෙ ඔබ ධර්මය බවට පත් වෙනව. බෝධි අංග බවට පත් වෙනව. බෝධි අංග වැඩෙනව. එතකොට මේ පුද්ගල කතාව මායාව බොරුව ඔබ අවබෝධ කරන්නම වෙනව. නාමරූප හැදෙන හැටි හොඳට දකින කොටය ඒක වෙන්නෙ. එතකොට ඒක අවබෝධ කර ගත්තොත් තමයි ඔබට මේ කතාව ලිහාගන්නට හැකියාව ලැබෙන්නෙ. හැබැයි ඒකෙන් වෙන්නෙ, යමෙක් මේ අවබෝධ කර ගන්නව නේ. දැන් බුදු කෙනෙක් පහළ වෙනකම් මේක කාටවත් මේ ගැන සත්‍ය අවබෝධ වෙලා තිබුණෙ නැහැ නේ. දැන් අපේ ගෞතම බුදුන් වහන්සේ තථාගතයන් වහන්සේ මේ ධර්මය ලෝකෙට අවබෝධ කර ගත්තෙ. එතකොට සිද්ධාර්ථ තාපසතුමා අපි එහෙම ගමු.

සම්මා සම්බුද්ධත්වයට පත් වෙනව කියන්නෙ මේ පරම සත්‍ය අවබෝධ කර ගන්න එක නේ. සිද්ධාර්ථ තාපසතුමා ගයා ශීර්ෂ බෝධි මූලයෙදි අලුයම, තුන්යම, මැදියම ඔබ දන්නව නේ කොහේවත් ගිහිල්ල නොවේ හිත තුලින් ම කාම භූමිය රූප භූමිය අරූප භූමිය කියන තුන් භූමිය ජය ගන්නව කියන්නෙ තෛලෝකනාථ කියන්නෙ තුන් ලෝකය ජය ගන්නව කියන්නෙ මේ තුන් ලෝකෙම ජය ගත්ත කියන්නෙ මේ සිත තුළින් නේ. මේ සිත නේ ඔබ ගාවත් තියෙන්නෙ. එතකොට මේ සිතම නේද මේ පරිජානාති කරගෙන තියෙන්නෙ. සිත නේද අවබෝධ කරගෙන තියෙන්නෙ. එතකොට සිතේ සත්‍ය නේද අවබෝධ කරගෙන තියෙන්නෙ. එතකොට සිතේ මායාව නේද දකින්නෙ. එතකොට පටිච්ච සමුප්පාදය කියන්නෙ සිත

හැදෙන හැටි නෙ නේද? එතකොට පටිච්ච සමුප්පාදය අවබෝධ කරනව කියන්නෙ සිත අවබෝධ කරන එක නෙ. සිත කියල දෙයක් නැති බවම නේද අවබෝධ වෙලා තියෙන්නෙ. අවසානයේ අවබෝධ වෙලා තියෙන්නෙ මේ සියලු ම දැන් රූප භූමිය කියන්නෙ සිතේම එක්තරා අවධියක්. අරූප භූමිය කියන්නෙ. සිතේ ම එක්තරා අවධියක්. එතකොට මේ තුන් භූමියම කියන්නෙ සිතේම එක්තරා අවස්ථා 3ක්. මේක මේ විදියට කිව්වොත් පර්යායට ගියොත් හෙම සිතේ රූපය කියන්නෙ සිතේම තියෙන රූප සංඥාව අරූපය කියන්නෙ සිතේම තියෙන රූප සංඥාව රූපය කියන්නෙ ඔබ. ශබ්ද රූප ගන්ධ රූප ඒ සංඥාව තුළ ඔබ රූපයක් කරගෙන ඉන්නව රූප සංඥාවක්. මේ සේරම සිතේ හැටි.

සිත ගැන කතා කරන විට මේ ස්වභාවයන් ටික ඔබට මතු වෙනව. මේක ඇතුලාන්තයෙන් ඔබට අභිඤ්ඤා සකස් වෙනව කියන්නෙ ඇතුලතින් ඇත්තට ම අපි ධර්මය තුළ ඔබට අහන්න ලැබෙනව ඒ වචන **''ප්‍රඥා භාවේ තබ්බං විඤ්ඤාණං පරිඤ්ඤෙයියං''** කියල ප්‍රඥාව කියන්නෙ, විඤ්ඤාණය කියන්නෙ සිත. ප්‍රඥාවෙන් තමයි විඤ්ඤාණය. සිත මායාවක් බව, සිත එතන එතන සකස් වෙලා නැති වන බව දැකීම, පවතින සිතක් නැති බව දැකීම. දැන් අනිත්‍ය දකිනව කියන්නෙ ඒක. අනිත්‍ය දන්නව කියන්නෙ මේ බාහිර බඩු මුට්ටු වල අනිත්‍ය නොවේ. එහෙම අනිත්‍යකුත් තියෙනව. නමුත් සිතේ අනිත්‍යය දකින්න ඕන. සිත අනිත්‍යය කියන්නෙ සිත කියල දෙයක් නෑ. ඒක මායාවක්. මායාවක් කියන්නෙ සකස් වුණ තැනම නැති වෙනව. **''අවුත්තා සම්භූතං උට්ඨානං භවිස්සති''** මේක අවබෝධ කරන්න ඕන. මේක කොහොමද වෙන්නෙ. මුලින් ම දැනගන්න ඕන. ඊට පස්සෙ අවබෝධ කර ගන්න ඕන. එතකොට ඒ එකම කතාවක් තමයි මේ සේරගෙන් ම කියන්නෙ. සිතේමය ලෝකය මැවෙන්නෙ.

''**චිත්තේන නීයති ලෝකෝ** '' කිව්වෙ ඒකයි. සළායතන ලෝකෝ ලෝකෝ සළායතන වලින් හැදුණ ලෝකය තමයි චිත්තය. ඒකයි ''**චිත්තේන නීයති ලෝකෝ**'' කියන්නෙ. එතකොට මේ පරම සත්‍ය අවබෝධ කරනව කියන්නෙ සිතමය අපි අවබෝධ කරන්නෙ. සිතේ සත්‍ය තමයි අපි දකින්නෙ. එතකොට සිත අවබෝධ කර ගන්නව කියන්නෙ සිතේ සත්‍ය දකිනව කියන්නෙ ඒ කෙනාට, කෙනෙක් හම්බ වෙන්නෙ නෑ. කෙනා නැති වෙලාම යනව. කෙනෙක් කියන මේ ස්වභාවය නැති වෙලා යනව. මෙතන අවබෝධ ඥාණයක් ඇති වෙනව. ඒ නාමයයි රූපයයි ගැටගැසීමයි. සිත හැදෙනව කියන්නෙ. ඒකයි අවබෝධ කරන්නෙ. ඒකයි විඤ්ඤාණය කියන්නෙ. විඤ්ඤාණය තමයි සිත කියන්නෙ. එතකොට ''**ප්‍රඥා භාවේ තබ්බං විඤ්ඤාණ පරිඤ්ඤෙයියං**'' කියන කොට ප්‍රඥාව කියන්නෙ මේ අවබෝධය. විඤ්ඤාණයේ අනිත්‍ය දකිනව කියන්නෙ ඕකට. විඤ්ඤාණය සකස් වෙන හැටි දකිනව. නාමයෙ සහ රූපයෙ නාමය රූපය දකිනව නම් තමයි නාමය මොකක්ද රූපය මොකක්ද, මේ 2 එකතු වෙලා කොහොමද විඤ්ඤාණයක් හැදෙන්නෙ. කියල දකින එක තමයි. විඤ්ඤාණයෙ අනිත්‍ය දකිනව කියන්නෙ. එතකොට මේ 2 වෙන් වන විට විඤ්ඤාණය නැතිව යනව. ඒක නැති වන බව දැනෙන්නෙ මේ ප්‍රඥා භාවේ තබ්බං විඤ්ඤාණං පරිඤ්ඤෙයියං කියන කොට ඒ ප්‍රඥාව කියන්නෙ විඤ්ඤාණ සිත අනිත්‍ය දකින එකයි. ප්‍රඥාව කියන්නෙ ඒකම. දැනෙන්නෙ කොහාටද විඤ්ඤාණය කියල එකක් නැති නම් සිත කියල එකක් නැති නම් මේක දැනෙන්නෙ කොහාටද? ඒ දැනෙන දැනීමයි ඥාණය. ඥාණය කියන එකේ මූලික අවස්ථාවට ගියාම ඥාණය කියන්නෙ මොකක්ද කියල බලන විට සතිය වඩන විට මූලික අවස්ථාවට ගියාම මූලික අවස්ථාවෙ සිත විසිරෙනව. සිතට එන අරමුණු සිත විසිරෙන එක නවත්වන්න අපි ''සති'' කමටහන වඩනව. එතකොට සති කමටහන කියන්නෙ සිත

විසිරෙන එක අරමුණකට සීමා කරනව. එක නිමිත්තක ගැටගහනව ආශ්වාස ප්‍රාශ්වාස නම් ඒ සති නිමිත්තට ගැට ගහනව. බුද්ධානුස්සතිය බුදු රූපෙට ගැට ගහනව. ඒ වගේ අපි යම්කිසි එක අරමුණකට නිමිත්තකට එන එන සිත එකම නිමිත්තට ගැටගැසීම, විසිරෙන්නෙ නැතිව තබා ගැනීම තමයි ''සති'' නිමිත්ත වඩනව කියන්නෙ. මේ කරන්නෙ අපි අර යුද්දෙට යන්න ආයුධයක් හදා ගන්නව වගේ වැඩක්. ඒ කියන්නෙ උපමාවක් මේ සිත දකින්න සිත විසිරෙන කොට බෑ. සිත වැහිල තියෙන්නෙ. සිතුවිලි වලින්. සිතිවිලි වැඩි නම් මේ සිත දකින්න බෑ. එතකොට සමාධිය අවශ්‍ය වෙන්නෙ, ඔන්න ඔය නිසයි. එතකොට සිත දකින්නෙ ගැඹුරු ඥාණය අවධි කර ගන්න තමයි. ඒක අවශ්‍ය වෙන්නෙ මෙතන අපි කතා කරන්න ගියේ ඥාණය තියෙන්නෙ එතකොට ඥාණය කියන්නෙ ''සති නිමිත්ත'' මෙහෙම වඩනව නම් එක දවසක් හරි මෙහෙම වඩන කෙනෙකුට එයාට දැනෙනව මේ කියන එක. ඒ ''සති'' නිමිත්ත අල්ලනකොට සිහිය හුස්ම වදින තැනට සිහිය පිහිටුවනව හොඳට බලන්න. තොල අග වදින තැනට සිහිය පිහිටුවනව. අන්න ඒ ''සිහිය'' පිහිටන එක සිහියකින් හුස්ම වදින හැටි දැනෙනව. ඒ දැනෙන්නෙ සිතුවිල්ලට නොවේ. එතන සිහියක් පිහිටනව. මෙතන ආශ්වාස ප්‍රාශ්වාස දිග ලෙස කොට ලෙස **''දීඝංවා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති රස්සංවා, අස්සසන්තෝ පස්සංවා අස්සසිස්සාමිති පජානාති''** කියන එක වෙනමය සිහිය වෙනමය නිමිත්තට සිත කියන ස්වභාව 2ක්. මේක සිතුවිල්ල මේක සිහිය. සිහියයි නුවණයි 2ක්. මේක ස්වභාව 2ක්. ඒ කියන්නෙ ඔබේ සිතට සිතුවිල්ලක් ඇති වෙල නැති වුණ බව දැනෙන්නෙ ඥාණයට. ඒක සිහිය ඒ සිහිය කියන එක ගැඹුරු කතාවක්. ඒකෙන් තමයි ඔබ නිවන් මග යන්නෙ. ඒකෙන් තමයි ඔබට මේ ඥාණ අවධි වෙන්නෙ. සත්‍ය දකින්නෙ. ඥාණ අවධි වෙන්නෙ සත්‍ය දකින්නෙ ඔබගෙ මේ එන එන සිතිවිලි ඇතිවන නැති වන හැටි දකින

එක නේ විපස්සනාව. එන එන සිත දකින එක නේ සිත ඇති වන නැතිවන ප්‍රවාහය දකින එක තමයි විපස්සනාව. විදසුන් නුවණ කියන්නෙ එක අරමුණක් දිහා නුවණින් දකිනව. එතකොට මේ එන එන සිත දකින්නෙ සිහියෙන්. ඒක ඥාණය. ඥාණ තමයි අවධි වෙන්නෙ. මේ ඥාණ කරා යන ගමන තමයි මුලින් ම සිහියය නුවණය කියන්නෙ. මුලින් ම ඥාණය කියන වචනය එතනට ගන්න බැහැ නේ. සිහිය නේ තියෙන්නෙ. සිහියනේ පවත්වන්නෙ. එතකොට ඒ සිහිය තමයි ඊට පස්සෙ එයාට තියෙන අවබෝධය තමයි නුවණ. ''සිහියය නුවණය'' තමයි ගමන යන්නෙ. එතකොට ඒ ගමන තමයි, ගමන යනකොට මේ දෙන විපස්සනාවට එනකොට ඥාණ පැත්තටය එන්නෙ. විපස්සනාවට එන විට දැනගත්ත ධර්මය ගලපගන්න ඕන. දැනගත්ත ධර්මය ගලපන්න ගියාම තමයි, මේ ධර්මතාවය දකින්න ගියාම තමයි එතන තමයි ඥාණ අවධිවෙන්නෙ. එතනින් තමයි මේ එන අරමුණේ සත්‍ය දකින්නෙ. එතනය ඥාණ අවධි වෙන්නෙ.

එතකොට ඥාණයට හේතු වෙන්නෙ සිහියයි නුවණයි තමයි. සිහියම තමයි ඥාණ බවට පත් වෙන්නෙ. එතකොට මේ ඥාණ තමයි අභිඤ්ඤා බවට පත් වෙන්නෙ. මොකද මේ ඥාණ කියන්නෙ දැන් විපස්සනාවට එන විට ඥාණ අවධි වෙනව කියන්නෙ මේක ඇවිල්ල අපි සම්මුතියෙ කතා කරන වචන නමුත් මේව සංකාර නමුත් මේ අපි මේ තුල මනසිකාරයම මනසිකාර කරන එකින් මුදවන්න උත්සාහ කරනව. ඇත්තම කිව්වොත් අපි මේකට මේක නැති කරන්නය යන්නෙ. මේකෙන් මේක නැති වෙනව. එකෙන් මේක නැති වෙනව. සිත සිතින් නැති වෙන්න ඕන. සිතින්ම භාවිතා කරලයි. එහෙම තමයි කියන්න වෙන්නෙ.

මේ ඥාණය අවධි වෙන්නෙ දර්ශන ඥාණය තියෙන කෙනාට. දර්ශනය කියන්නෙ තමන් දැනගන්නව මේ

ලෝකය ඇත්තක් නොවේ කියල. දැනුමට. ''**විනෙයිය ලෝකේ අභිඥ්ඥා දෝමනස්සං**'' ලෝකය ඇත්තක් නොවේ කියල දකින කෙනාගෙ දුක්ඛ දෝමනස්සයන්ගෙන් මිදෙන්නෙ, සතර සතිපට්ඨාන සූත්‍රය පටන් ගන්නෙම ''**කායේ කායානුපස්සී විහරති විනෙයිය ලෝකේ අභිඥ්ඥා දෝමනස්සානං පස්සී විහරති. දුක්ඛ දෝමනස්සං අත්තගමාය ඥායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ච කිරියාය**'' කියල නේ කියන්නෙ. එතකොට ''**විනෙයිය ලෝකේ වේදනා වේදනානුපස්සී විහරති දුක්ඛ දෝමනස්සානං අත්තගමාය සෝක පරිද්දවානං සමතික්කමාය**'' එතකොට මේ **විනෙයිය ලෝකේ චිත්තෙ චිත්තානුපස්සී විහරති දුක්ඛ දෝමනස්සානං අත්තගමාය දුක්ඛා දෝමනස්සානං අත්තගමාය ශෝක පරිද්දවානං සමතික්කමාය විනෙයිය ලෝකේ ධම්මේසු ධම්මානුපස්සී විහරති** පැහැදිලිව තියෙනව. එහෙමනම් මේ විනෙයිය ලෝකේ කියන්නෙ පැහැදිලිවම ලෝකය සත්‍යයක් නොවන බව දැකීමය.

ලෝකය සත්‍යයක් නොවේ. සතර සතිපට්ඨානය වඩන්නෙ ලෝකය ඇත්තක් නොවන බව දකින්නය. ලෝකය ඇත්තක් නොවන බව දකිනව කියන්නෙ මේ අපි දකින ලෝකය ඇත්තක් නොවේ. ඒක දකින්නය සතර සතිපට්ඨානය අවශ්‍ය වෙන්නෙ. සතර සතිපට්ඨානය වඩන කොට කායානුපස්සනාව ආනාපානසති භාවනාව වඩන විට ධාතු මනසිකාර වඩන ආකාරයට ඒ වගේම ඔබ දකින ඉන්ද්‍රිය භාවනා ඉරියාපථ භාවනාව නව සිවථිකය මේ කෙනාගෙ කෙනාගෙ විදියට තමයි කෙනාට කෙනාට බුදුන් වහන්සෙ දේශනා කරන්නෙ. මේ රූපයෙන් මිදෙන්න. රූපයෙන් මිදෙන්නය කායානුපස්සනාව වඩන්නෙ. රූපය තමයි අපි අල්ලගෙන ඉන්නෙ. රූපය කිව්වම ගැඹුරු මාතෘකාවක්. රූපය කීවම කයත් රූපයමය. බාහිරත් රූපමයි. රූප කියන්නෙ ඒක විශාල කතාවක්. අපි ගොඩක් පැහැදිලි කරල

තියෙනව රූප කාණ්ඩ 28 ම රූප කලාප වලට ම ගිහිල්ල. ගැඹුරට පැහැදිලි කරගෙන යද්දි ඔබට පැහැදිලි වුණා මෙතන රූප කලාප වලින් ප්‍රසාද රූප කලාපයක් හැදෙන හැටි ගන්න කොටම බුදුන් වහන්සේ පෙන්වනව ඒක මනා කොට රුප්පන්ති කෝ ආවුසෝ රූපං වදේති රුප්පණය වන අර්ථයෙන් රූපය පනවනව. රුප්පන්ති කෝ ආවුසෝ රුප්පං වදේති කියන කොට පේනව රුප්පණය වන අර්ථයෙන් රූපය පේනව නේද කියන කොට කුමකින් රුප්පනය වේද කියන කොට උණුසුමින් රුප්පණය වෙනව. සීතලින් රුප්පණය වෙනව. ප්‍රසාද රූපයකින් රුප්පණය වෙනව. සමුට්ටානං කීවම රුප්පණයෙන් තමයි ප්‍රසාද ටික හැදෙන්නෙ. රුප්පනයක් තමයි ප්‍රසාද රූපයකින් වෙන්නෙ. චතු සමුට්ටාන වලින් කම්ම චිත්ත ඍතු ආහාර කියල බෙදල රූප කලාප 54 එතන දී මේ ශුද්ධාෂ්ටකය නේ මේ හැම එකකටම ගන්නෙ. මේ ශක්ති ස්වභාවයක් තමයි. උණුසුමින් රුප්පණය වෙන එක තමයි කම්ම චිත්ත ඍතු කියන්නෙ. මේ ශුද්ධාෂ්ටකයෙ තියෙන්නෙ මේක එහෙම තියෙන එකක් නොවේ. දැන් ශුද්ධාෂ්ටකය ගත්තම එහෙම එකකුත් නෑ. ශක්ති ස්වභාවය කොහෙවත් තියෙන එකක් නොවේ. මේක ස්වභාවයක් සොබාදහමක් වගේ. මේ කියන හැම වචනයක්ම වරදිනව ඒකට හේතුව මේ වචන සම්මුතිය තුල අන්තයක් තියෙනව. නමුත් මේ කියන පැහැදිලි කිරීම් වල ඒ තියෙනව කියූ අන්තය නොවේ. සකස් වෙනව කියන ස්වභාවයක්. මේක තියෙන්නෙ. ඒක අන්තයෙන් තොරයි. අන්තයක් නෑ කියන්නෙ එක්කෝ තියෙනව එක්කො නෑ කියන එක නේ. අන්තය කියන්නේ එහෙම එකක් නොවේ. මේ හේතු තියෙන කොට හටගෙන හේතු නැති වෙන කොට නැති වෙනව. මජ්ජේ ඥාණං කියන තැන. මජ්ජේ ඥාණං කියන තැනින් කතා කරනව කියන්නෙ මේ අන්ත වලින් මිදුණ තැනකින් ධර්මය දේශනා කරනව කියන එකයි. අන්ත වලින් මිදුණ තැනකින් ධර්මය දේශනා කරනව කියන්නෙ මහා ධර්මතාවය

ම එළියට එනව කියන එකයි. මහා ධර්මතාවය කියන්නෙ අන්ත නැති තැන. මේ භාෂාව පවා පෙන්වන්න පුලුවන් අන්ත නැති තැන. මේ භාෂාවෙ අන්ත තියෙනව. දැන් එතකොට අපි අසරණ වෙලා තමයි මේ එළි කරන්නෙ. බුදුන් වහන්සේ පවා බුද්ධත්වය ලබලා මේක කොහොමද මිනිසුන්ට දේශනා කරන්නෙ කියල හිතන්න ගත්ත. ඇත්තට ම මේ අන්තයක් නැති ස්වභාවය පුදුම වෙහෙසක් ගන්නව එදා බුදු සමය තුළ බැලුවම ජටිලයො නිගන්ටයො බ්‍රහ්මයො බැලුවම තනිකරම දෘෂ්ටිගත අන්තවාදී දෘෂ්ටි වල හිටියෙ. බ්‍රහ්ම ලෝක මහා බ්‍රහ්මය මවල තිබුණ කියන ලොකු කතා තිබුණා. ඉතින් ඒව එක පාරට ම නෑ කියන්න ගියාම ගැටෙනව. කවුරුත් පිළිගන්නෙ නෑ. ඒ නිසා බුදුන් වහන්සෙ ඒව නෑ කියනවට වැඩිය ඒවත් එක්කම ගියා. ඔවුන්ව ගන්න තමයි මෙහෙම කලොත් මෙහෙම වෙනව දිව්‍ය ලෝක කතා බ්‍රහ්ම ලෝක කතා දැන් සමාජයේ ඉන්න අය මුල් කෑල්ලක් අරන් කියන්නෙ. අග මුල මැද හොඳට ගලපල බණක් කියනව කියන්නෙ ඒ බුදුන් වහන්සේ මුලින් පෙන්වන එක නොවේ අවසානයට පෙන්වන්නෙ.

බුදුන් වහන්සේ මුලින් ම දාන ගැන කියන කොටත් දානය තිරිසන් සතාට දෙන දානය උසස් කොටත් දුසිල්වතාට දෙන දානය ඊට වඩා උසස් කියල පෙන්වල, ඊට පස්සෙ සිල්වතාට දෙන දානය උසස් කරල පෙන්වල, මහත්ඵල මහානිසංස උතුමන්ට දෙන දානය උසස් කියල පෙන්වල, බුදුන්ට දෙන දානය උසස් කියල පෙන්වල මගඵල ලාභීන්ට දෙන දානය උසස් කියල පෙන්වල නැවැත්තුවෙ නෑ. උන් වහන්සෙ මේ ඔක්කොම කියන්නෙ මේව පොඩි දේවල් මේ ඔක්කොම කියල ලොකු දෙයක් කියන්නෙ. මේ ඔක්කොටම වඩා මේ සිත එක මොහොතක් දැකල මිදෙනව නම් එයයි මහණෙනි උතුම් කියල දාන ගැන කියල කියන්න උත්සාහ

කරන දේ තමයි ධර්ම ධානය දාන 1000ක් දෙනවට වඩා උතුම් කියල කියනව.

ධර්මය කියන්නෙ මේ සිත සත්‍යක් නොවන බව දකින එක. ඒ තමයි ධර්මය. ඒ ධර්මය තමයි බුදුන් වහන්සේ මේ දෙන්න යන්නෙ. ඒක දෙන්න බෑ. මේ මිනිසුන්ට. එදා බුදු සමයට ගියාම මනසින් හරි කෙනෙක් මේව හරි පුංචි දේවල්. ඔය පොත් ටික සංයුක්ත නිකාය 1, 2, 3 බැලුවම හොඳට පේනව. පෘථග්ජන කෙනෙක් පොතක් ලීවොත් ඒකෙ කොහෙවත් බුදු බණ නෑ. පෘථග්ජන දෘෂ්ටියෙ ඉන්න කෙනා කොහොමද දෘෂ්ටියක් නැති දෙයක් කියන්නෙ. ඉස්සෙල්ල දෘෂ්ටියෙන් මිදෙන්න ඕන. දෘෂ්ටියෙන් මිදෙන්න බෑ. මේ ධර්මය අවබෝධ වෙන්නෙ නැතිව. ධර්මය අවබෝධ කරගන්න ඕන. එහෙනම් ඔහු ධර්මය අවබෝධ කර ගන්න කොට ධර්මතාවය දකිනව. එතකොට පුද්ගලභාවය සම්පූර්ණ බිඳ වැටෙනව. කෙනෙක් නැති ස්වභාවය දකිනව. ඔහුගේ නමවත් ඒ රූපයවත් භාවිතා කරන්න උත්සාහ කරන්නෙ නෑ, ඒකට හේතුව එහෙම දෙයක් නෑ. ඔහු ස්වභාවය දකිනව. මේ ස්වභාවය තුළ හේතු ඵල දහම දකිනව. ඇති වන නැති වන ස්වභාවය තුළ ස්වභාවයක් පමණය කියල දකිනව. රූපයකින් කිසිම ඵලක් නැති බව දකිනව. බාහිර රූපයක්වත් ඔහුට බරක් නැති වෙනව. මෙතන එහෙම කතාවක් නෑ. අවබෝධ වුණ කෙනාට ඔය ඔක්කොම නිකම් පුංචි දරුවො මොන්ටිසෝරි යන දරුව මුකුත් දන්නෙ නෑ. පුංචි දරුවට උ/පෙළ, සා/පෙළ කරන්න බෑනේ. ''අ'' යන්නෙ ඉඳල අකුරු ටික දෙනව. ඊට පස්සෙනේ විභාගයක් දෙන්නෙ. ඒ වගේ තමයි අද ධර්ම දේශනා කරන්නෙ ඇත්තට ම බොළඳයි. ධර්මයේ ගාම්භීර පැත්තට යන්න බැරි අය ධර්ම දේශනා කරන්න හොඳ නෑ. ඒකට හේතුව මේ මිනිසුන්ට බුදුන් වහන්සේ අභිඥ්ඥාලාභීන්.

ඇත්තට ම බුදුන් වහන්සේ අභිඥාලාභීන් නේ. බුදුන් වහන්සේට හැමදේම තිබුණ. බුදුන් වහන්සේට මහා ඥාණ නිකං අවධි වුණේ නැනෙ. මේක මුලින්ම ලෝකෙට දේශනා කරනව කියන්නෙ ඒ මහා ඥාණ අවධි වෙනව නේ. එහෙම නැතිව කියන්න බැහැනේ. අභිඥා සකස් වෙන්න ඕන නේ. ඒ අභිඥාවෙන් කියන දේ මේ නිකං හිතකින් කියන දේ නෙවෙයි නේ. සිතකින් නෙවෙයි නේ සිතුවිල්ලක් නෙවෙයි නේ අභිඥා.

අභිඥා කියන්නෙ ප්‍රත්‍යක්‍ෂතාවයට දැනෙන දෙයක්. ඒ ප්‍රත්‍යක්‍ෂතාවයට දැනෙන දේ සිතුවිල්ලක් වෙන්නේ නෑ කවදාවත්. සිතුවිල්ලක් සත්‍යක් නොවන බව දැකීම තුළ තියෙන්නෙ මහා ගාම්භිර අර්ථයක්. එතන සිතක් නෑ, පුද්ගලයෙක් නෑ. කෙනෙක් නෑ, එතන ඉඳන් කෙනෙක් දකිනව කියන්නෙ අභිඥාවක්මය. වෙන මුකුත් නෑ එතන සිතුවිලි කතා නෑ, ඒ සත්‍ය එවැනි පුද්ගලභාවයෙන් නේ කතා කරන්න වෙන්නෙ. එතකොට කියන්න වෙනව නේ කෙනෙක් කියල. තතාගතයන් වහන්සේ නැතිනම් බුදුන් වහන්සේ පුද්ගලයෙක් හැටියට නේ සම්මුතියෙ පෙන්වන්නෙ. මේක භාෂාවෙන් නේ කියන්න වෙන්නෙ. නමුත් එතන එහෙම දෙයක් නොවේ තියෙන්නෙ. ධර්මය එතන පෙන්වන්න. බුදුන් වහන්සේ ඒකයි කීවෙ මධ්‍යම ප්‍රතිපදාව බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන්නෙ නෑ. අන්තයකට ගිහිල්ල. මධ්‍යම ප්‍රතිපදාවෙන් තමයි ධර්මය දේශනා කරන්නෙ. ත්‍රිපිටකයෙ බැලුව ඒ විදියට පාලි භාෂාවෙන් ගැඹුරු දෙයක් පෙන්වනව. පටිච්ච සමුප්පාදය අද බොළඳ විදියට දේශනා කරනව. මැරුණට පසු කියල එහෙම දෙයක් බුදුන් වහන්සේ දේශනා කරල නෑ. බුදුන් වහන්සේ මේ පටිච්ච සමුප්පාද දහම හැම තැනම පෙන්වනව. අපට ඕන නම් සංකාර විදියට ඕන විදියට හදා ගන්න පුළුවන්. එහෙම ඕන නම් මැරුණට පස්සෙ මෙහෙයි ඉන්නකම් මෙහෙමයි. කර්ම පලය

මෙහෙමයි මෙහෙම වෙනව කියල ලස්සණ කතාවක් හදන්න පුළුවන්. ඇත්තට ම අපි හදපු අපි ලියපු සමහර පොත් මුද්‍රණයටවත් දාන්නෙ නෑ. ඒකට හේතුව ඒව දාන්න සුදුසු නෑ, ඒවා මුළු සමාජයට ම ගැටෙනව. මේක පරම සත්‍ය අභිඥ්ඥාවෙන් දකින ආකාරය වෙනයි. ඒ දකින විදිය ලීවම ඔය කර්ම ඵල පුදුම ආකාරයට දකින්න පුළුවන්. ඇයි මෙහෙම දෙයක් කියන්නෙ කියල නමුත් ඔබ ඔය හිතන ආත්මීය ස්වභාවයෙන් දකින මේ කර්ම ඵලය නොවේ. ඊට වැඩිය ගැඹුරු කතාවක් තියෙනව. ඔබ නැවත සකස් වන ආකාරය. ඔබ කියල කෙනෙක් නැතිව මේ කතාව කියන්න පුළුවන් නම් ඒක තමා වඩා හොඳ. ඒ සකස් වන ආකාරය ඒ ශක්ති ස්වභාවය සකස් වෙවී යනව. මේ විදියට පැහැදිලි කරගෙන යද්දි ගොඩක් අයට ගැටලු සහගත තැන් එනව. ගොඩක් අයට මේකෙ වටිනාම දේ ගන්නෙ නැතිව යනව. මේකෙ වටිනාම අර්ථයක් තියෙනව. අපි කියන හැම තැනකම. ඉතින් මේ ගැඹුරුම කතාව අපි ඉදිරිපත් කරන්න ඕන. ඒක තමයි වැදගත්. මේ සිත හැදෙන හැටි තමයි ඇත්තට ම මේ ධර්මය තුළ ධර්මය වෙන්නෙ. සිත හැදෙන හැටි. එතනදි දැන් අපි දිගට ම පැහැදිලි කරගෙන ආපු පරියාය දැක්කම ඔබට පේනව සිත හැදෙන්නෙ නාමයයි. රූපයයි එකතුවෙලා. එහෙම තමයි මහා නිදාන සූත්‍රයෙ පෙන්වන්නෙ. එතකොට එතන තමයි අපි ඉන්න ඕන තැන. යන්න ඕන පාර දිශානතිය හඳුනගන්න ඕන. මහා නිදාන සූත්‍රයෙ ඒ කාරණාව තමයි නාමරූප පච්චයා විඤ්ඤාණං කියන්නෙ. එතකොට පටිච්ච සමුප්පාදයේ සිත හැදෙන හැටි පෙන්වන්නෙ. සිත හැදෙන හැටි නොදන්නකම ඒකම තමයි මෙතන සංඛාර එහෙම නැතිනම් අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං කියල පටිච්ච සමුප්පාදය කියල දකින්නෙ. මේ අවිද්‍යාව නිසා තමයි සංඛාරා හැදෙන්නෙ. සංඛාරා කියන්නෙ ගිණිවලල්ල කැරකෙනව වගේ ගිණිබෝලය, ගිණි වලල්ල කියන්නෙ

මායාවක්. මායාව තමයි සංඛාරය. එතකොට මෙතන කෙනෙක් ඉන්නවද කෙනෙක් ඉන්නවද කියන එක තමයි. අපි මේ විදියට ගත්තොත් පුංචි දරුව ප්‍රභාෂ්වර සිතය. ප්‍රභාෂ්වර සිතේ මුල් අවස්ථාව කොහොමද? ප්‍රභාෂ්වර සිතට ප්‍රභවය මූලය පුංචි දරුවට සම්මුති ප්‍රඥප්ති නෑ. මුකුත් නෑ. ඒ කියන්නෙ පුංචි දරුවට නාමයක් රූපයක් නෑ. මේක මේකය කියන්න සම්මුති නාමයක් පුංචි දරුවට නෑ. පුංචි දරුවට රූපෙකට නාමයක් නෑ, හැඩතල වලට නම් නෑ. පුංචි දරුව දන්නෙ නෑ නේ. පුංචි දරුව ඉරහඳ අඳුරන්නෙ නෑ. පුංචි දරුවට රූපෙට නාමයක් නෑ. පුංචි දරුවගෙ ස්වභාවයට ගියාම අපට පේනව අවිද්‍යාව මේ පුංචි දරුවට නාම රූප නැති නිසා නොදන්නකම නිසා අවිද්‍යාව නිසා, මේ සත්‍ය නොදන්නකම නිසා ගැටගැහිලා. දන්න කෙනාට මේක පේන කෙනාට ගැටගැහෙන්නෙ නෑ, අවසානයට ගියාම දැන් විද්‍යාවට ගියාම මේක සත්‍ය දකිනව නේ. සත්‍ය දකින විට බාහිර තියෙනව කියන එක එයාට එන්නෙ නෑ නෙ. හිතන දේ තමන්ගෙ සිතුවිල්ල බාහිර නෑ කියල දන්නව නේ. පොත කියන්නෙ සම්මුතියෙ හදාගත්ත එකක් නේ. එතකොට ඒක බාහිරින් නෑ නේ. සතර මහා භූත නේ. අන්න ඒක දන්න කෙනාට ගැටගැහෙන්නෙ නෑ නෙ. එයා දන්නව නේ රූපෙට ගැටගැහෙන්නෙ නෑ නෙ. මේ නාමය බාහිරයට යන්නෙ නෑ, යන්නෙ නෑ කියන්නෙ නාම රූප ගැටගැහෙන්නෙ නෑ. ගැටගැහෙන්නෙ නෑ කියන්නෙ විඤ්ඤාණ සිත උපදින්නෙ නෑ. සිත උපදින්නෙ නෑ නොවේ. සිතට අවස්ථාවක් නැතිව යනව. මේ සිස්ටම් එක දිගට ම සිද්ධ වෙනව. සිස්ටම් එකේ බලගැන්වීම නැතිව යනව. ඒ සිස්ටම් එකේ බලය නැති වෙනව. සිතුවිල්ලකට අපි රැවටිලානේ ඉන්නෙ. 5000 කොළයක් තියෙනව කියල, දේවල් තියෙනව කියල රැවටිලා නෙ ඉන්නෙ. මේක අවබෝධ වන විට එයා රැවටෙන්නෙ නැනේ. වටිනාකමක් තියෙනව නේ රැවටීම තුළ. ඒක නිසානේ වටිනාකම දැනෙන්නෙ. මේක මට ඕන කියල

හිතෙනව. රාගයක් ඇති වෙනව. ආසාවක් ඇති වෙනව. මේකට ඇලෙන ගතියක් එනව. තණ්හාවක් උපදිනව. මේ ඇලෙන ගතිය නැති වෙනව නේ. ඒ ඇලෙන ගතිය නැති වන විට තණ්හාව නැති වෙනව. සිතේ රාගය නැතිව විරාගයට එනවනේ. එතකොට ඒ සිතින් පලක් නෑනේ. ඒක නිකං හරයක් නෑ නේ. නාමයක් නැති බව ශූන්‍යතාවයට එනව නේ. බාහිරත් එහෙම දෙයක් නැති බව දකිනව නේ. ඒ ගැටගැහෙන්නෙ නෑ නේ. විඤ්ඤාණයෙ දැනගැනීම තියෙන්නෙ ශූන්‍යයි කියල නේ. දෙයක් නෑ කියල නේ. නෑ කියන තැනක විඤ්ඤාණයට ඉඩක් නෑ. කරන්ට එකක් උපදින්නෙ. තියෙනව කියල ගන්න නෑ නේ. එතකොට නේ ශක්තියක් උපදින්නෙ. මෙතන ශක්තියක් උපදින්නෙ නෑ නෙ. මේ අන්ත 2 නැති වෙනව ඇති වෙන කොට මේ ශක්තිය නැති වෙනව නේ. දෙපැත්තෙන්ම මිදිල නේ එතකොට ශූන්‍යතාවය නේ. එතකොට නේ මේකෙ මේ වටිනාම තැන සිතින් මිදීම අවබෝධයෙන් මිදීම. එතකොට මිදෙන්නෙ එහෙම නේ. ඒ මිදීමට නේ අපි යන්න ඕන. එතකොට සත්‍ය දකින කෙනා කියන්නෙ විද්‍යාව තියෙනව නම් සංකාර එන්නෙ නෑ නේ. එතන සත්‍ය තියෙනව නේ. රැවටීම නෑනේ. හැම චේතනාවක් ම සංඛාරයක් නේ. හැම එකක් ම බාහිරින් යන්නෙ නෑ. සංඛාර හිතේම නේ හටගන්නෙ. ඒක අන්තයකට ගන්න බෑ. සංඛාර කියන්නෙ සිතේ ස්වභාවයක්. ඒක බාහිරට ගන්න බෑ. ඒක දෙයක් නොවේ නෙ. මේක ඔබට හොඳට පේන්න ගන්නව. පුංචි දරුවට සංඛාර නෑ. සංඛාර පනවන්න බෑ. අවිද්‍යාව නෑ. ඇත්තට ම අවිද්‍යාව තියෙනව. නාමරූප ගැටගැහෙන්නෙ නැතිවෙන කොට සංඛාර නැතිවන එකයි. මෙතන තියෙන්නෙ. එතනයි නැත්තෙ. පුංචි දරුව සාසවීයයි. ආශ්‍රව වලට හිතයි. ඒ නිසා නාමරූප ගැටගැහෙනව. සාසවීයයි කියන්නෙ, ආසම කියන්නෙ කෙලෙස් නේ. එතකොට ලෝභ ද්වේශ මෝහ සිත් නේ කෙලෙස් කියන්නෙ. ඇලෙනව ගැටෙනව නාමයයි

රූපයයි ඇති වුණොත්. තියෙනව කියල දෙයක් හමු වුණොත්. තිබුණොත් මෙතන මම ඉන්නව. අන්ත 2ක් හමුවෙනව. එතකොට අන්ත 2 හමු වුණ තැන තමයි මෙතන සිතත් ස්පාක් වෙන්නෙ. බාහිර තියෙනව කියල ගත්ත තැනයි මම ඉන්නෙ.

මෙතන මම ඉන්නෙ. එතකොට කණ්ණාඩියට දෙයක් වැටෙනව නේ. කණ්ණාඩියට දෙයක් වැටෙන කොට ආලෝකය නිසා නේ කණ්ණාඩියට මේ ස්පාක් එක වෙන්නෙ. කණ්ණාඩියට අපට දෙයක් පේනව නේ. නමුත් කණ්ණාඩියෙ පේන දේවල් නැහැනේ. නමුත් අපි අරගන්නෙ කණ්ණාඩියෙ තියෙනව කියල. නමුත් කණ්ණාඩියෙ එහෙම දෙයක් නෑ. කණ්ණාඩියෙ තියෙන්නෙ ප්‍රතිබිම්බයක්. අපි ඇසුරු කරන්නෙ බාහිරයක් නොවේ. අපි ඇසුරු කරන්නෙ කණ්ණාඩියට වැටෙන එක නේ. ඒක තමයි කණ්ණාඩිය. අපි ඇහැ කියන්නෙ. කණ්ණාඩිය ඇස නම් අපි ඇසුරු කරන්නෙ බාහිරින් හමු වෙන්නෙ නෑ. කොළපාට රතුපාට කියල කෙනාට කෙනාට ඇසේ ස්වභාවයට නේ පාට මතු වෙන්නෙ. ඇසේ ස්වභාවයට නේ රූප මතුවෙන්නෙ. ඒක බාහිරට හොයන්න බෑ. තමන්ගෙම සිතේ නේ හටගන්නෙ. එතකොට මෙන්න මේක තමයි සිත කියන්නෙ. මේක බාහිර ආලෝකයට එන හැඩතලයට තියෙනව කියා ස්පාක් එක තමයි චිත්ත ස්පාක් එක. බාහිර මෙහෙම දෙයක් තියෙනව කියල කණ්ණාඩියට වැටෙනව. මෙතන කතා කරන්න ඕන තැනක්. බාහිර දෙයක් තියෙනව කියල ඒ කියන්නෙ පුංචි දරුවට මේ හැඩතලය එතකොට මෙතන බාහිර ශබ්ද දානව. අම්ම අම්ම කියල අපි ඒ විදියට මේක ලිහාගෙන ගියොත් පුතේ මේ අම්ම මේ අයිය පුතේ මේ අක්ක මෙතන සංඥා ස්වභාවයක් අම්ම කියන්නෙ සංඥාවක් වර්ණය හැඩතලය එක්ක එකට යනව. එතකොට මේ සංඥා ස්වභාවය ආපු එක තමයි මේ සංඛාරා ස්වභාවය ගිණිවලල්ල වගේ. වෙනම

ස්වභාවයක් එතන එතන ඇති වෙනව. නැති වෙනව. මේ එනව ඉවරයි. ආයෙ එනව යනව. ඔය ශබ්දයම තමයි. එතකොට ප්‍රතිරාවය වගේ එතන අම්මා මෙතන අක්කා අයියා ශබ්ද එනව නේ. ඒ ස්වභාවයම තමයි මම. මෙතන වෙන්නෙ අතන ස්පාක් එකම බාහිර ස්පාක් එක ශබ්දය ගැටගැහෙන එක. චිත්ත නියාමය ඒක ඍතු නියාම බීජ නියාම කම්ම නියාම වගේම මේ චිත්ත නියාමයත් මේක ස්වභාවික සංසිද්ධියක්. මේ ස්වාභාවික සංසිද්ධියේ වර්ණ ශබ්ද මේව එකතු වෙලා සංසිද්ධිය සංසිද්ධියම තමයි මම කියන්නෙ. එතනමයි මේ ශක්ති ස්වභාවය තියෙන්නෙ දැනෙන ස්වභාවයක් තියෙනව. දැනෙන ස්වභාවයක් නෑ, මෙතන තමයි ඉපදෙන ස්වභාවයත් එතනමයි. ජාති ධම්ම සූතයේ කියනව නේ බුදුන් වහන්සේ ඉපදීම පෙන්වනව. ජාතිය හටගන්නෙ කොතනින් ද කියල. බුදුන් වහන්සේ පැහැදිලි කරනව ඛන්ධානං විනතුතාවෝ ආයතනානං පටිලාභෝ අයං වුච්චති ජාති කියල. එතකොට මෙතන ඇසේ උපතය මහණෙනි කණේ උපතය මහණෙනි ආයතන වල උපතය උපත ආයතන වල උපත නිසා ස්කන්ධය නිසා වේදනා සංඥා කියන මේ දැනෙන ස්වභාවය නිසා ආයතන හැදෙනව. ආයතන පටිලාභය නිසා තමයි තියෙනව කියන එක හැදෙන්නෙ. තියෙනව කියන එක අපි මේ කතා කරන්නෙ භාෂාවකින්. ඒක අවිඤ්ඤාණකයි. ඒක ශක්තියක්. සවිඤ්ඤාණක කතාවක් නොවේ. ඒක ශක්තියක්. ආත්මීය දෙයක් නොවේ. දැන් ශබ්දයයි හැඩතලයයි එකට යනව කියන්නෙ තවත් ශබ්දයක් හැඩතලයක් ඊට වඩා වෙනස් විදියට එනව. ඒ ශබ්දය ඒ හැඩතලය මේ ශබ්දය මේ හැඩතලය තවත් ශබ්දයක් හැඩතලයක් එනව. ඒ ශබ්දය ඒ හැඩතලය පරණ රීල් එකේ නෙගටිව් එක ගන්න. එහෙම නැතිනම් උපමාවකට කාටුන් එකක් ගන්න. පිටු 200 ක පොතක දුවන ළමයෙක් ඇඳලා පිටු පෙරලන විට දුවනව පේනව. දුවනව වගේ සංසිද්ධිය මොකක්ද පිටු පෙරලගෙන

එන විට මේ ළමය දුවනව වගේ පේනව. සංසිද්ධි තව අඳින්න පුළුවන්. අඬ අඬා ඉන්න. හිනාවෙන එකක් මේ ඔක්කොම රූප නේ. මේව එකතු වෙලා නේ කාටූන් එක හැදෙන්නෙ. කතාවක් නේ. කාටූන් කියන්නෙ රූප වැටෙන එක නේ. ඒකට ශබ්දයක් එනව නේ. ඔය සිද්ධිය තමයි ඔච්චරය ඕක තමයි සිත කියන්නෙ. ඒ තමයි ස්පන්දනයත්. ගිණිබෝලෙ කැරකෙන විට ගිණිවලල්ල පේනව නේ. ගිණි වලල්ලක් කියල එකක් නැහැනේ. අපට එහෙම එකක් පේනව නේ. ඒ වගේ මේකත් වේගයක් එක් වෙලා හැඩතල ශබ්ද අතින් ඒවත් එක්ක එනව. ත්‍රිමාණ වෙනව වගේ. ස්වභාව එනව. උණුසුම සීතල ගන්ධ නව ඔක්කොම එකතු වෙනව. ඒක ශුද්ධාෂ්ටකයේ කතාව. පඨවි ආපෝ තේජෝ වායෝ වර්ණ ගැන රස ඕජා එකට ම කතාව යනව. එකම ස්වභාවයක් ලොකු කතාවක් එකම ශක්ති ස්වභාවයක්. කියන්නෙ ඔය ඔක්කොම ගන්ධයක් කියන්නෙ ශක්ති ස්වභාවයක් රූප රූපය කියන්නෙ ශක්ති ස්වභාවයක්. ශබ්ද රූපයක් කියන්නෙ ශක්ති ස්වභාවයක් නේ.

# ★ 9 වෙනි පරිච්ඡේදය ★

# නාමරූප පරිච්ඡේද ඥාණය
# පෙර නොඇසූ විරූ දහම

එතන පෙන්වන්නෙ රූප වැටෙනව වගේ එකක් නේ. එතන ශබ්දයත් එනවනේ. ඔය සිද්ධිය තමයි තියෙන්නෙ. ඔච්චරයි. ඕක තමයි හිත කියන්නෙ. ඒකමයි ස්පන්දනයත්. දැන් ගිණි බෝලෙ කැරකෙන විට ගිණි වලල්ලක් පේනව නේ. ගිණි වලල්ලක් කියල එකක් නැහැ නේ. එහෙම එකක් පේනව නේ. ඒ වගේ මේකත් එකට එක් වෙල ශබ්ද හැඩතල ඒවත් එක්කම එනව ත්‍රිමාන වෙනව තව ස්වභාව එනව. උණුසුම සීතල ගඳ ඔක්කොම එකතු වෙනව. ඒකයි ශුද්ධාෂ්ටකයේ කතාව. පඨවි ආපෝ වර්ණ ගන්ධ රස ඕජකතාව එකටම මේ කතාව යනව. එකම ස්වභාවයක්. ප්‍රසාද රූපයක් තියෙන්න. මේක ලොකු කතාවක්. සත්‍ය ස්වභාවයත් ඕකම තමයි. චිත්තයේ තියෙන්නෙ. ඒ කියන්නෙ ගන්ධ රූපයක් තියෙන්නෙ ශක්ති ස්වභාවයක්. රස රූපයක් තියෙන්නෙ ශක්ති ස්වභාවයක් නේ. ශබ්ද රූපයක් තියෙන්නෙ ශක්ති ස්වභාවයක් නේ. ශබ්ද වල ප්‍රසාද රූපයක් තියෙනව නේ. එතකොට චක්ඛු ප්‍රාසාද රූපය වගෙම ප්‍රසාද රූපයක් තියෙනව නේ. එතකොට ඝාන ප්‍රසාද රූපයක් තියෙනව. ජිව්හා ප්‍රාසාද රූපයක් තියෙනව. මොකක්ද මේ එතකොට තියෙන ප්‍රසාදය. ප්‍රසාදය ස්පාක් එකක්. ඒක විතරයි. ස්පාක් එකක්. ස්පාක් ගොඩක් එකතු වුණොත් මොකද වෙන්නෙ. දැන් මේ ස්පාක් ගොඩක් එකට කැරකුණොත් මොකද වෙන්නෙ. අර ගිණි බෝලයක් කැරකුණා වගේ ඒකෙ ශබ්දත් ආවොත් මොකද වෙන්නෙ. දැන් ඔබ පෙරහැරේ දකින ගිණි බෝලය කැරකෙන කොට

වෙන ගිණි වලල්ලේ ශබ්දයක් ආවොත් මොකද වෙන්නෙ ඔන්න දැන් මේකෙ ඒක තියෙනව. ඒ හැඩතල වෙනමම. මේ ස්පාක් එක එතන එතන මනැති වෙනව නේ. නැතිවුණාට පස්සෙ ආයෙ එකින් එක සම්බන්ධතාවයක් නෑ මේ කතාවෙ. මෙතන ලොකු ගැඹුරු කතාවක් තියෙන්නෙ. ඒ කියන්නෙ ඒක සිද්ධියක් ඒ සිද්ධිය විතරයි. එක ස්පාක් එකක් විතරයි. ඒ කියන්නෙ මෙතන දැන් මේ පැත්තෙ බිත්තිය දකිනව. කියන්නෙ ස්පාක් එකක් මේ පැත්ත බලන කොට පොත පේනව කියන්නෙ වෙනින් ස්පාක් එකක්. හැබැයි මේ පැත්ත බලන කොට ආයෙ බිත්තිය පේනව මේ පැත්ත බලන කොට ආයෙ පොත පේනව. ආයෙ මේ පැත්ත බලන කොට බිත්තිය තියෙනව. ආයෙ මේ පැත්ත බලන කොට ආයේ පොත පේනව. දැන් මේ වටයක් කැරකෙ කොට ඒක තියෙනව වගේ හිතනව. හැබැයි එතන ඇති වන නැතිවන චිත්ත ස්වභාවයක් නමුත් තියෙන එකක් වගේ ඊට අමතරව මේක අල්ලන කොට තද ගතියක්. ඊට පස්සෙ ඇලෙන ගතියක් තියෙනව. ඊට පස්සෙ තද ගතියක් ඔය වගේ තියෙනව නේ. ඊට පස්සෙ මේකෙ ශබ්දයක් තියෙනව රූපයත් තියෙනව. තද ගතියකුත් තියෙනව ත්‍රිමාණ වෙනව. දැන් ඔබ කණ්ණාඩියක් දානව නේ ෆිල්ම් හෝල් එකකට ගිහිල්ල. ඔය දැන් අලුතින් හදල තියෙන ෆිල්ම් තියෙනව නේ ඔය 3D, 4D, 7D කියල එක එක විදියට හදනව නේ. දැන් මේ කණ්ණාඩිය දැම්මම ෆිල්ම් එක තිරය නොවේ. ළඟට ඇවිල්ල ඔබේ ගාව ඔක්කොම වෙනව. ත්‍රිමාණ වෙනව. නමුත් එතන තියෙන්නෙ කණ්ණාඩියක්. ෆැන්ටසි වර්ල්ඩ් එකක් හැදෙනව නේ. දැන් අපි ඉදිරිපත් කළා දැන් අලුතින් හදන ගේම් වල කණ්ණාඩිය දැම්මම ඒක ඇතුලෙ ජීවමාන වෙනව. ඒකම තමයි එයාට හිතෙන්නෙ ඊට පස්සෙ එයා වෙනින් වෙනින් ග්‍රහලෝක වල යනව සත්තුත් එක්කල මෙහේ කතා හදනව. ත්‍රිමාණ හදනව. ඊට පස්සෙ ගේම්ස් වල තියෙන්නෙ කණ්ණාඩි දැම්මම ෆැන්ටසි වර්ල්ඩ් එකක් පැය ගණන් එයා ඒක ඇතුලෙ ඉඳල

ආයෙ ඒ කණ්ණාඩිය ගැලෙව්වට පස්සෙ ටික වෙලාවක් ඒකම වගේ පේනව. අර කතාව ඇතුලෙම තමයි ඉන්නෙ. අර හීනයක් දකිනව වගේ. දැන් ඔබ හීනෙ ඇතුලෙ ඉන්නකම් ඔබට පේන්නෙ හීනෙ ඇත්ත වගේ නේ. හීනෙ කිසිම වෙලාවක හිතෙන්නෙ නෑ නෙ බොරුවක් කියල. හීනෙ ඇතුලෙ ඉන්නකම් හීනයක් කියල හිතෙන්නෙත් නෑ නේ. හීනෙ ඇතුලෙ දාඩිය දාගෙන සමහර වෙලාවට ගහගෙන මරාගෙන ඔක්කොම වෙනව නේ. ඒක චිත්තයක් නේ. මේකත් ඇත්ත ලෝකයක් චිත්තයක් විතරයි. මේක චිත්තයක්. චිත්තයක් හැදෙන එකක් චිත්තයක් සකස් වන එකක්. ඇති වන නැති වන චිත්ත ස්වභාවයක්. චිත්ත ප්‍රවාහයක්. මේක සිතක් කිව්වට එහෙම එකක්. දැන් මේක ආත්මීය එකක් නෑ. ඒකම තමයි අපි ඉන්නෙ. අපි හීනෙම තමයි ඇත්ත ලෝකෙ ඉන්නෙ. දැන් අපි ටී.වී. එක දිහා බලාගෙන ටී.වී. එකේ කතාවක් යනව. ටී.වී. එකේ හොඳ කෙනෙක් ඉන්නව. නරක කෙනෙක් ඉන්නව. අරය එයාව මැරුව. ටී.වී. එකේ දැන් ඔබ අඬනව ඔබට හරි දුකයි. ෆිල්ම් එක ඉවර වෙලා. ෆිල්ම් එකේ දුක සමහර වෙලාවට එයාගෙම ඇතුලාන්තය කොයි තරම් දුක් විඳිනවද ෆිල්ම් එකක් ගියාට. එතකොට ෆිල්ම් එකේ කොහොමද මෙයා දුක් විඳින්නෙ. ඒක වීදුරු පෙට්ටියක් නේ. වීදුරු පෙට්ටිය කියන්නෙ පින්තූර ටිකක් නේ. වීදුරු පෙට්ටියක පින්තූර ටිකක් යනව. මෙන්න මෙයා අඬනව. මෙයාට දරාගන්න බැරුව මෙයා සිය දිවි නසාගන්න තරම් හිතෙනව. වීදුරු පෙට්ටියක් දිහා බලාගෙන. මෙයා ජීවත් වුණේ එතකොට කොහේද? මොකක්ද මේ ලෝකය. ඕක සිතේ නේ තියෙන්නෙ. මේක සිතුවිලි. සිතුවිලි කියන්නෙ චිත්ත. චිත්ත කියන්නෙ බාහිර තියෙන එකක් නොවේ. මේක ගලවන්න. ඔබ හිතුවට ඔය එළියෙ තියෙන එකක් නොවේ. හිතන එකක්. ඒක දැන් ඔබ මේව ගොඩක් එහාට එහාට ලිහාගෙන යන්න ඕන. මේ හැම එකක් ම වැදගත් කතා කරන හැමදේම ගලපන්න ඕන. එන එන හැම සිතම

ගලපනව කියන්නෙ ඔක්කොම ලිහන්න ඕන. ලිහ ලිහ යන්න ඕන. එතන එතන ලිහෙනව. එතන එතන ලිහෙනව කියන්නෙ ඔන්න දැන් අරමුණක් එනව. ඔබ දැන් මේ පැත්ත බලන කොට අපි කිව්ව මේ බිත්තිය පේනව. ඊට පස්සෙ මේ පැත්ත බලන කොට පොත පේනව. මේ පැත්ත බලන කොට මල පේනව. ඒ පාර පුටුව පේනව. ආයෙ බලන කොට දැන් මෙතන බිත්තිය සුදු පාටය. සුදු පාට කියන එකේ වේදනා වින්දෙ සුදු. එතකොට වේදනා සංඥාව සුදු කියල දැනගන්නෙ සංඥාවෙන්. එතකොට වේදනාව වින්දෙ. එතකොට ඒකම තමයි සංඛාරය කලින් ශබ්දයට හැඩතලය එන කොට සංඛාරය වෙනව. එතකොට දැනගන්නෙ විඤ්ඤාණය. මෙතන සිහිවෙනව. මේ පැත්ත බලන කොට සංඥාවට නමක් එනව බිත්තිය කියල. කෝල් එකක් දීල කවුරුහරි කියනව තැඹිලි තියෙනවද කියල අහනව. එතකොට තැඹිලි ගෙඩියක් මතක් වෙනව. ශබ්දයක් එනකොට රූපයක් එනව. ඒ කොහොමද එන්නෙ. අන්න ඕක තමයි මුල ඉඳන්ම ස්පාක් වෙවී එනව. ඊට පස්සෙ ශබ්ද එනකොට රූප එනව. රූප එනකොට ශබ්ද එනව. ශබ්ද එනකොට රූප එනව. මෙතන කෙනෙක් කරන එකක් නෑ. මේ සිස්ටම් එක තව තව හොඳට බලාගෙන ගියාම නැවත නැවත මේ විදියට රූප ටික දානව. දැන් කාටූන් එක හදන කොට දාන රූප අනුව නේ ඒ ළමය දුවනව පේන්නෙ. එහෙම නැත්නම් ඒ ළමය උඩ පනිනව පේනව. දාන රූප අනුව වෙනස් කරන්න පුළුවන්. මේ විදියට ඔබට මෙතන එන එන රූප. දැන් රූපෙන් නේ මේක හැදෙන්නෙ. අපි කාටූන් එකෙන් ලොකු කතාවක් පේනව. අතන ළමයෙක් දුවනව. මේව ඔක්කොම ඇත්ත ලෝකෙ වගේ පේනව නේ. අරව කරනව මේව කරනව. ඔය කාටූන් එකක් නොවේ. කතාවක් නෙ පේන්නෙ. අපට පින්තූර කියල හිතෙන්නෙ නැතුව අපි සිත ඇතුලෙ කතාවක ඉන්නෙ. සමහර විට අපි ඉන්නෙ වාඩිවෙලා. සමහර විට ඉන්නෙ බලාගෙන. නමුත් හිත

ඇතුලෙ ලොකු කතාවක්. ඒකම තමයි මේ සිස්ටම් එකේ තියෙන්නෙ. ඒ කියන්නෙ දැන් ඔබ මේ පැත්ත බලන කොට බිත්තිය පේනව නේ. ආයෙ මේ පැත්ත බලන කොට පොත පේනව නේ. ආයෙ මේ පැත්ත බලන කොට බිත්තිය පේනව නේ. දැන් ඔබට අර බිත්තියෙ දැක්ක එතකින් ඉවරයි නේ. ඔබේ සිත මිදුණ නේ. දැන් ඔබ දකින්නෙ වෙන එකක් නේ. එතනින් ඉවරයි නේ ඔබේ සිත මිදුණ නේ. දැන් ඔබ දකින්නෙ වෙනින් එකක් නේ. එතකොට අර සිත නැහැ නේ. මේ සිතනේ. ඒක වෙනයි මේක වෙනයි. දැන් ආයේ බලන කොට තියෙනව එතකොට මොකද වෙන්නෙ කලින් දැකපු පොත තාම තියෙනව. දැන් හැමදාම තියෙන පොතක් තියෙනව. පොත ජීවත් වෙනව. බිත්තියත් තියෙනව. දැන් ඒ වගේ අනිත් ඒවගෙත් අරකත් තියෙනව මේකත් තියෙනව. ඔක්කොම දැන් ස්පාක් කියල තියනව. තේරෙන්නෙ නෑ, මෙතන මේ වේගයක් තියෙන්නෙ. වේගය තුල අර කැරකෙනව ගිණි වලල්ලක් වගේ හොඳට කැරකෙනව. දැන් ශබ්ද රූප ගන්ධ හොඳට කැරකෙනව. මේ ඔක්කොම දැන් තියෙනව. දැන් ආත්මයත් තියෙනව. මේ ආත්මය කියන්නෙ ඕකට වෙන මොකවත් නොවේ. ඕක දෘෂ්ටියක්. ආත්මය කියන්නෙ තියෙනව කියන එක. තියෙනව කියන එක ආවෙ අර රූප වැටිච්ච නිසා. රූප වැඩිය වැටිච්ච නිසා ආපු සංඥාව ඒ සංඥාව තමයි බලගැන්විලා තියෙන්නෙ. මෙතන කරන්ට් එකක් තියෙන්නෙ. විඤ්ඤාණය ඉපදෙන එකක් තියෙන්නෙ. එතන එතන ඉපදි ඉපදි නැති වෙනව. කොහෙවත් තියෙන එකක් නොවේ. දැන් මේක කොහේ හරි තියෙනව නම් දෙයක් බවට පත් වෙනව නේ. එහෙම දෙයක් නෑ. නමුත් අපි දෘෂ්ටියක් හදාගෙන. අපට දෘෂ්ටියක් හැදෙනව. ඒ දෘෂ්ටිය තමයි ආත්මය කියන්නෙ. දැන් නැවත නැවත රූප ටික දානකොට කාටුන් හැදෙනව වගේ. නැවත නැවත කමල් කමල් කමල් කියල ඔබ කමල් වෙනව. හොරා හොරා හොරා කියල හොරා හැදෙනව නේ. බලනකොට

හොරකම් කරල නැහැ නේ. අන්න ඒ වගේ ප්‍රතිකම්පන ශබ්ද ධ්වනියක් මේ තියෙන්නෙ තරංගයක්. අපි හිත කියල ධ්වනියක්. තරංගයක්. ඒක ශබ්දයක්. රා කිව්වොත් ඒක ශබ්දයක්. මා කිව්වොත් ඒක ශබ්දයක්. ශබ්දය ධ්වනියක් මෙතන තියෙන්නෙ. තරංගයක්. ශක්තියක් ශක්තියක් කියන්නෙ ශබ්ද ශක්තියක් එක්කල යන්නෙ. මේකෙ ඇත්තට ම දැන් වර්ණය ගත්තත් ඇත්තට ම ශක්තියක්. තරංගයක් නේ. ශබ්දය ගත්තත් තරංගයක් නේ. එතකොට ආලෝකය අපි කියනව ලෝකයේ වේගය ආලෝකය පෙන්වන්නෙත් තරංගය. රශ්මිය පෙන්වන්නෙත් තරංගය සේරම එකම න්‍යාය නේ. දැන් හර්ඩ්ස් 20-20,000 කියන්නෙත් තරංගයක්. එතකොට ආලෝකය ගත්තත් තරංගයක් එතකොට හැමදේම තරංග නේ ගන්නෙ. ශක්ති ස්වභාවයක් නේ. ශබ්දය මනින්නෙත් හර්ඩ්ස් වලින් නම් දැන් මේ අනිත් ඒවත් ඔක්කොම ෆ්‍රික්වන්ස් නේ. ඔක්කොම තරංග නේ. මේ තරංග සිස්ටම් එකම තමයි මේ. මේක අපට අවබෝධ කර ගන්න අමාරුයි. ඒකට හේතුව මේක අප දැන් තරංගයක් නේ. ශබ්දයක් නේ. මේ ශබ්දය පුදුම විදියට දැන් මේ මායාව ඇත්ත වෙලා. මේ මායාව ලිහෙන්න නම් හොඳට ලිහ ලිහ තව තව හොඳට නිරීක්ෂණය කරන්න ඕන. සම්මර්ශණය කරන්න ඕන. සම්මර්ශන ඥාණය කියන්නෙ ඒක නේ. මේක හොඳට දකින්න ඕන. මේක ඇතුලෙ තව ලොකු දෙයක් තියෙනව. හොඳට දකින්න. ඒකට හේතුව දැන් ඔබ මේ රූපං රූපත්තාය සංකතං අභිසංකරෝති කියන එක පොඩි කතාවක් නොවේ. එය අභිසංකරණ සූත්‍රවල මේ පෙන්වන කතා පොඩි දෙයක් නොවේ. මේ ඔබට ස්කන්ධ සූත්‍රය, උපාදාන ස්කන්ධ සූත්‍රය, එතකොට මේ අභිසංඛරන් ගැන තියෙන සූත්‍ර දිහා විමර්ශනය කරල බැලුවොත් බුදුන් වහන්සේ පෙන්වන්නෙ මොකක්ද කියල බැලුවොත් ඔබට තේරෙයි මෙතන විපරිනාමයකුත් පෙන්වනව. ඒ කියන්නෙ දැන් මේ ගිණි වළල්ල කැරකෙනවනේ. ගිණිවළල්ල කැරකෙන කොට එතන

ගිණිවළල්ලක් නෑ නේ. සංඛාර තියෙන්නෙ එතන ශබ්දයක් නේ තියෙන්නෙ. හැඩතල නෙ පෙන්වන්නෙ. ශක්ති ස්වභාවයක් කියල නේ. එතකොට මේකත් මේ කරකැවිල්ල ඇතුලෙ වෙනස් වෙනව. ඒක තමයි මේකෙ අවබෝධ කරගන්න ඉතාම අසීරුය. මේක හොයාගන්න බැරි තරම්. මේක අවසානයේ වෙනස් ම කතාවක් තියෙනව. ඒ කියන්නෙ දැන් මේ සංඥාවක් ඉපද නිරුද්ධ වෙලා තව සංඥාවක් ඉපිද නිරුද්ධ වෙනව කියල තමයි කියන්නෙ. **සික්ඛා එකා උප්පජ්ජති සික්ඛා එකා නිරුජ්ජති** මේ ධර්මය තුළ අහන්න ලැබෙන වචන මේ කියන්නෙ. ඒ කියන්නෙ මේක වෙනස්. විපරිනාමය වන එකකි. ඇති වෙලා ඒක නැති වෙන කොට වෙනස් වෙලා ඉවරයි. මේක වේගයෙන් සිද්ධ වෙන එකක්. ඒකෙන් තමයි මේ අපේ සෛල වුණත් මේක සොබා දහමේ සංසිද්ධියක්. මේකෙ තියෙනව සොබාදහමේ සංසිද්ධියක්. ඒ කියන්නෙ මේ සෛල ඇයි දිරන්නෙ. ඇයි මේ සෛල වෙනස් වෙන්නෙ. ඇයි මේ සෛල එතකොට පුංචි දරුව ඉපදිල ආහාරයෙන් ප්‍රත්‍ය කරගෙන මේ දරුව මේ විදියට ලොකු වෙලා දැන් මේ ගහක් වුණත් එහෙම නේ පුංචි ඇටයක් බීජයක් පැල වෙල ලොකු වෙල ඇයි ආයෙ මේක දිරන්නෙ. ඇයි පොළවට වැටෙන්නෙ. මේ ශක්ති ස්වභාවය එහෙමම තියෙන ශක්ති ස්වභාවයක් කියලයි හිතුවෙ. මේක තමයි ජරතා රූප කියල පෙන්වන්නෙ. මේ ධර්මය තුළ ඔබ මේ රූප කාණ්ඩ 28 දැක්කොත් ලහුතා මුදුතා කම්මසන්නතා ජලතා මේ හැම එකක් ම රූප කියල පෙන්වන්නෙ ඇයි. රූප කාණ්ඩ 28 දකිනව කියන්නෙ මේ ධර්මයමයි දකින්නෙ. ඒ බුදුන් වහන්සේ පෙන්වල තියෙන්නෙ මෙහෙම දේකුත් තියෙනව. මෙහෙම රූප ස්වභාවයක් තමයි හැම එකකම තියෙන්නෙ. ඔබගේ අත උස්සන කොට ඔබට දැනෙනවද මේක කිලෝ 10 කියල ඔබට බරක් දැනෙනවද. ඔබ කකුල උස්සන කොට ඔබට බරක් දැනෙනවද. අලියාට දැනෙනවද අලියා සාමාන්‍යයෙන් ටොන් 5ක් විතර බරයි. අලියාට

දැනෙනවද ටොන් 5ක බරක්. ඔබට දැනෙනවද ඔබ කිලෝ 70ක බරක්. ඇයි නැත්තෙ. මේක චිත්තයක්.චිත්තයකට කොහොමද බර දැනෙන්නෙ. මේක චිත්ත ශක්තියක්. එහෙම කොහොමද එයම දෙයක් වෙන්නෙ. එහෙම දෙයක් වෙන්නෙ නෑ. තවත් මේකෙ ඒව තියෙනව නේ. මේකෙ ඒ කියන්නෙ හොඳට ගැඹුරින් ගැඹුරට යන්න ඕන. ඒ කියන්නෙ මේකෙ බුදුන් වහන්සෙ පෙන්වන උපකාණ්ඩ වලට ගියාම පේනව. ලහුතා මුදුතා කම්මනාතා මේ පෙන්වන්නෙ සුකුම රූප ලහුතා රූප කම්මනාතා රූප වචී කම්මන්ත කාය කම්මනාතා ශබ්ද පිට වෙන හැටි එතනින් වායු වෙන හැටි වචී කම්මනාතා එන හැටි කාය කම්මනාතා එන හැටි මේ මුලු කයම මේකම සම්පූර්ණයෙන් ම පෙන්වනව බුදුන් වහන්සෙ මේ සොබා දහමක් වගේ. මේ සොබාදහම කතාවෙ මේකෙ යථාර්ථය දකිනව නම් පරම සත්‍ය දකිනව නම් මේකෙ අපට මේ දැනෙන හැම එකක් ම විඤ්ඤාණයෙන් දැනගැනීමකට හසුවෙලා ඉන්නෙ. විඤ්ඤාණයේ දැනගැනීමට හසුවෙනව කියන්නෙ නාම රූප 2ක ගැටගැසීමක්ව හසුවෙලා ඉන්නෙ. නාම රූප 2 ක ගැටගැසීමකට හසු වෙනව කියන්නෙ රූප ශබ්ද වර්ණ ගන්ධ රස පහස මේ ද්වාර වලින් එන මේ සංඥා රූප, සංඥා මේ සංඥාව මේ බාහිරය කියල තියෙනව කියල, එහෙම ශක්තියක් නෙ. තියෙනව කියන්නෙ ශක්තියක්මයි. ශක්තිය නැති වෙනව නම් තියෙනව කියන එක නැති වෙනව. තියෙනව කියන එකම සිතුවිල්ලක් නේ. චිත්ත ශක්තියක් තියෙන්නෙ. මේ චිත්ත සිතුවිල්ලට ශක්තියක් තියෙනව. කරන්ට් එකක් වගේ. මේක නැති වෙනව කියන්නෙ නාම රූප මේ ශක්තිය ඇති වෙනව කියන එක නැති වෙනව. එතකොට එහෙම දෙයක් වෙන්න නම් මෙතන ලිහන්නත් ඕන ආයෙ එතනින්මයි. දැන් මේක පුංචි දරුවට එහෙම ස්වභාවයක් කෙලෙස් ආශාවක් ඉරිසියාවක් වෛරයක් තණ්හාවක් ලෝභ ද්වේශ මෝහ මේ කතන්දරයක් නැනෙ. ඒ

පුංචි දරුවට ඔක්කොම එකම හිස් ස්වභාවයක් හුළඟ වගේ නෙ හිත. ප්‍රභාෂ්වරය කියන්නෙ ප්‍රභවය කියන්නෙ මුකුත් ආසා වෙලා නෑනේ. ආසව කියන්නෙ රූදෙන ස්වභාවයක්. ආසව ස්වභාවයක්. මේ ශක්තිය එතන එතන ඇති වෙලා නැති වෙන එක දැන් අර ගිණිවළල්ල වේගය තුළ තියෙනව වගේ පේන එක වළල්ලක් තියෙනව වගේ පේනව. බෝල පේන්නෙ නැත. වේගයක් තුළය වෙන්නෙ. මෙතනත් වේගයක්මයි තියෙන්නෙ. මෙතන වේගය තමයි සෝතය කියන්නෙ. ඕජාව ඒකම තමයි සෝතාපන්න. අනුසෝත පටිසෝත මේ ධර්මය තුළ මේ වචනය ලොකුවට හැම තැනම භාවිතා වෙනව. ඔබට දකින්න ලැබෙනව. මේක සෝතයක්. මේක වේගයක්. වේගයට ශබ්දයක කම්පනයක්. මේ වචන ඔබට කියන්න උත්සාහ කරනව. වචන භාවිතා කරනව පමණයි. මේකෙ අර්ථයට යන්න උත්සාහ කරන්න. දෙන පණිවිඩය ඔබ හැම තිස්සෙම පරම සත්‍ය හොයාගන්න බලන්න. මේ ඉදිරිපත් කිරීම භාෂාව පාවිච්චි කරනව පමණයි. භාෂාව මෙතන පාවිච්චි කරන්න ඕන වචනය මොකක්ද කියල අපි හොයනව. හොයල ඔබට දෙන්න බලනව. නමුත් මෙතන සිද්ධිය පෙන්වනව මේ සංඛාර ඇත්තට ම සංඛාර කියන්නෙ කොහෙවත් තියෙන එකක් නොවේ. බාහිර තියෙන එකකුත් නොවේ. සිතුවිලි කියන්නෙ කොහෙවත් එහෙම ඇත්ත එකක් නොවේ. ඒක කරන්ට් එකක් වගේ. ඒක ශක්තියක් වගේ. වචන වරදින්න පුලුවන්. නමුත් මෙතන ද්වනියක් කිව්වත්, මෙතන ශබ්දයක් කිව්වත්, මෙතන මේක අපට කියන්න බැරි වෙන්නෙ මෙන්න මේ හේතුව නිසා. දැන් මෙතන රශ්මියකුත් තියෙනවා. රශ්මියක් තාපයක් එහෙම කිව්වොත් මොකද වෙන්නෙ. දැන් මේ සිත කියන එක නේ. මේ කතා කරන්න යන්නෙ. දැන් මෙතන ශුද්ධාෂ්ටකයක් කීවොත් මොකක්ද වෙන්නෙ. මෙන්න මේ වගේ ඒ කියන්නෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා ඔක්කොම ශුද්ධාෂ්ටකයක් තියනව නම් පරමාණුව විද්‍යාවෙ

කියනව නම් නූතන විද්‍යාඥය කියනව නම් ඒකය කුඩාම අංශුව කියල බුදුන් වහන්සෙ කියනව නම් නෑ රූප කලාප කියල බුදුන් වහන්සෙ එතන රූප කලාපය පෙන්වන්නෙ ශුද්ධාෂ්ටකයෙන් නම් ශුද්ධාෂ්ටකය කියන එක කොහෙවත් තියෙන එකක් නෙවෙයි නම් ඒක හතරමහා භූත වගේ භූත වෙන ස්වභාවයක් ශක්ති ස්වභාවයක් නම් මුලු පෘථිවිය ම දකින හැම දේම ඒ ශක්ති ස්වභාවයෙන් සෑදී වෙලා නම් හැදෙන්නෙ දැන් මේ කතාව ලිහාගෙන ලිහාගෙන යන්න එතකොට ඔබට තේරෙයි මේ ශක්ති ස්වභාවය නම් හැදෙන්නෙ ඒකෙ රශ්මියක් තියෙනව, තාපය තියෙනව නම්, ඒක ශබ්දය තියෙනව නම්, තාප ශක්තිය වර්ණ ශක්තිය ශබ්ද ශක්තිය ඔය කියන ශුද්ධාෂ්ටකයෙ ඔය ශක්ති ස්වභාවය තියෙනව නම් සිත කියන ශක්ති ස්වභාවය ගැන ඔබට යම් වැටහීමක් එන්න ඕන. මේ චිත්ත කියන ශක්ති ස්වභාවය කැරකීම තුළයි වේගයක් හැදෙන්නෙ. මේ වේගයක් නිසයි හැදෙන්නෙ. ඒ වේගයක් තුල නැති දෙයක් ඇති කරනව. දැන් අපි ගත්තොත් මෙහෙම දැන් මේක හරි පුදුම හිතෙන කතාවක්. ලිහන කොට තමයි ඒක හොඳට ඔබට දැනෙන්නෙ. දැන් අපි ගමු මෙතන වේගයක් කියන එක කොහොමද ඔබට දකින්නෙ ඔබට පුලුවන් ද වේගය දකින්න. ඔබට පුලුවන් ද හුළඟ දකින්න. ඔබ දකින්නෙ ගහක කොළයක් හෙලවෙනව. ඒක නෙමෙයි හුළඟ කියන්නෙ. හුළඟ ඔබට දකින්න බෑ, මේක ඇස කන නාසය දිවට හසු වෙන්නෙ නෑ. දැන් ඔබ කියනව මෙතන ගඟ කියලා. ගඟ කියල දෙයක් කොහෙවත් නෑ. ඔබ ඇල්ලුවොත් අහු වෙන්නෙ වතුර ටිකක්. ගඟ කියන්නෙ ශබ්දයක් විතරයි. ඔබ ගැටගහපු ශබ්දයක්. ඔබ යම්කිසි හැඩ තලයකට ශබ්දයක් දාල ශබ්දය ඔබ ගඟ කියන්නෙ. එහෙම දෙයක් නෑ. දැන් ඔබ බලන්න වැස්ස කියනව වැස්ස කියල දෙයක් කොහෙද තියෙන්නෙ. ඇල්ලුවොත් අහුවෙන්නෙ වතුර ටිකක්. කොහෙද වැස්සක් තියෙන්නෙ. මේක මායාවක් නෙමේද. මේක මායාවක්. මේක

මැවෙන්නෙ කොහොමද. එහෙම දෙයක් කොහෙවත් නෑ. එතකොට දාපු ශබ්දය කොහොමද ඇත්ත වුණේ. අපි කොහොමද එහෙම එකක් ඇත්ත වෙලා ඉන්නෙ. අපට ගඟක් තියෙනව අපට වැස්සක් තියෙනව. අපට හුළඟක් තියෙනව. අපට හිතකුත් තියෙනව. හැබැයි එහෙම එකක් නෑ. මේක අපට ම නොතේරෙන ගැඹුරු පර්යායක්. ඒ කියන්නෙ මේ සිතට සිත අවබෝධ කරන්න හැකියාවක් ලැබේද කවදාවත් නෑ. මේක ඥාණයට හසු වෙන්නෙ. මේ කියන්නෙ මේක එක සිතුවිල්ලට අපි මේක මනසිකාරයට මෙහෙම ගත්තට ඔබගේ ඥාණයට හසු වන විට ඒ ඥාණයට තමයි අභිඤ්ඤාවෙන් තමයි මේක දකින්නෙ. මේක අවබෝධ වුණාම තමයි ශූන්‍යතාවය පේන්නෙ. සියල්ල මකල මකල දැම්මොත් ශූන්‍යයි නේ. em0ptiness ඒ කියන්නෙ මෙතන හිස් වෙන්නෙ emptiness වෙන්නෙ මෙතන ලෝභ ද්වේශ මෝහ තමයි emptiness වෙන්නෙ. ඇලෙන ගම් එක emptiness වෙනව. දැන් අපි හිතමු ගම් එකක් ගාලා මේ ටික ඇලෙව්ව කියල. යමක් ඇලවෙන්නෙ ගම් එකකින් නේ. එතකොට ඒකට අපි තණ්හාව කියන්නෙ. එතකොට තණ්හාව කියල දෙයක් කොහෙද තියෙන්නෙ. තණ්හාව ඔබට පෙන්වන්න පුලුවන්ද. ඒකත් අර හුළඟ වගේ නෙවෙයිද මේ ඔක්කොම සංඛාර කියන්නෙ ඇයි. මෙහෙම අපි කතා කරන හිතන එකක්වත් කොහෙවත් නෑ. මේක නමුත් ශක්ති ස්වභාවයක්. නමුත් එහෙම දේකුත් කොහෙවත් තියෙන එකක් නොවේ. නමුත් අපි මේකට රැවටුණොත් අපි මේක දන්නැති වුණොත් මේකෙ විඳවන ශක්තිය තියෙනව නෙ ඔබ අඬනව නේ. ඔබ සතුටින් ඉන්නව නේ. ඔතන ශක්තියක් තියෙනව. ඒ ශක්තිය කොහේවත් තියෙන එකක් නොවේ. ඒක මායාවක්. ඒ ශක්තිය තමයි ඇත්තට ම මේ නොදන්නකම අවිද්‍යාව නිසා මේ සංඛාර මේ හදාගන්න එක. ඒ හදාගන්න සංඛාර හරහා හදාගන්න නාම රූප තමයි මේක කෙළවරට ගියාම හම්බ වෙන්නෙ. ඒකෙන් තමයි මේ විඤ්ඤාණය තියෙන්නෙ.

එතකොට මේ විඤ්ඤාණය නිසා තමයි අපි ආයෙ ඇස කියල නැවත නැවත කැරකෙනව. ඒ කියන්නෙ මුලින් ම එනව. එන හැඩතලයට අපි මෙහෙම කිරණයක් එනව ඇහැට. ඒක අපි නැවත වේගය තුල අර කලින් තිබුණ හැඩතල එක්ක දැනුත් එකතු වෙනව. දැන් මේ අපි ගිණිබෝලෙ කරකවන කොට වේගයෙන් කොහොමද ගිණිවළල්ලක් පේන්නෙ මෙතනයි මෙතනයි එක්ක වේගයත් එක්ක එකතු වෙලානේ. හැබැයි එකතු කරන්නෙ නෑනේ කවුරුවත්. හැබැයි ස්වභාවික සංසිද්ධියකින් මේක එකතු වෙලා නේද ගිණි වළල්ලක් පේන්නෙ. එතකොට ඒක ආලෝකය නේද එකතු වෙලා තියෙන්නෙ ආලෝකය එකතු කරන්න බෑ නේද කාටවත් හැබැයි ඒ ආලෝකය එකතු වුණා කියන්නෙ ඇලෙනව නේද. ඒ ඇලෙන එක ශක්ති ස්වභාවයක් නෙමෙයිද. ඔන්න ඔය වගේ චක්කරයක් වේගෙන් කැරකෙන එකක් නෙවෙයිද මේ තණ්හාව කියන එක. ඒක මේකත් තියෙනව අරකත් තියෙනව. දරුවෙක් ඉන්නව මට ඊට පස්සෙ මට ගේකුත් තියෙනව. මට සල්ලිත් තියෙනව. මට රූපෙකුත් තියෙනව. ඊට පස්සෙ මට තියෙනව තියෙනව තියෙනව ඔක්කොම තියෙනව නම් මොකද වෙන්නෙ. දැන් ඔක්කොම ලිහ ලිහ ලිහ ලිහ ගියොත් මුකුත් නැති වුණොත් මොකද වෙන්නෙ. තණ්හාව නැති වෙනව. හැබැයි ඇල්ල ඇල්ල ඔක්කොම ඇල්ල ගියොත් මොකද වෙන්නෙ. මට ඔක්කොම තියෙනව මමත් ඉන්නව. එතකොට තද වෙල ලොකු ශක්තියක් තියෙනව නේද ඔබට දරාගන්න බැරි. ගොඩක් තියෙන හින්ද. නැති වුණොත් මොකද වෙන්නෙ. එහෙම සැහැල්ලුයි නේ. එහෙම සැහැල්ලු වෙලා තියෙන්නෙ චිත්ත ශක්තිය නේ. වැඩි වෙලා තියෙන්නෙ චිත්ත ශක්තියනෙ. කෙනෙක් පුද්ගලයෙක් නෙවෙයි නේ. මෙතන ශක්තියක් විතරයි නේ. මෙන්න මේ වගේ මේක අවබෝධ කරන්නෙ චිත්ත ශක්තියෙන්. චිත්ත ශක්තිය කියන එක කොහෙවත් එහෙම තියෙන එකක් නෙවෙයි. එතන

එතන ඇති වන චිත්ත ස්වභාවයක්. අවබෝධ කරන්න තියෙනව. ඒ කියන්නෙ දැන් අපි මේක බුදුන් වහන්සේ පෙන්වන ඒ ධර්ම න්‍යාය අනුව හොඳින් ම ඒ විදියට බැලුවම ඔබට පෙනේවි බුදුන් වහන්සේ මනා කොට පෙන්වනව හැදෙන පළවෙනි එකම ජාති ධම්ම සූත්‍රයෙ **කංධානං පාතභාවෝ ආයතනානං පටිලාභෝ අයං පුච්චති ජාති** ඒ කියන්නෙ දෙයක් තියෙනව කියල බාහිර දෙයක් තියෙනව කියල අප හඳාගන්න එකක්. දැන් මේක බැලුවම තියෙන එකක් නෙමෙයි. දැන් අපි උපමාවක් ගත්තොත් පොත. පොත කියන එක ඇත්තට ම බාහිර එහෙම එකක් නැහැනේ. එතකොට සිතුවිල්ලකත් පොත කියල දෙයක් නැහැ නේ. නමුත් පොත කියන එක කලින් අපේ තියෙන මතකයක් නේ. එතකොට එහෙම සම්මුතියෙ තියෙන වචනයක් ඇත්තට ම ඒ විදියට ම ගත්තම කලින් මතකයක්. කලින් මතකය තියන එක තමයි අර ගිණි වළල්ල කැරකෙන වේගය තුළ මේ බෝලයයි අර බෝලයයි සම්බන්ධ වෙලා වගේ පේන එක. කලින් මතකයක්. ඒකයි **පුරාණ මිදං භික්ඛවේ කම්මං වදාමි** පුරාණය තමයි මේ දැන් කර්මයට හේතු වෙන්නෙ. එතකොට ගිනි බෝලෙ කැරකෙන කොට ගිණි වළල්ල පෙනෙන්න හේතුව වෙන්නෙ මේ බෝලෙයි මේ බෝලෙයි සම්බන්ධ වෙලා වගේ ආලෝකය එකට ගැටගැහිල. ඒකම නේද මේ තියෙන්නෙ. මේක වේගයක් නිසා නේද මේ ගිණි බෝල 2 කැරකෙන කොට වළල්ලක් වගේ එකට එකතු වෙලා පේන්නෙ. ඒක වෙන්නෙ වේගයක් නිසා නේද? එතකොට මෙතනින් එතනට මොකවත් ගිහිල්ල නෑ නේද? කලින් දැන් එකම ගිණි බෝලෙ නේ මේ කැරකෙන්නෙ. එතකොට ගිණිබෝල 2ක් වගේ පේනව නේ දැන්. ගිණිබෝල ගොඩක් වගේ නම් වළල්ලක් පේනකොට. එතකොට එහෙම ගොඩක් නෑ නේද? අන්න ඒ වගේ කලින් තිබුණ ස්කන්ධ දැනුත් සකස් වෙනව. කලින් තිබුණ එක පෙර මතකය කියන්න වෙන මොකක්වත් නෙවෙයි මේ වේගයක් තුළ කලින් තිබුණ ශබ්දය දැනුත්

එනව. කලින් තිබුණ හැඩතල දැනුත් එනව. ඒ හැඩතලය ශබ්දය එකට එනව. ඒක ධ්වනියක් කියන්නෙ. මේක විවිධාකාර නම් භාවිතා කලාට ස්පන්දනයක් කියනව. ධ්වනියක් කියනව. දැන් මේ අපි තමයි මෙහෙම කියන්නෙ. මේක පෙන්වන්න ඕන නිසා මේකෙ තියෙනව ලොකු කතාවක්. බුදුන් වහන්සේ පෙන්වන පරියාය බැලුවම අපට පේනව මේකෙ චිත්ත කියන ශක්ති ස්වභාවයක්. මේක සකස් වන එකක්. අපි කියනව නේ මේක විඤ්ඤාණය කියල. විඤ්ඤාණ ශක්තිය කියල ඔබ අහල තියෙනව නේ. එතකොට එහෙම එකක් කොහෙවත් නැහැ. පළවෙනි කතාව. ඒ කියන්නෙ මේක මායාවක් **මායූපමංච විඤ්ඤාණං** කියල පෙන්වන්නෙ. මේකත් එතකොට වළල්ලක් තියෙනව වගේ නේ. වළල්ලක් නැහැ නේ. එතකොට අපට මේ හිතෙන්නෙ මේව තියෙනව නේ. දරුවෙක් ඉන්නව. මේ පොතක් තියෙනව. මේ ඉරක් තියෙනව. මේ හඳක් තියෙනව. මේ පෘථිවියක් තියෙනව. මේ පොළවක් තියෙනව. මේ අම්මත් ඉන්නව. තාත්තත් ඉන්නව. මේ ගේත් තියෙනව. මේවත් තියෙනව. මේ ඔක්කොම බලන්නකො. දැන් මේව ගැටගැහෙන කොට ගැට ගැහිල ගිණි බෝලෙ වගේ කැරකෙනව නේ. තියෙනව තියෙනව තියෙනව ඇත්තට ම තියෙනව වෙනව. මේක චිත්ත ශක්තියක්. දැන් තියෙනව කියන්නෙ තියෙනව පේනව. එතකොට තියෙනව. පුදුම හිතෙයි මේ කතාව කියන කොට. ඒක චිත්ත ශක්තියක් එහෙම එකක්වත් නැහැනේ. එළියෙ ඔය එකක්වත් තියෙනවද? ඔබ කියනව පොතක් තියෙනව. මේසෙත් තියෙනව. මෙතන මලුත් තියෙනව. මෙතන පුටුවක් තියෙනව. බිත්තියකුත් තියෙනව. එහෙම ඒව නැනේ. ඒ කියන්නෙ පොත කියල දෙයක් එළියෙ තියෙනවද නෑ නේ. සතර මහා භූත නේ. එතකොට මල කියල දෙයක් එළියෙ තියෙනවද? නෑ. ඒත් සතර මහා භූත නේ. එතකොට බිත්තිය කියල දෙයක් තියෙනවද නෑ. අපි සාමාන්‍යයෙන් එක

අදියරකට හරි ඇවිල්ල මේක කතා කරන්න ඕනනේ. මේක සම්මුතිය තුළ. ඒත් සතර මහා භූත කියමුකො. ඒත් පුටුව කියල දෙයක් තියෙනවද නෑ. හතර මහා භූත නේ. එතකොට එළියෙ ඔය මොකක්වත් නෑ. දැන් ඒ වුණාට අපි කියන්නෙ තියෙනව. ඒ වුණාට නෑ නේ. ඒ වුණාට අපි කියනව තියෙනව. දැන් මොකද වෙන්නෙ. දැන් තියෙනව තියෙනව තියෙනව එහෙම වුණොත් තියෙනව. අන්න ඔබට තියෙනව වෙලා ඔබත් ඉන්නව. ඔබ කියල කෙනෙකුත් නෑ. ඇයි ඒකත් ඔබ හිතන එකක්. දැන් මේ රූපය මගේ කියල කෙනෙක් කොහෙද ඉන්නෙ. දැන් මේ අත ඔබ ද, කකුල ඔබ ද, දැන් කන ඔබ ද මේ කොහෙවත් ඔබ ඉන්නවද? ඔබ කියන්නෙ චිත්තයක් නේ. ඕක සිතුවිල්ලක් නේ. දැන් ඔබ කියනව මට වතුර තිබහයි කියල. ඉතින් ඒ වතුර තිබහ තියෙන්නෙ ඔබේ සිතට නේ. දැන් වතුර බිව්වෙ හිතද? හිතට වතුර බොන්න පුලුවන්ද? දැන් ඔබ කියනව මට බඩගිනියි කියල. මට කන්න ඕන කියල. එතකොට දැන් හිත නේද බඩගිණියි කියල කියන්නෙ. දැන් හිතට කන්න පුලුවන් ද? දැන් මේ ඔක්කොම සිතුවිලි චේතනා. චේතනා තමයි සබ්බ සංඛාර සිතුවිලි. එතකොට ඒව එහෙම තියෙන ඒව නෙවෙයි එකක්වත්. එතකොට මේව ඔක්කොම දෘෂ්ටියක්. ඒකයි මේක සක්කාය දෘෂ්ටි වෙන්නෙ. සේරම තියෙනව කියල ගන්න එකයි කාය ගොඩ. තියෙනව කියන තැන් සක්කාය දෘෂ්ටියක් තමයි ඕක. සක්කාය දෘෂ්ටිය. එතකොට ඕක නැති බව දැන ගත්තොත් මොකද වෙන්නෙ. සක්කාය දෘෂ්ටි කැඩෙනව කියන්නෙ සෝතාපන්න වෙනව කියන්නෙ මොකද වෙන්නෙ. සෝතයට පැමිණෙනව කියන්නෙ මේව සේරම ලිහ ලිහ යනව. වේගය අනිත් පැත්තට කැරකෙනව. පටිසෝතයට එනව. දැන් මේ කැරකිල කැරකිල ඔබ දිය සුලියක් දිහා බලන්න. දියසුළිය කැරකිල කැරකිල ගඟ මැද්දෙ දැන් දිය සුළියක් තියෙන කොට වටේ තියෙන සේරම කොළරොඩු ඇතුළට අරගෙන යනව. ඒ වගේ ඔබත් මේ සේරම මේ කැරකිල කැරකිල

කැරකිල ලොකු බලයක් හැදෙනව. බලයට ලොකු දෙයක් කරන්න පුළුවන්. දැන් ඔබ තියෙනව තියෙනව තියෙනව කියල කැරකැව්වොත් මොකද වෙන්නෙ. ඒකට ලොකු බලයක් එනව. ඒක තමයි ඔබ කියන බලය. ඔබ කියන බලයට කෙනෙක් නැහැ නේ. දැන් ඔබ කියල කෙනෙක් ඉන්නව. මේ රූපය මගේ දැන් තියෙනව තියෙනව තියෙනව කියල මේක මොකද වෙන්නෙ. කැරකිල කැරකිල කැරකිල යන දැන් මේ දිය සුළියෙ තියෙන ඔක්කොම වටේ තියෙන සේරම අදිනව නේද? ඔබත් ඔය සේරම තියෙනව කියල ගැටගැහෙනව නේද? ඒකම තමයි මේ බලයක් නේද? ඒකම තමයි තණ්හාව, බලය, තණ්හාව තමයි බලය, මෙතන බලගැන්වෙනව. මේ ශක්තිය බලගැන්වෙනව. ඒ කියන්නෙ මෙතන බලගැන්වෙනව කියන්නෙ උපාදාන කරනව. මේ ඔක්කොම අල්ලගන්නව. දිය සුළියෙන් වගේ අල්ලගෙන උපාදානය කරගෙන බලයක් වගේ තණ්හා වෙනව. එතකොට ගැටගැහෙනව. දැන් මේ බලගැන්විල. දිය සුළියට ලොකු බලයක් තියෙනව. හොල්ලන්න පුලුවන් සේරම මේ බලයක්. තණ්හාවෙන් උපාදානයෙන් අල්ලගෙන ගත්ත බලය ශක්තියක් ශක්ති ස්වභාවයක් වෙනව. දැන් මේක මේ ශක්ති ස්වභාවයක් සකස් වෙනව කියන්නෙ. එතකොට ඒක ලොකු බලයක් වෙනව. මම ඉන්නව මට ලොකු දුකක් එන්නෙ ඇයි. දැන් මේ ශරීරයට පණ දුන්නෙ කවුද? දැන් ඔබ රොබෝ කෙනෙක් හදනව. රොබෝ කෙනා හැදුවට ඒක යකඩ. දැන් රොබෝට හිතන්න බැහැනේ. දැන් රොබෝ යකඩ නේ. දැන් ඒ වුණාට මෙහෙම දෙයක් වෙනව කියල හිතන්නකො. මේ රොබෝ කියල කෙනෙක් නැහැනේ. ඒ කියන්නෙ කැලි ටිකක් යකඩ ටිකක්. එතකොට මේ මනුෂ්‍යයෙක් විදියට අතපය සේරම හදනව. හදල මේ රොබෝට මේ වගේ දෙයක් සිද්ධ වුණොත් ඒ කියන්නෙ. මේ සේරම මේ විදියෙ ස්වභාවයක් මේ වගේ දෙයක් ස්පාක් එකක් මේ වගේ දෙයක් තමයි වෙන්නෙ දැන් ශරීරය කියල එහෙම ශරීරය කෙනෙක්

පුද්ගලයෙක් නෙවෙයි නේ. රොබෝ වගේ අපි දැන් උපමා කරන්න හැදුවෙ එහෙම තමයි. ශරීරය කෙනෙක් පුද්ගලයෙක් නෙවෙයි වගේ. රොබෝ වගේ. එතකොට ශරීරය ඇයි ඔබ හිත නැති නිසා නේ ශරීරය ගිණි තියල දාන්නෙ. ශරීරයට ගිනි තියල දැම්මම වායුවක් වගේ නැති වෙලාම යනවනේ. එතකොට ශරීරය සම්පූර්ණයෙන් සතර මහා ධාතු වල අනිත් පැත්තට යනව නේ. එතකොට ඔබ කෝ එතකොට ඒ ශක්ති ස්වභාවය කෝ එතකොට මෙන්න මේකෙන් තමයි මේකෙ ගැඹුරට යන තැන තියෙන්නෙ මේක කොහොමද නැවත සකස් වෙන්නෙ. මේ ශක්ති ස්වභාවය ඔබ කියන්න දැන් ශක්තිය ඔබට පේනවද? ඔබ කියන්න දැන් ඔබේ ශරීරය සේරම ගිණි තියල දැම්මම ඒ ශරීරය දැන් කෝ කියල ඇහුවනේ අපි. එතකොට මීට කලින් අපි කිව්ව නේ මේ ධාතු මනසිකාරය වඩන කොට අපි පැහැදිලි කළා නේ. ඒ රූප කලාප ගැන කියන කොට මේව සම්භූත වෙලා තමයි රූප කලාපයෙන් ප්‍රසාද රූපයක් හැදෙන්නෙ කියන කොටත් ඒක ශක්ති ස්වභාවයක් කියල කියන කොට දැන් අපි ඔබට ආයෙමත් භෞතික පැත්තෙන් මේක ගත්තොත් අපි කියමු දැන් මේ කොස් ගහ ඔබ කය වගේ උපමා කරමු. කොස් ගහ එතකොට අපි කලින් මේ උදාහරණය කිව්ව. එතකොට කොස් ගහ ගිණි තියල කොස් ගහ සම්පූර්ණයෙන් ම නැත්තට නැති වුණ වගේ මුලු පෘථිවියම මහා රශ්මියකට අහුවෙලා අපි කියනව නේ ස්ත්ත සූරියග්ගමන සූත්‍රයෙ පෘථිවිය සූර්ය 7ක් තරම් රත් වෙල සම්පූර්ණයෙන් ම නැත්තටම නැති වෙලා යනව කියල. එතකොට පෘථිවිය සම්පූර්ණයෙන් ම ලෝක විනාශය වුණා කියමු. සූර්යාගේ රශ්මිය වැඩිවෙලා පෘථිවිය නැත්තට ම නැති වෙලා අලු වෙලා ගියා කියමු. එතකොට පෘථිවිය සම්පූර්ණයෙන් ම අලු වෙලා ගියාට පස්සෙ ශක්ති ස්වභාවයක් නේ තියෙන්නෙ. මේ මුළු විශ්වයෙම තියෙන්නෙ ශක්ති ස්වභාවය නේ. දැන් හොඳට බලන්න කො. මේ කතාව එහෙනම් මුලු විශ්වයෙම

තියෙන්නෙ ශක්ති ස්වභාවයක් නේ. එහෙනම් හරි නේ. ඔබ දැන් පොළවට පස් වුණාම ශරීරය ගිණි තියල දැම්මහම එකක් වායුවක් වගේ නැති වෙලා ගියා නේ. මේ ශක්ති ස්වභාවය. එතකොට ඔබ කෝ. ඔබ හට ගන්න ශක්ති ස්වභාවය කෝ. ඔබ හිතන්නෙ නැති දෙයක් මෙතන තියෙනව. මේක හිතට ගන්න බැරි එකක්. මේක මහා ඥාණයටයි. මේක අභිඥාවටය සකස් වෙන්නෙ. ඒ කියන්නෙ මේ ඔබ චිත්ත ශක්තිය ඇති වූ ඇත්තට ම එතනින් වෙනස් ම කතාවක් පැහැදිලි කරන්න වෙනව. වෙනස් ම පැහැදිලි කිරීම් මාලාවක් පැහැදිලි කරන්න තියෙනව. නැවත සකස් වෙනව. ඒ කියන්නෙ දැන් නැවතත් මේ කොස් ඇටයකින් කොහොමද කොස් ගහක් හැදෙන්නෙ. දැන් කොහාටවත් නැති එකක් මේ කොස් ඇටේ පුංචි බීජයකින් මේකෙන් උරාගෙන උරාගෙන දැවැන්ත පදාර්ථයක් හැදෙනව නේ. කොස් ගහක් හැදෙනව නේ. කොස් ගහේ කවුරුත් නැහැනේ. එහෙම නේ අපි කියන්නෙ. එතකොට ඒක ඒ පදාර්තය හැදුනේ කොහොමද ශක්තිය නේද මේ උරල තියෙන්නෙ. ඕජාව කියල ගත්තෙ ශක්තිය නේ. ඒ ඕජාව පෘථිවි සාරය නේ උරන්නෙ. පෘථිවියත් ඕජාවත් ශක්තියත් ඝන වෙලා නේ තියෙන්නෙ ඔය ශක්තියම නේද මේ කොස් ගහේම තියෙන්නෙ. ඔය ශක්තියම නේද නැවත වායුවක් වෙන්නෙ. එතකොට මේ ශක්තිය මොකක්ද? දැන් ඕක නේද වැදගත් වෙන්නෙ. එහෙම නම් මේ චිත්ත ශක්තියට මොකක්ද වෙන්නෙ. ඊට පස්සෙ මේ ශක්තියක් ඉපදුණොත් මොකද වෙන්නෙ. මේක තමයි මේ බුදුන් වහන්සෙ පෙන්වන ගැඹුරුම පර්යාය. බුදුන් වහන්සෙ සමහර දේවල් කියනවනේ. මේක බීජ නියාම, කම්ම නියාම, ඍතු නියාම, ධම්ම නියාම, චිත්ත නියාම මේව නියාම ධර්ම කියල බුදුන් වහන්සේ සීමා කරනව. බුදුන් වහන්සේ අපට සමීකරණයක් දෙන්නෙ අපිට විසඳගන්න. මේ ගාණ හදාගන්න. එතකොට බුදුන් වහන්සෙ සීමා කරාට අපි ඒව හොයන්න යන්නෙ නෑ. මේ බීජයෙන්

කොහොමද ගහක් හැදෙන්නෙ කියල සෘතු නියාම කොහොමද ග්‍රීස්ම සෘතුව, ශීත සෘතුව කොහොමද එහෙම අපි හොයන්න යන්නෙ නෑ. මේ චිත්ත නියාමය හැදෙන හැටි ඉන් එහාට අපි හොයන්න යන්නෙ නෑ. දැන් හරි නේ. ඕක නේ කතාව. සෘතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම දැන් මේකෙ තියෙනව නේ. මේ නියාම ධම්ම ටික බැලුවම ඔබට පේනව නොපෙනෙන කතාවක් දැන් කියන්න යන්නෙ. ඉතාම ගැඹුරු කතාවක්. මේ ශක්ති ස්වභාවයෙ ඔබ රූප කලාප ගැන අපි පැහැදිලි කරගෙන ආවනේ. අර සමාධිමත් සිතට මෙන්න මෙහෙම රූප කලාප දකින්න හැකියාව තියෙනව කියල. 4 වන ධ්‍යානයක්. අභිඥාවෙන් මෙතන සකස් වෙනව කියල පෙන්නුවනේ. මෙහෙම දකින්න හැකියාව තියෙනව කියල. එතකොට මෙන්න මේක තමයි මේ කියන්න යන්නෙ. රූප කලාප දකින කොට මේක කුඩා ම අංශුව පරමාණුව නෙවෙයි. රූප කලාපය ඊටත් වැඩිය ගැඹුරුය කියල පෙන්නුව නේ. පරමාණුව ඔබට විද්‍යාගාරයක දැක්ක නේ. රූප කලාප දකින්න බැහැනේ. පරමාණුව යම්කිසි අගයක් ද තියෙන්නෙ ඒක අද වන විට විද්‍යාඥයින් කියනව නම් පොඩිම එක කියල බුදුන් වහන්සේ කියන්නෙ ඒක තවත් දහස් ගුණයකි. මේකට බෙදල තව අවුරුදු 100ක් යනව මේක විද්‍යාඥයින්ට අවුරුදු 200ක් ගියත් මේක හොයන්න බෑ. මේ විද්‍යාව තව අවුරුදු 200ක් දියුණු වුවත් හොයන්න බෑ. ඒ තරම් බුදුන් වහන්සේ තව සියුම් කරල පෙන්වනව. මොකක්ද ඒ විශ්වයේ තියෙන ශක්ති ස්වභාවය සමානයි. ඉතාම ගැඹුරු න්‍යායක් මේක. මේ ශක්ති ස්වභාවය මුලු විශ්වයේ ම තියෙනව. ඒක ශුද්ධාෂ්ටකය කියල බුදුන් වහන්සේ අපට දුන්න නේ. ඒ කියන්නෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියල. ඒ ශුද්ධාෂ්ටකය කීවෙ පරමාණුවට වැඩිය අපි කිව්ව නේ. දහස් ගුණයක් බෙදන්න ඕන කියල. ශක්ති ස්වභාවයක් කියල. ඒක පෙන්වන්න බැහැ කියල. ඔය විද්‍යාගාරයට කවදාවත් ගන්න

බෑ කියල හැබැයි ඒකෙ තියෙන මැජික් එක තමයි සකස් වෙනව කියල කිව්ව නේ. ඒකෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන මෙන්න මේ කියන රූප කලාප කියන ඒකකය ඒකෙන් නේ එතකොට ශබ්දය හැදිල තියෙන්නෙ. ඒකෙන් නේ එතකොට වර්ගය හැදිල තියෙන්නෙ. ඒකෙන් නේ ගන්ධය හැදිල තියෙන්නෙ. ඒකෙන් නේ මේ හැම දේම තියෙන්නෙ. චිත්ත ස්වභාවයක් නේ. ඒකෙන් නේ සිත හැදිල තියෙන්නෙ. ශක්ති ස්වභාවයක් නේ. ඔබට තේරුණාද ඒ කියන එක. එතකොට මේක වෙනස් වෙනව නේ. සම්භූත වෙනව නේ. සකස් වෙනව නේ. දැන් ඔන්න මේ උපමාව හොඳට පරිස්සමින් අහන්න.

## ⋆ 10 වෙනි පරිච්ඡේදය ⋆

# නාමරූප පරිච්ඡේද ඥාණය කංඛාවිතරන විශුද්ධිය

ඒ තරම් බුදුන් වහන්සේ මේක තව සියුම් කරල පෙන්වනව. ගැඹුරුම දෙයක් පෙන්වනව. මොකක්ද ඒ විශ්වයේ තියෙන ශක්ති ස්වභාවය සමානයි. ඉතාම ගැඹුරු න්‍යායක් මේක. මේ සත්‍ය ස්වභාවය මුලු විශ්වයේ ම තියෙනව. ඒක ශුද්ධාෂ්ටකය කියල බුදුන් වහන්සේ අපට කියල දුන්න නේ. ඒ කියන්නෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන්නෙ ශුද්ධාෂ්ටකය කියල. ශුද්ධාෂ්ටකය කිව්වෙ පරමාණුවට වැඩිය අපි කිව්ව නේ දැන් දහස් ගුණයක් බෙදන්න ඕන කියල. ඒක ශක්ති ස්වභාවයක් කියල. ඒක පෙන්වන්න බෑ කියල කාටවත්. ඒක විද්‍යාගාරයට ගන්න බෑ කියල කීව නේ. හැබැයි ඒකෙ තියෙන මැජික් එක තමයි ඒක සකස් වෙනව කියල කිව්ව නේ ඒකෙ පඨවි, ආපෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන මෙන්න මේ කියන රූප කලාපය කියන ඒකකයෙන් නේ ශබ්දය හැදිල තියෙන්නෙ. ඒකෙන්නේ එතකොට වර්ණය හැදිල තියෙන්නෙ. ඒකෙන්නේ එතකොට ගන්ධය හැදිල තියෙන්නෙ. ඒකෙන්නේ එතකොට මේ හැමදේම තියෙන්නෙ. චිත්ත ස්වභාවයක් නේ. ඒකෙන්නේ එතකොට සිත හැදිල තියෙන්නෙ. ශක්ති ස්වභාවයක් නේ. තේරුණාද ඒ කියන එක. එතකොට මේක වෙනස් වෙනව නේ. මේක සම්භූත වෙනව නේ. සකස් වෙනව නේ. දැන් ඔන්න මේ උපමාව හොඳට පරිස්සමින් අහන්න. දැන් මේ උපමා 2ක් එකට ගන්න වෙනව. උත්සාහ කරනව. ඔබට මේක පැහැදිලි කරල දෙන්න. බොහොම පරිස්සමින් අහන්න. වතුර බඳුනකට

ගලක් දානව Swimming Pool එකට ළමයෙක් පැන්න කියල තියන්න කො. උපමාවකින් එතකොට දිය වළලු හැදෙනව. එතකොට නාන තටාකයේ කෙළවර තියෙන බිත්තියෙ තියෙන වතුර ඉස්සිල වැදෙනව නේ. දැන් මැද්දටනේ පනින්නෙ මැද්දට පැන්නට මැද්දෙ වතුර අයිනට යන්නෙ නෑ නේ. දැන් වතුර බඳුනට ගල මැදට දැම්මහම මැද්දෙ තියෙන වතුර අයිනට යන්නෙ නැහැ නේ. නමුත් මේ ගල මැද්දට වැටුණහම මෙතන මෙහෙම වළලු හැදිල අයිනෙ තියෙන වතුර නේද අයිනට ගිහින් වදින්නෙ කෙළවරට. Swimming Pool එකේ මැද්දට ළමයෙක් පැන්නම ඒ දිය වළලු කැරකිල කැරකිල කැරකිල තරංග විදියට අයිනෙ තියෙන වතුර නේද බිත්තියට වදින්නෙ. එතකොට මේ මැද්දෙන් මුකුත් අයිනට ගිහින් නෑ නේද? මෙතන තියෙන එක අංශුවක්වත් වතුර අංශුවක්වත් අහකට යන්නෙ නැහැ නේ. එතනම තියෙන වතුර නේද ඉස්සිල වදින්නෙ. දැන් අහසෙ විදුලි කොටන කොට මෙහේ ජනෙල් හෙල්ලුනාට එතන සිද්ධිය වෙනයි නේ. මෙතන සිද්ධිය වෙනයි නේ. මේ මොකක්ද මේ කියන්න යන්නෙ. එකම අංශු ටිකක් නම් මුලු විශ්වයේ ම තියෙන්නෙ. මෙතන තියෙන එක මෙතන අංශු සකස් වෙන එකක්. අතන තියෙන අංශු සකස් වෙන එකක් එතනයි මෙතනයි වෙනස් නේ. දැන් තේරෙනවද මේ කියන්න යන එක. වතුර බඳුන මැද්දට ගල දැම්මට මැද්දෙ තියෙන වතුර අතනට ගියේ නෑ කියන්නෙ එතන තියෙන වතුර නම් ඉස්සිලා තියෙන්නෙ එතන එතන සකස් වන එකක් නේ තියෙන්නෙ. මේ ඔක්කොම අංශු සමානයි නේ. දැන් අපි කියපු විදියට. මුලු විශ්වයෙම තියෙන සේරම අංශුවල එකම ස්වභාවයක් නේ තියෙන්නෙ. නමුත් මේකෙ මේ නියම ධර්මයේ අපේ උපමාව කොයි තරම් දුරට මෙතනට යයිද දන්නෙ නෑ. නමුත් ඔබ මෙතන මැරෙන කොට මැරෙන්න කලින් අපි හිතමු ඔබේ සිත සකස් වෙනවනේ. අපි මේකෙ ගොඩක් උපමා මීට කලින් පෙන්වල තියෙනව කතා කරල

තියෙනව. නමුත් සමහර ඒවා ඉදිරිපත් කරල නම් නෑ. ප්‍රසිද්ධියට දාලත් නෑ. මේ චිත්ත ස්වභාවය ඔබ, දැන් මෙතන කර්ම විෂය වගේ එකක් යනව මෙතන පැහැදිලි කරන කොට, ඔබ ඉපදෙන කොට පුංචි දරුව විදියට ඒ ස්වභාවයේ ඊට පස්සෙ ඔබ මෙතන දැන් චිත්ත ස්වභාවයක් ගැන නේ කතා කරන්නෙ. සිස්ටම් එකක් ගැන නේ අපි කතා කරන්නෙ. මේක වෙනස් වෙනව කියල නේ අපි කියන්නෙ. ශක්ති ස්වභාවයක් නේ සිත කියන්නෙ. ඒක වෙනස් වන එකක් නේ. ඒක එක විදියට පවතින එකක් නෙවෙයි නේ. හැබැයි මේ චුති සිත කියනව නේ අන්තිම මොහොතෙ සිතක් ඉපදිල නැති වෙනව නේ. හැබැයි හැම මොහොතෙම මේ සිත ඉපදි ඉපදි නැති වෙන එකක් නේ. පවතින සිතක් නෑ. මේ ධර්මය දකින කෙනා දකින්න ඕන ගිණි බෝලයක් කියන එක එක සිතක්. ගිණි බෝලෙ කැරකෙන කොට අපට සංකාරයක් තිබුණාට සංකාර ගොඩක් ආවට එතන තමයි ආසාව කෙලෙස් කියන්නෙ. ඒක තමයි තණ්හා මාන දිට්ඨි කියන්නෙ. ආසාව හට ගන්නෙ තණ්හා දිට්ඨි මාන වලින් නේ. එතකොට කාම තණ්හා බව තණ්හා විභව තණ්හා ඔය කියන්නෙ එකම ශක්ති ස්වභාවයක් නේ. මේකෙ ආශ්‍රව පැත්තටනේ අවසානයේ එන්නෙ. ආශ්‍රව කියන්නෙ මණ්ඩි නේ. අර තේ බීල ඉවර වුණාම මණ්ඩි ටික තියෙන්නෙ. කෙලෙස් මණ්ඩි නේ. රාග ද්වේශ මෝහ කෙලෙස් වල මණ්ඩිනේ ඉතුරු වෙන අවශේෂ නේ. දැන් නිරවශේෂ විරාග නිරෝධයක් තමයි බුදුන් වහන්සෙ එළියෙ දෙන්නෙ. නමුත් අවශේෂයක් වුණොත් ඒ කියන්නෙ මේ ධර්මය දන්නෙ නැති කෙනාට ලෝකය තියෙනව කියල හිතෙනව. මම මැරෙනව කියල හිතනව. එතකොට එයාට කම්පණයක් එනව. එතකොට ඒ සංඥාව නිසා නේ මේ සේරම ඒ සංඥාව තමයි ශක්තිය කියන්නෙ. එතකොට එතන එයා මැරිල තියෙන්නෙ ලෝකය තියෙද්දි නේද? එයාට ලෝකය තිබුණ නේද? එයා මැරෙන කොටත් ලෝකය තියෙනව නේද? එතකොට චිත්ත ස්වභාවය තුළ

ලෝකයක් මැවෙනව නේද? ඒ චිත්ත ස්වභාවය තුළ ලෝකයක්. එයා ඉන්න කොට ලෝකයක් මැවිල තිබුණ නේද? එතකොට මේ ශක්ති ස්වභාවය සකස් වෙන එකක් තේරුණේ නෑ නේද? මේ ශක්ති ස්වභාවය සකස් වන එකක්. ඒ කියන්නෙ මෙයාට මේ ලෝකය තියෙනව කියන්නෙ තියෙනවම තමයි. ඇයි ඒ විශ්වයේ කොතනද මෙතන වතුර අතනට ගියේ නෑ. අතන ඒව එතන අංශු එතනම සකස් වුණා වගේ කොතන හරි සකස් වෙනව. ඇයි එහෙම කියන්නෙ. ඒත් තේරුණේ නැද්ද? මෙතනින් කවුරුත් මැරුණට පස්සෙ යනව නෙමෙයි. මෙතන අංශු මෙතනමයි. සකස් වුණත් නැති වුණත් තව තැනක මේ ස්වභාවයට සමාන ස්වභාවයක් තිබුණොත් සකස් වෙනව. අතන විදුලි කොටන කොට මෙතන ජනෙල් හෙල්ලෙන්නෙ මේ සුකුම ස්වභාව සකස් වෙන තැන්වල සකස් වෙනව. මේක ෆික්වන්ස් එකක් කීවේ ඒකයි. මෙතන සිරස අල්ලනව නේ. තව තැනකට ගිහිල්ල සිරස අල්ලන්න පුලුවන්නේ. ෆික්වන්ස් එක සමානයි නේ. සකස් වන එකක්. ශක්ති ස්වභාවය සකස් වන එකක්. ස්කන්ධයක්. ස්කන්ධය කියන කතාව අතිශයින්ම ගැඹුරු කතාවක්. මේක මේ කියන කතාව අභිඥ්ඥාවට මහා ඥාණයට සකස් වන එකක්. අපි කියන්නෙ නෑ ඔබට පිළිගන්න කියල. අපි කියන්නෙ නෑ ඔබට මේක භාර ගත්ත කියල. අපි කියන්නෙ ඔබ මේක දරාගන්න. ඔබ යම් දවසක හොඳින් යන්න ගැඹුරින් ගැඹුරට යන්න. අධ්‍යාපනය කර කර සත්‍ය හොයන්න. ඔබට දැනෙයි කවදහරි එහෙම දැනුනොත් එදාට භාර ගන්න. ඒ තාක් මේක දැනුමට විතරක් ගන්න. පිළිගන්නත් එපා. ප්‍රතික්ෂේප කරන්නත් එපා. බුදුන් වහන්සේම ඒ දේශනා කරපු ආකාරයට තමයි අපිත් මේ කියන්නෙ. මේ සත්‍ය සත්‍යම බව ප්‍රත්‍යක්ෂතාවයට පත් වන තෙක් කිසිකෙනෙක් භාරගන්න එපා. නමුත් මේ අපට දැනෙන දේ අපට ප්‍රත්‍යක්ෂ දේ අපි ඔබට හෙලි කරනව පමණයි. මෙතන කර්ම විෂය තමයි කර්ම විෂය බුදුන්

වහන්සේ කතා කරන්න එපා කියපු විෂයක්. අභිඥ්ඥාවෙන්ම දැකිය යුතු කාරණයක්. ඒ මහා අභිඥ්ඥාලාභීන්ට පමණයි. ඒක සකස් වෙන්නෙ. ඔබට කියනව නම් මෙන්න මෙහෙම ස්වභාවයක් තවත් උපමාවක් අපි ඉදිරිපත් කරන්නම්. ඔබ හිතන්න මේක **පුරාණ මිදං භික්ඛවේ කම්මං වදාමි** කියන පැත්තට ඔබ කැමති විදියට මේව ගලපගන්න. නමුත් අපි මේ සිස්ටම් එක පැහැදිලි කරනව මේ මොකක්ද වෙන්නෙ කොහොමද? නිවන් දකින්නෙ කොහොමද මේකෙන් මිදෙන්නෙ කියල පැහැදිලි කරනව පමණයි. එතකොට මෙතන බුදුන් වහන්සේම පමණයි ඇත්තට ම මේක සකස් වන ස්වභාවයෙන් මිදීමක් ගැන පෙන්වන්නෙ. එතන පුද්ගලයෙකුගෙ කතාවක් නෑ. ආත්ම කතා නෑ. මේකෙ තියෙන්නෙ සිස්ටම් එකක්. මේකෙ තියෙන්නෙ. දැන් ඔබ හිතනව සාමාන්‍ය මනුෂ්‍යයෙකුට මේව මුකුත් දන්නෙ නැති නොතේරෙන සාමාන්‍ය මනුෂ්‍යයෙකුට ගැඹුරට යන්න බැරි කෙනෙකුට අපි කියනව දිව්‍ය ලෝකයක් ගැන නිරයක් ගැන මේ වගේ අමුතු අමුතු දේවල් ටිකක් අපි කියනව. එතකොට මෙන්න මේක හොඳට බලන්න. මෙතන සුකුම සංඥාවක් තියෙන්නෙ. සංඥාවක් මෙතන සකස් වෙන්නෙ. ඒ සංඥාව ලෝභය වැඩි වෙන කොට අගය වැඩි වෙනකොට ද්වේශය වැඩි වෙන කොට ගින්න වැඩි වෙන කොට මේකෙ වෝල්ටීයතාවය වැඩිවෙන කොට, අපි කියනව නේ දැන් විද්‍යුතයට වෝල්ටීයතාවයක් තියෙනව නේ. විද්‍යුතයේ ඒකකයක් තියෙනව නේ. ඒ ශක්තියෙ තියෙනව ඒකකයක් ඒ ඔබේ චිත්ත ශක්තිය. ඒ ඒකකය වැඩි වෙනව. ඒ ඒකකය වැඩි උනොත් ඒක දැවීම වැඩියි. දැවීම වැඩි වුණොත් තමයි ඔබට ඒ දැවීම අනුව තමයි මේව සකස් වෙන්නෙ. ඒක සකස් වෙන්නෙ සිතක. ඉස්සෙල්ල ඒක දකින සංකාරයක් ඒ සංකාරය ඔබ හිතන දෙයක්. ඔබ හිතන චිත්තයක්. ඒ චිත්තය තුළ ඔබගේ චිත්ත ස්වභාවය තුළ සකස් වන ඒ චිත්ත ස්වභාවය තුළයි ඒක තියෙන්නෙ. ඒ කියන්නෙ මෙතන

තියෙන දැවීම ඔබට නවත්වන්න බෑ. ඔබ යම්කිසි දේකට ආස වෙනව. ලොකු ආසාවක් ඇතිවෙනව. අපි හිතමු. මොනවට හරි සල්ලි වලට හරි මොනවට හරි ලොකු ආසාවක් ඇති වෙනව. ආශාව කියන්නෙ ගින්නක්. ඒක රාග ගින්න ඒකයි බුදුන් වහන්සෙ දෙපැත්තම ගින්නක් තියෙන්නෙ ද්වේශයක් තියෙනව. ඔබට මහ තරහක් එනව කවුරු හරි මරන්න ඕන කියල ඒ මරන්න ඕන කියන තරහව ගින්නක්. ඒ ගින්න තමයි මේකෙ වෝල්ටීයතාවය වැඩිකරන්නෙ. මේ චිත්ත ශක්තියෙ ඒකකයෙ ශක්තියෙ තීව්‍රතාවය වැඩි කරන්නෙ. එතකොට තීව්‍රතාවය වැඩි වන විදියට ඔබගේ නැවත සකස්වීම සිද්ධ වෙන්නෙ සකස් වෙනව කියන්නෙ පුද්ගලයෙක් නොවෙයි. ඔබගේ කියල කෙනෙක් නෙවෙයි මේ සංඥාවක්. චිත්ත සංඥාවක් සකස් වෙනව. චිත්ත ශක්තියක් සකස් වෙනව. ඒකයි ස්කන්ධයක් කියන්නෙ. ස්කන්ධය සකස් වෙන්නෙ ඔතනින් ස්කන්ධය පෙර කර්මයෙන් සකස් වෙනව කිව්වෙ ඕකයි. ධර්මය තුළ ඔබට එහෙම අහන්න ලැබෙනව. පුරාණ මිදං භික්ඛවේ කම්මං වදාමි නමුත් ඔබට අහන්න ලැබෙනව මේ ස්කන්ධය පෙර කර්මයෙන් සකස් වෙන්නෙ මේක සාසවීයයි කිව්වෙ ඒකයි. පුංචි දරුව සාසවීයයි කිව්වෙ ඒකයි. ප්‍රභාෂ්වර සිතට එන විට සාසවීයයි කීවෙ ඒකයි. සකස් වෙනව කියන එකයි. සකස් වෙනව කියන්නෙ ඇලෙනව කියන එකයි. ඒ ශක්තිය නැවත ඇලෙනව කියන එකයි. ඇලෙන්න හේතු තියෙනව කියන එකයි. එතකොට ඒක අනුව තමයි ඔබගේ මේ චිත්ත ස්වභාවය අනුව තියෙන රූප සටහන් අනුව තමයි ඒක ගැලපෙන්නෙ. ඒ චිත්ත ස්වභාවයෙ තියෙන රූප සටහන් වල එතනට තමයි ඒ තීව්‍රතාවය සෙට් වෙන්නෙ. ඒක නිසා තමයි ඔය චිත්ත ස්වභාවයේ තියෙන රූප සටහන්වල තියෙන ඒ එකක් තමයි ඒකට එකතු වෙන්නෙ. අවසාන චිත්ත ස්වභාවය සකස් වුණ ස්වභාවය ඒ රූපයක් විදියට තමයි සකස් වෙන්නෙ. ඒ රූපය තමයි ඊළඟට ඔබට කොහේ හෝ තිරිහන් ලෝකෙක හෝ සතෙක්

ගාව අර තීව්‍රතාවය තියෙන තැනකයි හැබැයි ඉන්නෙ. හැබැයි තීව්‍රතාවයට ආදේශ කරන රූපයක් එනව ඒ රූපයත් එක්ක තමයි මෙතන සකස් වෙන්නෙ. මේක ගැඹුරු විෂයක්. ස්වභාවය එතන සකස් වෙනව. කතා ගොඩක් කියන්න වෙනව. එතකොට ඒක නෙවෙයි අපේ විෂය ඒක අපට කතා කරන්න ඕන එකක් නෙවෙයි. කර්ම විෂය ගැන වැඩිය කතා කරන්නෙ නැතිව ඉන්නෙ. බුදුන් වහන්සෙ එහෙම සමහර වෙලාවට ඒකෙන් මොකක්හරි හේතුවක් නිසයි කියන්නෙ ඒක නිසා අපි ඒව කියන්න යන්නෙ නෑ. නමුත් මේව අභිඤ්ඤා ඥාණයට හසු වෙන්නෙ නමුත් ඒව දකින්න පුලුවන් හොඳට ගලපන්න ඕන. හොඳට පීර පීර බලන්න ඕන. මෙන්න මේ ස්වභාවය කර්ම විෂය පැත්තටය මේක තියෙන්නෙ. මේකෙම ඔබ තව ස්වභාවයක් දකින්න ඒ කියන්නෙ ඔබ පින් කරන කොට අපි කිව්ව නේ චිත්ත ශක්තියක් කියල. ඒකට යම්කිසි ඒකකයක් කියල. අපි කිව්ව නේ මේක රාගය වැඩි වෙන කොට වැඩි වෙනව. ද්වේශය වැඩි වෙන කොට වැඩි වෙනව කියල. අපි කිව්ව නේ රාග, ද්වේශ, මෝහ අඩුවෙන කොට ඒ ශක්ති ස්වභාවය තුනී වෙල මෙතන ශූන්‍යතාවයට එනව කියල. ඒක තමයි සිද්ධ වෙන්නෙ. නමුත් ඒක අවබෝධය තුළින් එන්නෙ. කෙනෙක් නැති බව අවබෝධ වන විට ම සෝතාපන්න වෙනව කියන්නෙ පටිසෝතය නේ. අනුසෝතය නෙමෙයි නේ. සෝවාන් වෙනව කියන්නෙ. පටිසෝතයට එනව කියන්නෙ මේ ගිණි වළල්ල කැරකෙන එක නවතින්න ගන්නව නේ. සංකාර උපේක්ෂාවට එනව කියන්නෙ ඒක නේ. සබ්බ සංකාර සමථයට එනව නේ. ගිණි වළල්ල කැරකෙන එක නවතිනව නේ. ගිණි වළල්ල කැරකෙන එක නවතින්න එනව කියන්නෙ චිත්ත ශක්තිය එනව නේ. තණ්හාව කියන තැනටයි එන්නෙ. ඔබ හිතුවෙ නැතු උනාට. ඒ කියන්නෙ දර්ශන සමාපත්තිය තුළින් ඔබට ඒ කියන්නෙ මේ සසර කතාවක් කියනව නෙවේ. සසර කතාවක් කියන්න. මැරි මැරී

උපදින සසර කතාවක් කියන්නෙ ඒක ශක්ති ස්වභාවයක් නේ. ඒකෙ ඔබටම පාලනය කරන්න බැරි විශාල ශක්ති ස්වභාවයක් ඔබ ගාව තියෙනව. ඒ ශක්ති ස්වභාවය ගොඩනැගෙන විශාල එහෙම කතා ගොඩක් ඔබට කියන්න පුලුවන් මේ ගිය ආත්ම ඔහොම ගොඩක් ඒව කියන්න පුලුවන්. නමුත් ඒව අපි පැත්තකින් තියමු. පැත්තකින් තියල මේ ශක්ති ස්වභාවයක් තියෙනව නේ දැන් මෙතන. දැන් මේ චිත්ත ශක්ති ස්වභාවය ගැන නේ අපි කතා කරන්නෙ. අපි මෙන්න මේ චිත්ත ශක්ති ස්වභාවය අතිශයින් ගැඹුරු මාතෘකාවක්. මේ කියන්නෙ අපි හිතමු ඔබ මේ රාග ද්වේශ මෝහයෙන් නේ මේ චිත්ත ස්වභාවය හැදෙන්නෙ. රාග ද්වේශ මෝහ තුනී වෙනව නේ. නමුත් ඔබ සෝවාන් වෙන කොට ඔබ දර්ශන සමාපත්තිය ලබන කොට සත්‍ය අවබෝධ වෙන කොට පරම සත්‍ය අවබෝධ වන විට බාහිර ලෝකෙ බොරුවක් කියල දකින කොට ඒක හැදෙන එකක් කියල ඒක හැදෙන එකක් නෙවෙයි. ඒක සිතුවොත් සකස් වෙනව කියල දකිනව නේ. ඒකට රැවටුනොත් සකස් වෙනව කියල දකිනව නේ. සත්‍ය දකිනව නේ. සත්‍ය නම් මෙහෙමයි කියල දන්නව නේ. බාහිර ඇත්ත නෙවෙයි සිතත් ඇත්ත නෙවෙයි මේක මායාවක් කියල ඔබ දකිනව නේ. හේතු තියෙන කොට තියෙනව හේතු නැති වෙන කොට නැති වෙනව. හේතු තියෙන කොට සකස් වෙනව. හේතු නැති වෙන කොට නැති වෙනව. මේක ඇත්ත දැක්කොත් සකස් වෙන්නෙ නෑ. ඇත්ත කතාව. ශක්ති ශූන්‍යතාවයට යනව. ශක්ති සකස් වෙන්නෙ නෑ. එහෙම වුණොත් නැවත උපදින්නෙ නෑ. ඕක නේ ඇත්ත කතාව. දැන් මෙතනට ලෝක ද්වේශ මෝහ සත්‍ය දැනගන්නව කියන්නෙ මේ සත්‍ය ඔබට නැවත බාහිරයට එකතු වෙන්නෙ නැහැ නේ. බාහිර ඇත්ත වෙන්නෙ නැහැ නේ. දැනගත්තම කියන්නෙ ඔබ නැවත බාහිරයට එකතු වෙන්නෙ නැනේ. බාහිර ඇත්ත වෙන්නෙ නෑ නේ. දැන් මෙතන ශක්තිය ජනිත වෙන්නෙ නැති වෙනව නේ. මේ

ක්‍රියා සිත උපදිනව නේ. ක්‍රියා සිත උපදිනව කියන්නෙ මේ කර්ම විපාක නැහැ නේ. කර්ම විපාක නැති වෙනව නේ. එතකොට වෙන්නේ මේ සත්‍ය අවබෝධ වෙන කොට මේ සත්‍ය අවබෝධ වීමත් සමග ඔබ බාහිරින් මිදිල නේ. දැන් කම්පනය වෙන්නෙ නැහැ නේ. කම්පනය වෙන්න අන්ත 2ක් එපැයි. දැන් එතකොට කෙනෙක් පුද්ගලයෙක් ඉන්නව කියන එක එන්නෙ නෑ නේ. බාහිර දැන් එන අරමුණ එන්නෙ අරමුණු නේ. සිත කියන්නෙ. අරමුණු වලින් නෙ මේක දැන් මේකට කරන්ට් එක එන්නෙ. ශක්තිය උපදින්නෙ අරමුණු වලින් නේ. දැන් බැටරියට අපි කියනව නේ ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන වගේ ඔබට එන අරමුණු වලින් තමයි බාහිර තියෙනව කියල ගත්තොත් තමයි මෙහෙන් ආසාවක් උපදින්නෙ බාහිර තියෙනව කියල ගත්තොත් ආසාවක් ඉපදුණොත් ශක්තිය උපදිනව. ඒ ශක්තිය එතකොට වැඩි වෙනව. එතකොට බාහිර තියෙනව කියල ගත්තොත් ද්වේශයක් ඉපදුණත් ඒකෙන් නෙ මේ දැන් මේ වෝල්ටීයතාවය එන්නෙ වැඩිවෙන්නෙ. කරන්ට් එක වැඩි වෙන්නෙ අඩු වෙන්නෙ. එතකොට එහෙම වුණොත් නේ. ඔබට මේ නැවත උපදින්න ශක්තිය සකස් වෙන්නෙ රාග ද්වේශ මෝහ කියන්නෙ මේක නේ. රාගයයි ද්වේශයයි නේ යන්නෙ. රාග ද්වේශ මෝහ එහෙම නැති කරන එකක් ද ඔබ හොඳට බලන්න. සත්‍ය දකින කොට බාහිර ඇත්තක් නොවන කොට මේකෙ ඇලෙන්න රාගයක්වත් ද්වේශයක්වත් ඇති වෙන්නෙ නැහැ නේ. එන එන අරමුණු මිදෙනව නේ. එන එන අරමුණෙන් නේ මේක හැදෙන්නෙ. එන එන අරමුණෙන් රාග ද්වේශ මෝහයෙන් නේ හැදෙන්නෙ. රාග ද්වේශ මෝහ ඇති වෙන්න නම් බාහිර මොනවහරි දෙයක් තියෙන්න ඕන නේ. පොතක් හරි තිබ්බොත් නේ ඒකට ආශාවක් ඇති වෙන්නෙ. බාහිර ළමයෙක් හරි හිටියොත් නේ ආසාවක් ඇති වෙන්නෙ. බාහිර ගහක් හරි තිබ්බොත් නේ ආශාවක් ඇති වෙන්නෙ. හැබැයි බාහිර එහෙම දෙයක් නෑ කියල අවබෝධ

වෙන කොට බාහිරත් එක්ක කම්පනය නැති වෙන කොට සිතේ ආසාව නැති වෙනව නේ. සිතේ ලෝභය ද්වේශය නැති වෙනව නේ. රාග ද්වේශ මෝහ නැති වෙනව කියන්නෙ වෝල්ටීයතාවය චිත්ත ශක්තිය නැති වෙනව නේ. ශූන්‍යතාවය කරා යනව නේ. අන්න ඒක නේ රාග ද්වේශ මෝහ රාගක්ඛයෝ ද්වේශක්ඛයෝ මෝහක්ඛයෝ කියල නිබ්බාන කියල පෙන්වන්නෙ. එහෙම නම් මේකෙ සත්‍ය දකින තැනයි. මේ සේරගෙන්ම මිදීම තියෙන්නෙ ඒ තාක් මේ ශක්තිය කියන්නෙම ලෝභය ද්වේශය කියන්නෙම මෙතන තියෙන්නෙ ඇත්ත ම කියනව නම් මේ චිත්ත ශක්තිය තියෙන තාක් කල් මේක නැති වීමක් වෙන්නෙ නෑ කියන එක නේ. මේ ශක්ති ස්වභාවය ලෝකයෙම තියෙන විශ්වයෙම තියෙන ශක්ති ස්වභාවයක් බවට පත් වෙනව නේ. ඒ ශක්ති ස්වභාවය කියන්නෙ මෙහෙම ශක්ති ස්වභාවයකුත් නෙවෙයි. මේක කිව්වොත් මේක අංශු ටිකක් ඒ ශක්ති ස්වභාවය තිබුණොත් සකස් වෙනව. අංශු ටිකක් ඒ කියන්නෙ ශුද්ධාෂ්ටකය කියන්නෙ අංශු ටිකක්. මුලු විශ්වයෙම එකම ස්වභාවයක් එකම අංශු ස්වභාවයකින් දක්වතොත් ඔබට උපමාවක් විදියට ඒක හේතු තියෙන කොට ඇති වෙනව හේතු නැති වෙන කොට නැති වෙනව ඒකයි හේතුව පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති කීවෙ. දැන් බලන්න සේලා තෙරණිය කියනව නේ නහිදං අත්ත කතං බිම්බං නහිදං පර කතං අගං කියන මේ සේලා තෙරණියගෙ සංයුක්ත නිකායේ සේලා සූත්‍රයෙ ඔබ දැක්කොත් නහිදං අත්ත කතං බිම්බං නහිදං පර කතං අගං හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති දැන් බලන්න යථා අඤ්ඤතරා බීජං තෙත්තා වුත්තා

සම්භූත හේතු භංගා නිරුජ්ජති එතකොට නහිදං අත්ථ කතං බිම්බං නහිදං පර කතං අගං කියන කොට ප්‍රතිබිම්බය තමා විසින් හැදුවා නොවේ. වෙන අයෙකු විසින් හැදුවා නොවේ.

නහිදං අත්ථ කතං බිම්බං නහිදං පර කතං අගං හේතුං පටිච්ච සම්භූතං සම්භූතං හේතු භංගා නිරුජ්ජති හේතු ඇති වන විට ඇති වෙනව. හේතු නැති වන විට නැති වෙනව. එක්තරා බීජයක් කෙතක පැළ කරනව නම් පෘථිවි සාරයත් දිය සීරාවත් අවශ්‍ය වේ. ඒ උපමාවක් පෙන්වන්නෙ. යථා අඤ්ඤතරං බීජං කෙත්තා වුත්තං විරූහති පඨවි තසංච ආගම්ම සිනේතංච නද්වූභයං එක්තරා බීජයක් කෙතක පැළ කරනව නම් පඨවි සාරයත් දිය සාරයත් පෘථිවි සාරයත් අවශ්‍ය වේ. අන්න ඒ උපමාව පෙන්වනව ඒ කියන්නෙ බීජයක් පැළවෙන්න නම් අර කොස් ඇටේ උපමාව ගත්තොත් ඒක දැම්මොත් පොළවට පෘථිවි සාරය හරි දිය සීරාව හරි වේ. නැති වුණොත් මේ බීජය පැළ වෙන්නෙ නෑ. කියනව. එතකොට ඒ උපමාව තමයි පෙන්වන්නෙ. දිය සීරාව වතුර නැතිව පැළවෙන්නෙ නැනේ. පෘථිවි සාරය වතුර නේ මේ ගහ වගේ ඔක්කොම හදාගෙන යන්නෙ. එතකොට පෘථිවි සාරයයි වතුරයි තිබ්බොත් නේ මේ ඔක්කොම පැළවෙන්නෙ. මෙන්න මේ වගේ මේ ස්කන්ධයෝද ධාතුයෝද ඒවං කන්‍ධාච ධාතුයෝ අච ආයතනං ඉමේ හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති ඒවං ස්කන්‍ධ ධාතුයෝ කියන්නෙ මේ ස්කන්ධයෝ ද ධාතුයෝද පංචස්කන්ධයෝ අටලොස් ධාතුන් මේ ආයතන හේතු නිසා හටගෙන හේතු නැති වන විට නැති වේ ආයතන ධාතු ස්කන්ධ මෙන්න මේ කතාව තමයි මේ සම්පූර්ණ කතා කරන කතාව ඒ කියන්නෙ ධාතු කියන්නෙ මහා භූත පඨවි ආපෝ තේජෝ වායෝ 4 ම මහා භූත. ස්කන්ධ කියන්නෙ වේදනා සංඥා සංකාර එතකොට ආයතන කියන්නෙ මේ ඇස කන නාසය දිව. එතකොට ඇසත් ස්කන්ධ ධාතු ආයතන කියන කොට අටලොස් ධාතු කියනව නේ. චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණාං ඇසත් රූපයත් චක්ඛු ධාතු රූප ධාතු චක්ඛු විඤ්ඤාණ ධාතු කියන්නෙත් ඕකම තමයි. ඒ කියන්නෙ ඇස කියන්නෙ ආයතන ධාතු ටික. එතකොට රූප ධාතු කියන්නෙ මහා භූත

හරහා ධාතු ටික මේ නිසා හටගන්න විඤ්ඤාණ ධාතු ටික. ඇස කියන්නෙ එක උපමාවක් නේ. එහෙම ගත්තොත් එතකොට වර්ණ ශබ්ද ගන්ධ රස ඕජා නේ. එතකොට මේ ධාතු ටිකත් මේ කතාවෙ තියෙන්නෙ ආයතන ටිකක් නෙ. එතකොට ඇසත් හැදෙන්නෙ ආලෝකයක් තිබ්බොත් නේ. එහෙම වුණොත් නේ ඔබට වර්ණයක් පේන්නේ. එතකොට මේ අයතන ටිකයි මේ ධාතු ටිකයි ස්කන්ධය කියන්නෙ මේ දැනගත්තු විඤ්ඤාණ ටිකයි නේ. වේදනා සංඥා සංකාර නේ විඤ්ඤාණයෙන් නේ දැනගන්නෙ. සිත හැදෙන්නෙත් එතකොට ආලෝකය තිබුණොත් එතකොට මේ ආයතන තිබුණත් තමයි සිත හැදෙන්නෙ. තව විදියකින් කීවොත් නාමයත් රූපයත් ඒකම තමයි. මේ කියන්නෙ නාමයත් රූපයත් කියන්නෙ ස්කන්ධ ටික. රූපය කියන්නෙ බාහිර තියෙනව කියල ගත්ත ටික. මේ 2 ගැටගැහුණොත් ආයතන ටික හැදුණොත් ඒ කියන්නෙ මෙතන සිත කියන එක හැදෙනව. කියන එක ඒකම තමයි මේ පෙන්වන්නෙ පංචස්කන්ධයත් අටලොස්ධාතුන් හේතු නිසා හට ගෙන හේතු නැති වීමෙන් නිරුද්ධ වෙනව. හේතු තිබ්බොත් හට ගන්නව. නැති වුණොත් නැති වෙනව. එතකොට නහිදං අත්ථ කතං බිම්බං නහිදං පර කතං අගං හේතුං පටිච්ච සම්භූතං හේතු නිරුජ්ජා නිරුජ්ජති කියන්නෙ. මේක තමා විසින් හැදුවක් නෙමෙයි. වෙන අයෙක් විසින් හැදුවක් නෙවෙයි. හේතු තියෙන කොට ඇති වෙනව. හේතු නැති වෙන කොට නැති වෙනව. කවුරුත් කරන එකක් නෙවෙයි කියල. සභාදහමේ සංසිද්ධියක් බව හොඳටම මේ සූත්‍රය තුළ පෙන්වනව. හේතු ඵල දහම කියන්නෙ ඕකනේ. හේතු ඵල දහම තුළ දෙයක් නැනේ. හේතුඵල දහම තුළ දෙයක් නෑ. හේතු තිබ්බොත් තියෙනව හේතු නැති වුණොත් නැති වෙනව. ආලෝකය ආවොත් පේනව. ආලෝකය නැති නම් පේන්නෙ නෑ. සිතක් කියල දෙයක් හම්බ වෙන්නෙ නෑ. හේතු තියෙන කොට සිත සකස් වෙනව හේතු නැති වෙන

කොට නැති වෙනව. එතකොට සිතක් කියල දෙයක් නෑ. ඒක තමයි ඇත්තට ම සිතේ ආරම්භක කතාව. මෙහෙම දෙයක් තියෙනව කියල ගත්තොත් හෙම මොකද වෙන්නෙ. අන්න තියෙනව කියල ගත්තොත් තමයි බීජය පැළ වෙන්නෙ. එහෙම වුණොත් තමයි කොස් ඇටේ පැළ වෙලා මහ වෘක්ෂය හැදුණ වගේ වෙන්නෙ. එතකොට තමයි මේ සිතක් කියල එකක් තියෙනව කියල ගත්තොත් තමයි අපට දුකක් තියෙනව සැපක් තියෙනව. රාගයත් තියෙනව. ද්වේශයත් තියෙනව. ඒ කියන්නෙ බාහිර තියෙනව කියල ගත්තොත් එතකොට අපට ඉරිසියාවත් තියෙනව වෛරයත් තියෙනව. සැප තියෙනව. මරණයත් තියෙනව. ඔක්කොම තියෙනව. මේ සේරම අපේ මේ දුක් විදින්නෙ මරණයක් තියෙන්නෙ මේ සේරම අපට දෙයක් තියෙනව කියල ගත්තම. එතකොට මේ ඇත්ත දකින කෙනාට එහෙම දෙයක් නෑ. එහෙම කෙනාට මේ සියල්ලෙන් මිදෙනව හේතුඵල දහම අවබෝධ කර ගෙන මිදෙනව රැවටෙන කෙනා  සියල්ලම තියෙනව කියල ගන්නකම නිසා නැවත සකස් වෙන්න හේතු උපදිනව. ඒක තමයි දුකට හේතු වෙන්නෙ. ලෝභ ද්වේශයට හේතු වෙන්නෙ ඒක. ඔහොම තමයි නැවත සකස් වෙවී යන ගමනක් මේක තවත් ගැඹුරුය මෝග රාජ සූත්‍රයට ගියාම ශුන්‍යතෝ ලෝකං අවේකං මෝග රාජා සදා සතෝ අත්තානුදිට්ඨිං ඒවං මජ්ජේ නරෝසිය ඒවං ලෝකං අවේකං මාච්චු රාජා නපස්සති මෝඝ රාජ හැම කල්හි ම සතිමත්ම ලෝකය ශූන්‍ය ලෙස බලව. හිස් ලෙස බලව. ආත්ම අනුව ගිය දෘෂ්ටිය මුලිනුපුටා දමනු. එය මුලිනුපුටා දැමීම තුළින් එය මාරයාගෙන් එතෙර වන්නේය. මේ ආකාරයෙන් ලෝකය දෙස බැලිය යුතු වන්නේය. ශූන්‍යතෝ ලෝකං අවේකස්සු මෝඝරාජ සදා සතෝ අතථානුදිට්ඨිංච ඒවං මච්චුනෝ රෝසියා

අවේකන්තං මච්චු රාජා එතකොට ශූන්‍යතෝ ලෝකෝ මෝගරාජ ආත්ම අනුව ගිය දෘෂ්ටිය අතහරින්න. මාරයා

ජයගනී. ආත්ම දෘෂ්ටියම තමයි තියෙනව කියල ගත්ත එකම තමයි ඒකම තමයි මාරයා. දැන් නැති දෙයක් තියෙනව කියල ගත්ත එකම තමයි ස්පාක් එක කරන්ට් එක ඉපදීම මෙතන දෘෂ්ටියක් තියෙන්නෙ. ඒ කියන්නෙ දෘෂ්ටියක් ඉපදිල තියෙන්නෙ. මෙතන නැති දෙයක් ඇති දෙයක් වෙල. ඒ කියන්නෙ කලින් තිබුණ දෙයක් නොවේ. මේ දැන් සකස් වෙන්නෙ. මේ දැන් ඔබට සිතට අරමුණක් එනකොට ඒ අරමුණට ඔබ ඇලෙනව නම් ඒ අරමුණු ඔබට එනව කියන්නෙ දැන් ඔබට වර්ණයක් පේනව. ඒ වර්ණයට ඔබ ඇලෙනව නම් ඒ වර්ණය තියෙනව වෙනව නේ. දැන් පොතක් තියෙනව හැඩතලයක් තියෙනව. මොකක් හරි තියෙනව. තියෙනව කියන එකම තමයි දෘෂ්ටිය ඒකම තමයි මායාව. ඒකම තමයි බොරුව. ඒක තිබුණොත් ඔබ ඒකට ඇලෙනව එක්කො ගැටෙනව. එක්කො කැමති වෙල එක්කො අකමැති වෙලා. ඔතනම තමයි ගින්න තියෙන්නෙ. ඔතනම තමයි මේ චිත්තය තියෙන්නෙ. එතනම තමයි ඔබ කියන කෙනා ඉන්නෙ. එතනම තමයි ආත්ම දෘෂ්ටිය තියෙන්නෙ. මේ හැම කතාවකම උපදින්නෙ ඔතන. එතන තමයි නාමරූප පච්චයා විඤ්ඤාණං කියන මහා නිදානය තියෙන්නෙ. එතනින් තමයි මේ හැමදේම තියෙනව කියල ගැනීම තුළයි තියෙන්නෙ. පර්යාය පෙන්වනව නම් **චකඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චකාඛු විඤ්ඤාණං තින්නං සංගති ඵස්සෝ** කියන්නෙ පර්යාය තුළ ඇසත් රූපයත් ඇසේ විඤ්ඤාණයත් නිසා හටගන්න ප්‍රතිබිම්බය ස්පර්ශය මනසින් ගන්නවා. ඊට පස්සේ ඒක පෙර මතකයෙන් ගලපනව දෙයක් පොතක් කියල හමු වීම ඒක තමයි පස්ස පච්චයා වේදනා යම් වේදයන් යම් සංඡානාති යං සංඡානාති, තං විතක්කේති යං විතක්කේති බාහිර රැවටීම බාහිරව නැවත අල්ලා ගැනීම. දැන් මෙතන ඇසට හැඩතලයක් එතකොට හැඩතලය ඇස හඳුනන්නෙ නෑ. මස් ඇසට පෙන්නේ නැ වගේ නමුත් ඒක මනෝ විඤ්ඤානය කියන එක කොහේවත් තියෙන එකක්

නොවේ. මේකත් සකස් වන එකක්. එතනම සකස් වෙලා නැති වන එකක්. එතන එතන ම මේ සේරම ඇති වෙලා නැතිවන එක **නහිදං අත්‍ථා කතං බිම්බං නහිදං පර කතං අගං** කවුරුවත් හැදුව නොවේ. තමා විසින් හැදුවත් නොවේ. හේතු තියෙන කොට තියෙනව හේතු නැතිවෙන කොට නැති වෙනව. ඒ කතාවම තමයි මේ තියෙන්නෙ. මෙතනම සකස් වෙලා නැති වන එකක් තියෙන්නෙ. ඒත තමයි ඇත්ත කතාව. ඒක තමයි යථාභූත ඥානය. කොහෙවත් තියෙන එකක් නෙවෙයි මෙතනම ඇති වෙලා නැති වෙන එකක්. කොහෙවත් තිබුණ එකක් නොවෙයි. මේ දැන් ඇතිවෙලා නැති වුණ ස්පාක් එකක් ෂෝට් වීමක් තියෙනව කරන්ට් එක වගේ ඒ කියන්නෙ අපට දෙයක් පේන කොට අපේ චිත්ත ෂෝට් එකක් තමයි තියෙන්නෙ. කරන්ට් එක දැන් ෂෝට් වෙන්නෙ. නෙගටිව් පොසිටිව් වයර් 2 ෂෝට් වුණොත් මොකද වෙන්නෙ. එතනින් කරන්ට් එකක් උපදිනව නේ ස්පාක් වෙනව නේ. ටක් ගාල ගින්දරක් වගේ එනව නේ. ඒකම තමයි විඤ්ඤාණය කියන්නෙ. ඒකම තමයි ඔබ කියන්නෙ ඕකමයි සිත කියන්නෙ. ඔබ තියෙනව කියල ගන්නව. ඒකම තමයි ෂෝට් වීම දැන් බාහිර නැති දෙයක් ඒ වුණාට ඒකම තමයි චිත්ත නියාමය. එතනින් තමයි සිතක් පටන් ගන්නෙ. සිතක් කියල එකක් නෑ. සිතක් හැදෙන්නෙ එහෙමයි. අපි අල්ල ගන්න එකක් තියෙනව. ඒක තියෙනව කියල ගන්න නිසාම අල්ල ගන්නව. සත්‍ය දකින කම්ම මේකෙන් මිදෙන්න බෑ. ශක්තිය ඇති වෙවී යනව. ශක්තිය ඇති වෙවී යනකම්ම අන්තිම මොහොතෙත් ලෝකෙ තියෙනව මැරෙනව කියන තැනටයි යන්නෙ. එතනින් ඔබ මේක නැවත සකස් වෙන්න හේතු වෙනව. මේකෙ විශාල භයානකකමකුත් තියෙනව මේක ගැන ගොඩක් කතා කරන්න තියෙනව. අපි හිතමු ඔබ මුලින් ඉපදෙන කොට මනුෂ්‍ය ආත්මයක තියෙන ශක්ති ස්වභාවයක් තියෙනව. ඇත්ත කියන්න එපැය. විඤ්ඤාණය මනුෂ්‍ය ස්වභාවය තුළ තියෙන

ශක්ති ස්වභාවයක් තියෙනව. ඒක නෙවෙයි තිරිසන් සතාගෙ ළඟ තියෙන ශක්ති ස්වභාවය වෙනස්. යම්කිසි වෙනසක් තියෙනව. ගැණියෙක් පිරිමියෙක් ගත්තත් යම්කිසි සුළු හෝ වෙනසක් නිසා නේ වෙන්නෙ. ඒ ශක්ති ස්වභාවයෙ යම්කිසි සුළු හෝ පත්වීම නිසා නේ එහෙම ස්වභාවයකට රූප ස්වභාව 2කට පත් වෙලා තියෙන්නෙ. ඒකම තියෙනව නේ සත්තු දෙන්නෙක් ගත්තත්. චිත්ත ශක්තියෙ තියෙන යම්කිසි ප්‍රභවය වොට් එක එහෙම නැතිනම් අගය තීව්‍රතාවය අඩු වැඩි වීම මතයි මේ ශක්තියේ සකස් වීම කියන එකයි මෙතන අපි තියන්න යන්නෙ. මේ එක දිගට යන විඤ්ඤාණයක්වත් නෙවෙයි. එතන එතන සකස් වන කතාවක්. ඒකයි අපි උපමාව පෙන්නුවෙ. දිය බඳුනෙ උපමාව පෙන්නුවෙ ඒකයි. එතන එතන අංශු සකස් වීමක්. යන එකක් නෙවෙයි කියල. මැරිල කොහෙවත් එහෙම යන එකක් නෙවෙයි. නමුත් මේක දෘෂ්ටියක් තුළයි තියෙන්නෙ. රැවටීමක් තුලය මේ මායාව තුලය තියෙන්නෙ. මේක පුද්ගල භාවයෙන් දකින්න එපා. සවිඤ්ඤාණක මනසකින් දකින්න එපා. දැන් කරන්ට් එක ආත්මයක් නෙවෙයි නේ. කරන්ට් එක සවිඤ්ඤාණක මනසකින් දකින්න අවශ්‍යතාවයක් නැහැනේ ඔබට. ඔබ කරන්ට් එක ආත්මයක් නෙවෙයි කියල දන්නව නේ. එහෙනම් ඔබේ සිතත් ආත්මයක් නෙවෙයි. දැන් නෙගටිව් පොසිටිව් කරන්ට් එක ආත්මයක් නෙවෙයි නම් ඒක ශක්ති ස්වභාවයක් නම් ඔබේ සිත කොහොමද ආත්මයක් වෙන්නෙ. ඒකෙන් තියෙන්නෙ ඕකමයි. ස්පාක් වෙනව. ඒකෙ තියෙන්නෙ ස්වභාව 2ක්. එතන ස්පාක් වන නෙගටිව් පොසිටිව් එක එතන ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන. මෙතන නැති දෙයක් තියෙනව කියනව. තියෙනව කියපු ගමන් ෂෝට් වෙනව. නෑ කිව්වොත් ෂෝට් එක නෑ. ඕක තමයි ඔබට දකින්න ලැබෙනව අපිට මතක හැටියට දාරුච්රිය සූත්‍රයේ තියෙනව උදාන වාක්‍ය වලත් තියෙනව. සුර අසුර යුද්ධයක් ගැන කතාවක් තියෙනව ඒකෙ අසුරයගෙ බන්ධනය කියල

එකක් තියෙනව. අසුරය පරදිනවය කියනව. සුරය දිනනව කියනව හැබැයි අසුරය හිතුවොත් මෙහෙම අසුරය තමයි හොඳ සුරය නරකයි කියල. ඒ හිතීමය කියනව බන්ධනය. ඒකෙන් තමයි කියනව අසුරය හිර වෙලා තියෙන්නෙ. හැබැයි අසුරය නිකං හරි හිතුවොත් මම හොඳ නෑ අරය හොඳය කියල. ඇත්ත දකිනව කියනව සත්‍ය නම් සුරයම පැත්තට නේ දීල තියෙන්නෙ හොඳයි කියල. අසුරයට දීල තියෙන්නෙ නරක පැත්ත නේ. එහෙම නම් සත්‍ය දකිනව කියනව. අසුරය නරකය සුරය හොඳය කියනව. එහෙම හිතුවොත් එහෙම මාර බන්ධනය ලිහෙනව කියනව. එහෙම වුණොත් අසුරයගෙ බන්ධනය ලිහෙනව කියනව. ඒකම තමයි අපේ තියෙන මාර බන්ධනය. මේව දකින්න හොඳ ඤාණයක් ඕන. ඔබට කතන්දර වගේ තමයි ඕව ධර්මය තුළ අපට අහන්න ලැබෙනව. මේ කතන්දර නෙවෙයි. මේ නිවන් මගය කියන්නෙ. මේ නිවන් මග කියන්නෙ නිවන කියන්නෙ පහන්ව නිවී ගිය තැනක් කොයින්ද කියන එක. පහන නිවී ගියේය කියන්නෙ ගින්දර නිවී ගියා. තෙලුත් ඉවර නම් තිරත් ඉවර නම් පහන නිවී ගියේය. ගිය තැනත් කොහිද කියල අහන්නෙ ඔය කතාවම තමයි. එතකොට ගින්නත් තියෙනව. ඔබට ගින්නක් තියෙනව. ඔබට මර බියක් දුකක් තියෙනව. ගින්නක් තියෙනව. දැන් ඔය ගින්න තමයි පහනෙ ගින්න. තෙලුයි තිරයයි තියෙනකම් ඕක ගිනි ගන්නව. තෙලුයි තිරයි නැති වුණ වෙලාවක ඔය ගින්න දැල්වෙන්නෙ නෑ. එතකොට මෙතන තෙලුයි තිරයි තමයි ඇලීමයි ගැටීමයි. ඇලෙනකම් ගැටෙනකම් දෙයක් තියෙනකම් මේ දේ වෙනව. මේ දෙක නැති නම් මේක වෙන්නෙ නෑ. ගින්න නිවෙනව. ඒ කියන්නෙ මෙතන නාමයයි රූපයයි තියෙනකම් විඤ්ඤාණය තියෙනව. ගින්න තියෙනව. නාමයයි රූපයයි ගැටගැහෙන එක නැවතිච්ච ගමන් විඤ්ඤාණය හැදෙන එක නවතිනව. සිත නවතිනව. එතකම් මේ ගින්න පත්තු වෙනව. ඔබට කොහොම ගැලපුවත් නිවන් මග නිවන් දකිනව කියන එක

ඔබගේ ලෝභ ද්වේශ මෝහ ගින්න නිවීමක් තියෙන්නෙ. හැබැයි මේ ලෝභ ද්වේශ මෝහ තියෙනව ඔබ බාහිර සත්‍ය කරගෙන ඉන්නතාක්. **විනෙය්‍ය ලෝකේ අභිඣ්ඣා දෝමනස්සංනං** තියන තැනට එනව නම් **විනෙය්‍යලෝකේ අභිඣ්ඣා දෝමනස්සානං කායේ කායානු-පස්සී විහරති** කියන තැනට එනව නම් මේ සියලු දුකින් මිදෙනව. ලෝකය ඇත්තක් නොවන බව දකින තාක් කිසි කෙනෙකුට දුකින් මිදීමක් නෑ. යමෙක් ධර්ම දේශනා කරනව නම් බුදුන් වහන්සේ දේශනා කරන ධර්මය කියනව නම් ලෝකය ඇත්ත කරගෙන බණ කියන්න යන්න හොඳ නෑ. ඒක මධ්‍යම ප්‍රතිපදාවෙන් දේශනා කරන ධර්ම දේශනාවක් වෙන්නෙත් නෑ. ලෝකය සත්‍ය කරගෙන කියන බණක් බුදු බණක් නොවේ. භව නිරෝධෝ නිබ්බානං භව කියන්නෙ බාහිර දෙයක් තියෙනව කියල ගත්තකම. බාහිර දෙයක් තියෙනව කියල ගත්ත කමම තමයි බවය කියන්නෙ. බාහිර දෙයක් නැති නම් භව නිරෝධෝ ඒ කියන්නෙ ඔබ මේව වෙනින් වෙනින් තැන් වලට ධර්මයේ විවිධාකාර විදියට බුදුන් වහන්සේ ඒ ඒ අයට පැහැදිලි කරන්න ගත්ත උපමා වැරදි විදියට ගලපන්න යන්න එපා. ඒව වැරදි විදියට ගැලපුවොත් මේ ධර්මයෙන් කවදාවත් කාටවත් මිදෙන්න හම්බ වෙන්නෙ නෑ, සත්‍ය දකින්න හම්බවෙන්නෙ නෑ, සත්‍ය නියම විදියට ම දකින්න ඕන. නියම විදියට සත්‍ය හොඳින් දකින කෙනෙකුට විතරයි. එහෙම නැතිනම් ඒක ලේසියෙන් දකින්න හම්බවෙන්නෙ නෑ. මෙතන ආත්ම කතාවක් නෑ. පුද්ගල කතාවක් නෑ, මෙතන කෙනෙක් නෑ. මෙතන සිත කියල දෙයක් නෑ. ඇත්තම කතාව කිව්වොත් සියල්ලම පරම සත්‍ය අවබෝධ කරගත්තොත් සත්‍ය අවබෝධ කලොත් සියල්ලම ශුන්‍යයි. කිසිම දෙයක් හම්බ වෙන්නෙ නෑ. හැබැයි ඒ සත්‍ය අවබෝධ කරන එක ලේසි නෑ. මේ සියල්ලම ශුන්‍යයි. කියන්නෙ. ඔබට දැන් ඔබ දැන් සාමාන්‍යයෙන් ජීවත් වෙනව නේ. මේක අවබෝධ ඥාණයක්. සංඛිත්තේන නිබ්බිදාය

අවබෝධයෙන් නිවන් දකින්නෙ මේ එකක්වත් නැති වෙලා නෙවෙයි නේ. තව විදියකින් කියනව නම් දැන් ඔන්න පටලව ගන්න එපා. ඒ කියන්නෙ ඔබ ඉන්න විදියට දැන් ඉන්නව නේ. දැන් ඔබ කොතනක හරි මොනව හරි ඔබ දැන් කොතනක හරි කය තියෙනව නේ. කය නඩත්තු කරන්න එපැයි. එතකොට සිතනේ මේ නිවන් දකින්නෙ. එතකොට මේ සිතින් මිදීමක් නේ නිවන් දකිනව කියන්නෙ. සිතේ ලෝභ ද්වේශ මෝහ ගින්නෙන්නේ මිදෙන්නෙ. සිතේ දුකින්මිදීමක් නේ තියෙන්නෙ. නැවත දුකට වැටෙන්නෙ නැහැනේ. එයාට මරණයක් හම්බ වෙන්නෙ නැහැ නේ. සදා අමරණීයයි නේ. එතකොට එතනට යන්න නේ අපි මේ පෙන්වන්නෙ. මොකද ඒකනේ සත්‍යය. එතකොට ඒක දකින එක ලේසි නැහැ නේ. එතකොට මෙතන ඔබ මේ සියල්ලෙන් මිදෙන්නෙ මේ සත්‍ය දැක්කොත් පමණය නේ. සත්‍ය දකින තාක් කිසි කෙනෙකුට මිදීමක් නැහැ නේ. ඒ සිතෙන් මිදීමක් නෑ. සත්‍ය දකින්න ම ඕන නේ. මායාව දකින්නම ඕන නේ. නොදන්නතාක් අවිද්‍යාව තුළ අන්ධකාරයේ අනාගත අන්ධයෙක් වගේ ඔබට මේ ලෝකයෙන් මිදෙන්නට බැහැ නේ. සත්‍ය දකිනකම්. ඔබ දුකේම වැටෙන්නෙ. එහෙනම් මේ සත්‍ය අවබෝධ කරන්නම ඕන නේ. ඒ තාක් දුකින් මිදීමක් නෑ නේ. එහෙනම් ඔබ ධර්මය හරි තැනකින් ගලපන්න. ඔබ දකින්න මේ සත්‍ය ධර්මය. භවය කියන්නෙ මොකක්ද. භවය කියන්නෙ දෙයක් තියෙනව කියන එකමයි භවය, භවයක් බාහිර තියෙනවද නෑ ඒක සිතකයි ඔබ හිතන දේ තියෙන්නෙ. දැන් ඕක හොඳින් ගලපන්න. හැම පැත්තෙන්ම ගලපන්න. ඒ කියන්නෙ ඔබ අරමුණක් එතකොට ඒ එක සෑම අරමුණක් ම හොඳින් බලන්න. හොඳින් දකින්න. ඒ විපස්සනා භාවනා පැත්තට එන්න. විපස්සනාවෙදි ඔබ කණික සමාධියක් ලබනව කිව්වෙ ඒ නිමිති ඇත්ත කර ගන්න සමාධියක් නෙවෙයි. සමථ සමාධියේ නිමිත්තට හිත තියාගෙන එතන හිත විසිරෙන්නෙ නැතිව තියාගන්නෙ ඒ

සිත සියුම් කරල දකින්නයි. ඒක අවශ්‍යයි. විපස්පනාවට විදර්ශනා නුවණට විදසුන් නුවණට හිත විසිරෙන කොට වෙන්නෙ නැති නිසා සමථයක් අවශ්‍යයි. සමථ විපස්සනා යුගන්දන් ගමනක් තමයි නිවන් මග හමුවන්නෙ. එතකොට ඔබ මේ සිත ගැන කරන විග්‍රහය අතිශයින් ගැඹුරුයි. ගාම්භිර විග්‍රහයක්. මේ සිත හැදෙන හැටි තමයි පටිච්ච සමුප්පාද විග්‍රහයෙ තියෙන්නෙ. එතකොට අවිද්‍යාව නොදන්නාකම නිසාමයි සංඛාරා සිතුවිලි හටගන්නෙ. එතකොට සිතිවිලි කියන්නෙ දෙයක් නෙමෙයි. ධර්මය පැත්තෙන් බැලුවොත් ඒ සංඛාරා නිසා මේ ඔබට පෙනෙන බාහිර රූපයෙන් ඔබ සිතන දේ කියල ඔබ සිතට රැවටෙනව. නාමයට රැවටෙනව. බාහිර රූපෙට රැවටෙනව. ඇත්ත කියල. දැන් පුංචි දරුව නෙමෙයිනේ ඔබ නේ අහන්නෙ. අපි එතනට එමුකො. ඔබ රැවටෙනව නේ බාහිරින්. ඇත්තයි කියල රැවටුනොත් ඔබට බාහිර දෙයක් තිබ්බොත් ඒකට ඔබ ඇලෙනව නේ. එක්කො ගැටෙනව නේ. අපි එතනට එමු. එහෙම වුණොත් පර්යාය පේනව. ඔබට අවිද්‍යා පච්චයා සංකාරා. ඒ කියන්නෙ සිතුවිලි මේ සත්‍ය නොදන්න නිසා බාහිර දෙයක් තියෙනව කියල ගත්ත නිසයි සිතක් ඉපදෙන්නෙ. සංකාර පච්චයා නාමරූප කිව්වෙ සංකාර හැදෙන්නෙ සිතුවිලි හැදෙන්නෙ නාමයයි. රූපයයි එකතු වීම නිසයි. ඔබ කියනව නම් මේ මොහොතෙ ඔබට එන අරමුණු හොඳට බලන්න ඇත්තක්ද කියල දැන් අරමුණු එන්නෙ මේ කියන උදාහරණයක් ගමුකො පොත කියල. දැන් මේ මොහොතෙ ඔබ ආලෝකයට හැඩතලයට ඇසට එන අරමුණ ඔබ කියනව නම් පොත කියල පොතක් පේනව කියල කියනව නම් ඒ නම් සිත පොත දකින සිත කියල ගමුකො. පොත දකින සිත ඇත්තක් ද? පොත කියල දෙයක් බාහිර නැහැ නේ. සතර මහා භූත නේ. බාහිර තියෙන මැටි එකම මැටි නේ. ඒ මැටි එක හැඩයකට කෝප්පෙ. තව හැඩයකට ජොග්ගුව. තව හැඩයකට ඇතිලිය තව හැඩයකට මුට්ටිය තව හැඩයකට මල්වාස් එක. නමුත්

මේව අපි හදාගත්ත නම් නේ බාහිර ඔක්කොම මැටි නේ. ඒ වුණාට අපිට මැටි පේන්නෙ නැහැනේ. අපි දකින්නෙ අපේ හිතේ තියෙන හැඩතල නේ. කෝප්පයක් පීරිසියක් මුට්ටියක් මල්වාස් එකක් අපි ජීවත් වෙන්නෙ ඔන්න ඔය සිතුවිලිත් එක්ක. ඒව බාහිර නෑ. ඒව අපි හදාගත්ත සම්මුති සම්මුති ප්‍රඥප්ති කියන්නෙ කොහෙවත් තියෙන දෙයක් නොවේ. මිනිස්සු භාවිතයට හැමෝම පොදු එක භාෂිතයට ගන්න නාමයක්. ඒක බාහිර තියෙන එකක් නොවේ.

**බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.**

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය
ගිණුම් අංක : 106161005988
බැංකුව : සම්පත් බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

**බුද්ධෝත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වීමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.**

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය
ගිණුම් අංක : 100800597511
බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

**කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත.**

**ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.**

**මෙත්මල් අරණ සමාජ සේවා පදනම**
ගිණුම් අංක : 100800598542
බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

**බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සදහන් වේ.**

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend,volume - 1
11. The true dhamma has awakend,volume - 2
12. The true dhamma has awakend,volume - 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි